YUGATHARA

# යුගතර

## ශාස්ත්‍රීය සංග්‍රහය

(සිව්වන වෙළුම)

**උරුම අධ්‍යයන කේන්ද්‍රය**

කැලණිය විශ්වවිද්‍යාලය

# යුගතර

## ශාස්ත්‍රීය සඟරාව

### සිව්වන වෙළුම

2022

උරුම අධ්‍යයන කේන්ද්‍රය

කැලණිය විශ්වවිද්‍යාලය

**යුගතර ශාස්ත්‍රීය සඟරාව**

ප්‍රකාශන අයිතිය © 2022

උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

යුගතර ශාස්ත්‍රීය සඟරාව - සිව්වන වෙළුම 2022

**ISSN 2827-7430** (විද්‍යුත්)

**ISSN 2682-7123** (මුද්‍රිත)

**කංචුක නිර්මාණය :** රුමල් වින්දුල බණ්ඩාර

**පරිගණක පිටු සැකසුම :** සිතුමි දිල්ෂා බොතේජු

**ප්‍රකාශනය :** උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

යුගතර ශාස්ත්‍රීය සඟරාව තුළ පළකෙරෙන සියලුම ශාස්ත්‍රීය ලිපිවල වගකීම කර්තෘවරුන් සතුවන අතර යුගතර ශාස්ත්‍රීය සඟරාවෙහි සංස්කාරකවරුන් විසින් එම ලිපි තුළ අන්තර්ගත කරුණු සහ දෝෂ පිළිබඳව කිසිදු වගකීමක් නොදරයි.

**යුගතර ශාස්ත්‍රීය සඟරාව**

# YUGATHARA

**උරුම අධ්‍යයන කේන්ද්‍රය**

**කැලණිය විශ්වවිද්‍යාලය**

**ශ්‍රී ලංකාව**

---

*සිව්වන වෙළුම* *2022*

---

කැලණිය විශ්වවිද්‍යාලයෙහි උරුම අධ්‍යයන කේන්ද්‍රය මඟින් ප්‍රකාශයට පත්කරනු ලබන වාර්ෂික ශාස්ත්‍රීය සඟරාව ලෙස යුගතර ශාස්ත්‍රීය සංග්‍රහය ගෙන දැක්විය හැක. ද්විභාෂා සඟරාවක් වන මෙය උරුමය හා සම්බන්ධ වූ ඕනෑම විෂය ධාරාවක් යටතේ පර්යේෂකයින්, විද්‍යාර්ථීන් සහ නොයෙක් විද්වතුන් විසින් ඉදිරිපත් කරනු ලබන ශාස්ත්‍රීය ලිපි වෙත විවෘත වූවකි. යුගතර ශාස්ත්‍රීය සංග්‍රහය වෙත ඉදිරිපත් කරනු ලබන ශාස්ත්‍රීය ලිපි එකී විෂය පථයන්හි ප්‍රවීණයින් ලවා විමර්ශනයට ලක්කරනු ලබන අතර ඉහළ ශාස්ත්‍රීය අගයකින් යුතු ඵලදායී ලිපි පෙළක් යුගතර ශාස්ත්‍රීය සංග්‍රහය හරහා ඉදිරිපත් කිරීමට සැමවිටම කටයුතු කරනු ඇත.

**ආචාර්ය මංගල කටුගම්පොළ**

ප්‍රධාන සංස්කාරක - යුගතර ශාස්ත්‍රීය සංග්‍රහය,

අධ්‍යක්ෂක,

උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

**අනුශාසකවරු**

**මහාචාර්ය නිලන්ති ද සිල්වා**

උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය

**උපදේශකවරු**

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්. ඒ. කේ. පී. ජේ. සෙනෙවිරත්න**
පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය එම්. එම්. ගුණතිලක**
පීඨාධිපති, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**ආචාර්ය සුදත් සෙනරත්**

පීඨාධිපති, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**උපදේශක සංස්කාරකවරු**

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරි**
අධ්‍යක්ෂක, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මාලිංග අමරසිංහ**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**ප්‍රධාන සංස්කාරක**

**ආචාර්ය මංගල කටුගම්පොළ**

අධ්‍යක්ෂක, උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

**සංස්කාරකවරු**

**සිතුමි දිල්ෂා බොතේජු**

පර්යේෂණ සහකාර, උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

**ඩී. එස්. අනුශාන් මුණසිංහ**

සහකාර කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## පටුන


1. සීගිරි කුරුටු ගීවලින් නිරූපිත සන්නිවේදනය................................. 01
2. ස්වභාවික උරුමයක් වන කන්නෙලිය වැසි වනාන්තරය හා බැඳුණු ග්‍රාමීය ජීවනෝපාය.......................................................................14
3. කොටියාගල, වත්තේගම පුරාණ රජමහා විහාරයේ අස්පර්ශිත සිතුවම් කලාව පිළිබඳ අධ්‍යයනයක්………………………………………….. 29
4. ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය තුළ ප්‍රදර්ශිත කෞතුක වස්තු සම්බන්ධයෙන් අනුගමනය කර ඇති 'ඉදිරිපත් කිරීම හා අර්ථකතන' ක්‍රියාමාර්ග පිළිබඳ ස්වාධීන අධ්‍යයනයක් ………………………….. 39
5. කාලය හා අවකාශය තුළ මහනුවර නගරයේ ආරම්භය හා එහි විකාශනය පිළිබඳව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්……………... .51
6. ශ්‍රී ලංකාවේ ආදිවාසී ජන අස්පර්ශිත උරුමය පිළිබඳ අධ්‍යයනයක්......64
7. මොරටුව ශුද්ධ වූ එම්මානුවෙල් පල්ලියේ ඔරලෝසු කණුව ආශ්‍රිතව කාර්මික පුරාවිද්‍යා උරුමය විමසීම..................................................74
8. ශ්‍රී ලංකාවේ ස්වභාවික උරුම කළමනාකරණය තුළ වනාන්තර සංරක්ෂණය කිරීමේ වත්මන් නෛතික යාන්ත්‍රණයේ කාර්යභාරය……………………………………...…………...85
9. පාඬිග්ගම වන්නි වැදි ගම්මානය ආශ්‍රිතව පවතින අස්පර්ශිත සංස්කෘතික උරුමයන් සහ ඒවායෙහි වර්තමාන සහ අනාගත පැවැත්ම පිළිබඳ විමර්ශනයක්……………………………………………………95
10. ගාලු මෝදර අවකාශයන්හි ස්ථාපිත ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ආලේඛ්‍ය ස්මාරක මූර්ති පිළිබඳ අධ්‍යයනයක්…………………… 109

# සීගිරි කුරුටු ගීවලින් නිරූපිත සන්නිවේදනය

**පී.බී.ඒ.එන්.ඩබ්ලිව්. බණ්ඩාර**

කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

nilu@kln.ac.lk

***සංක්ෂේපය***

*ලක්දිව රජ කළ කාශ්‍යප රජතුමා විසින් ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස අග භාගයේ සීගිරිය නම් අපූර්ව නිර්මාණය කළ බව වංසකථා සනාථ කරයි. සීගිරියේ කැටපත් පවුරේ පද බැඳුණු ගීත කාව්‍ය අපේ අතීත උරුමයේ විශිෂ්ටත්වය මනාව පෙන්වා දෙයි. එමෙන්ම සීගිරිය තරම් ඉපැරණි ගී සම්භාරයක් ඇතුළත් කැටපත් පවුරක් ලෝකයේ වෙනත් කිසිම රටකින් තවමත් සොයාගෙන නොමැත. සීගිරිය නැරඹීමට දසතින් ජනී ජනයා පැමිණ තිබේ. සීගිරි සිතුවම්, සිංහ කෙවෙනිය සහ රජ මාළිගය ආදිය දුටු සීගිරි නැරඹුවෝ ස්වකීය හද සන්තානයට නැගුණ දේ පද්‍යයට නගා ඒ අසල වූ කැටපත් පවුරේ ලියූහ. සීගිරි කැටපත් පවුරේ ඇති කුරුටු ගී සිංහල ගීත සාහිත්‍යයෙන් ශේෂ වූ පැරණිතම සාධක ලෙස ද සැලකේ. මෙම අධ්‍යයනයේ ගැටළුව වූයේ සීගිරි ගීතවලින් නිරූපණය වන්නේ කුමක් ද යන්න අධ්‍යයනය කිරීමයි. සීගිරිකාමීන් කැටපත් පවුරේ කුරුටු ගෑ ගී තුළින් එකල සමාජය මනාව නිරූපණය වන්නේදැයි සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මේ සඳහා ප්‍රකාශයට පත් වී ඇති මහාචාර්ය පරණවිතානගේ සීගිරි කුරුටු ගී ප්‍රමුඛ කරගත් ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් අවශ්‍ය දත්ත ලබාගෙන තිබේ. සීගිරි ගී තුළින් එකල සමාජය කැඩපතක් සේ විනිවිද පෙන්වන බව අවසන පැහැදිලි වෙයි.*

***මුඛ්‍ය පද:-*** *සීගිරි ගී, සන්නිවේදනය, සමාජය, කැටපත් පවුර, සීගිරි සිතුවම්*

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයට අයත් සීගිරිය ඉතා විශාල පර්වතයක් පදනම් කොටගෙන නිර්මාණය කරන ලද විශිෂ්ට ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ ස්ථානයකි. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස බවුන් වඩන භික්ෂූන් වහන්සේලාට සෙනසුනක් වූ ද, ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස කාශ්‍යප රජුට ආරක්ෂිත බලකොටුවක් ලෙසින් ද, අග නගරයක් ලෙසින් ද විරාජමාන විය. කාශ්‍යප රජතුමාගේ මරණයෙන් පසු අග නගරය යළිත් අනුරාධපුරයට ගෙන ගියෙන් සීගිරිය අරාජික වූ බව මහාවංසය ඇතුළු වංශකථා හෙළි කරයි. පසුකාලීනව සීගිරිය නැරඹූ දහස් දෙනා තම සිතට නැගුණ අව්‍යාජත්වය පද්‍යයට නැඟීමට සමත් වුණි. එම පද්‍යය සීගිරි කැටපත් පවුරේ සටහන් කළේය. මේ අන්දමින් සීගිරිගාමීන් කැටපත් පවුරේ කුරුටු ගෑ ගී තුළින් එකල සමාජය කැඩපතක් සේ විනිවිද පෙන්වන බව පසක් වේ.

## ක්‍රමවේදය

අතීත උරුමය හැදෑරිය හැකි ප්‍රධාන මූලාශ්‍රයන් වන්නේ ලිඛිත මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වේ. ඒ අතරින් පර්යේෂණයක දී ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම අධ්‍යයනය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පර්යේෂණ කොට ප්‍රකාශයට පත්කළ සීගිරි කුරුටු ගී නම් ග්‍රන්ථය ප්‍රමුඛ කරගත් ශාස්ත්‍රීය ග්‍රන්ථ අධ්‍යයනය කෙරේ.

## කාලය

සීගිරි කැටපත් පවුරේ ඇති කුරුටු ලිපි විශාල ප්‍රමාණය (ලිපි 708) අතරින් බහුතරය ක්‍රිස්තු වර්ෂ අටවන සියවසත්, ක්‍රිස්තු වර්ෂ දහවන සියවසටත් අයත් ය (පරණවිතාන 2000). ඇතැම් කුරුටු ගීවල දක්නට ලැබෙන අක්ෂර ක්‍රිස්තු වර්ෂ දෙක හෝ ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවස්වල භාවිත වූ අක්ෂර රූප සමඟ බොහෝ සෙයින් සාම්‍ය වෙයි (පරණවිතාන 2000). ඒ අනුව සමස්තයක් වශයෙන් ගත් කළ සීගිරි ගී ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස හා ක්‍රිස්තු වර්ෂ දහවන සියවස අතර කාලයට අයත් යැයි කීම නිරවද්‍ය වේ. එමෙන් ම සියගණන් විවිධ අත්වලින් විවිධ අවස්ථාවල දී ලියන ලද හෙයින් මේ ලිපිවල දක්නට ලැබෙන එක ම අක්ෂරයෙහි පවා සුළු සුළු වෙනස්කම් පවතී.

**සීගිරි කුරුටු ගී හඳුනාගැනීම හා එහි ස්වභාවය**

ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සීගිරි කුරුටු ගී පිළිබඳ අධ්‍යයනය කළ විශිෂ්ට පුරාවිද්‍යාඥයන් දෙදෙනෙකි. එනම්, බ්‍රිතාන්‍ය ජාතිකයෙකු වූ හිටපු පුරාවිද්‍යා කොමසාරිස් එච්.සී.පී. බෙල් ඉන් එක් අයෙකි. ඔහු 1905 දී සීගිරි පවුරෙහි වූ කුරුටු ගී පළමු වරට දක්නා ලදී. මෙම ලිපි අධ්‍යයනය කොට මෙම ලිපි කෙටි වුව ද, ගැඹුරු අරුත් රහිත වුව ද මේවා තුළින් සන්නිවේදනය වන දෑ ඉමහත් බවත්, පුරාණ සීගිරිගාමීහු මේ ස්ථානය පිළිබඳ තම ධාරණාවන් සීගිරි පවුරෙහි කුරුටු ගෑ බවත් ඔහු කියා සිටියි (Bell 1897). අනෙක් විශිෂ්ටයා වන්නේ ශ්‍රී ලාංකීය පුරාවිද්‍යාවේ පියා යනුවෙන් හඳුන්වන මහාචාර්ය සෙනරත් පරණවිතාන ය. 1928 දී පරණවිතානයන් මුලින් ම මෙම ලිපි පරීක්ෂා කළේය. බොහෝවිට මෙම ලිපිවල සිංහල භාෂාවේ ඓතිහාසික විකාශනය හැදෑරීමෙහිලා මහත් වැදගත්කමක් පවතින බවත්, කුරුටු ගී බහුතරය පද්‍ය බවත් ඒවායින් බොහෝ පද්‍ය උසස් සාහිත්‍යමය අගයකින් යුතු රචනා බවත්, ඒවා අතර ඇතැම් රචනා සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ විශිෂ්ට නිර්මාණවලට සමාන බවත් එතුමා කියා සිටියි (පරණවිතාන 2000: 12).

සීගිරි කුරුටු ගීවලින් බහුතරය කියවා ගැනීමට අපහසුය. ඊට හේතුව වුයේ ලේඛකයින් සාමාන්‍යයෙන් වාර්තා තැබීමට උල් කටුවක් භාවිත කිරීමෙන් අත් අකුරුවල ප්‍රමාණයෙන් ම ලිවීමට උත්සාහ ගැනීමත්, අව් වැසි හා සුළං ආදී ස්වභාවික හේතුන්ට දිගු කාලයක් ලක් වීම හා ඉතා පැරණි වීම නිසා අක්ෂර මැකී ගොස් තිබීමත් ය.

කැටපත් පවුරේ වූ කුරුටු ගෑ අක්ෂරවල ප්‍රමාණය සාමාන්‍ය පුස්කොළ අත්ලිපිවල එන අකුරුවල ප්‍රමාණයට වඩා කුඩා ය. කැටපත් පවුරේ එතරම් කුඩාවට අක්ෂර ලිවීමට හැකි වූයේ උල් කටුවේ තුඩ තියුණු වීමත්, හුණු බදාමේ අති විශේෂ ඇලෙන ගතියත් නිසා ය. පවුරු මුහුණතේ සෑම තැනක ම එක ම ආකාරයෙන් හුණු බදාම නොවීම නිසා සමහර තැනක තියුණු නොවන තුඩින් ද ගීත ලියා තිබේ (පරණවිතාන 2000).

මෙම ගීත විවිධ පුද්ගලයින් විසින් නොයෙක් අවස්ථාවල දී ලේඛනගත කොට ඇත. එහිදී ලේඛනගත කිරීම සඳහා නිශ්චිත ක්‍රමයක් අනුගමනය කොට නොමැත. බොහෝවිට එක් ලිපියක් වෙනත් ලිපියක් මත ලියා ඇත. ඇතැම් විට ගීත දෙකක් අතර ඉඩ එකම ලේඛනයේ කොටස් දෙක අතර ඉඩට වඩා අඩුය. අවසන් නො කළ ලේඛන කාණ්ඩ ද හොඳින් ආරක්ෂා වී ඇති ලේඛන මත ලියා ඇත. එක් ලේඛනයකට

අයත් අක්ෂර පෙළක් එය ලියන්නට පෙර එහි තිබුණු වෙනත් අක්ෂර පෙළක ගැටෙන අතර ඒ ලේඛනයේ ඉතිරි කොටස දෙවන පේළියේ දක්වා තිබේ.

සැමවිට ම ලිපි කෙටීමේ දී අක්ෂරවල හැඩය නොවෙනස්ව කෙටීම කෙරෙහි අවධානය හා සැලකිල්ල යොමු කොට ඇත. එනමුත් මේ ලිපි විවිධ පුද්ගලයින් විසින් ලේඛනගත කිරීම නිසා අක්ෂරවල සමරූපීභාවයක් දක්නට නොලැබේ. ඇතැම් කුරුටු ලිපි ඉතා උනන්දුවෙන් හා අලංකාරව කොටා ඇත. එහෙත් බොහෝමයක් අපිරිසිදුය. අලංකාරව ලේඛනගත කොට නැත. තනි අක්ෂර විරූපීය. බදාමයේ අක්ෂර සටහන් කිරීම හා ලිවීමේ දී අත ගැස්සීම නිසා අක්ෂර රිසි අකාරයට සටහන් කිරීමට නොහැකි වී ඇත. පුද්ගලයන්ගේ විශේෂ ගති ලක්ෂණ ද අක්ෂර වෙනස්වීම සඳහා හේතු වී තිබේ.

කැටපත් පවුරේ වූ ගීවල අක්ෂර දෝෂ අඩුය. බොහෝවිට ලේඛකයෝ අක්ෂර මඟහැරුණු විට දී අක්ෂර පේළියට යටින් ලියා වරද නිවැරදි කොට ඇත. කුරුටු ගී ලියූ ලේඛකයින් එකම තේමාවක් මත කවි පද ගෙතුව ද ඔවුන් ඊට පෙර බොහෝදෙනා කියූ දෙය ම කීව ද සැම ලේඛකයෙකු ම තම රචනාවෙහි ලා කිසියම් පෞද්ගලිකත්වයක්, අන්‍යයන්ගෙන් වෙනස් වූ යමක් දැක්වීමට උත්සාහ කොට ඇත (Paranavitana 1956:268).

සීගිරි ගී දෙස විමසීමේ දී ලේඛකයින් කවි පද ගෙතීමේ දී විවිධ උපක්‍රම අනුගමනය කොට තිබේ. එනම්, තම හද මඩලේ ජනිත වූ වස්තු විෂය කැපී පෙනෙන අයුරින් කවි පද ගෙතීම, එකම සංකල්පනාව ප්‍රකාශ කිරීම වස් උචිත වචන හා වාක්‍ය තෝරා ගැනීම එනම්, කව්‍යක්කාරයින් දෙදෙනෙකු ආකාර දෙකකට සීගිරියේ අද්විතීයත්වය රසික සිත්හි කාවද්දා ඇත.

තවද, ඇතැම් අවස්ථාවල ගීත ප්‍රෙහේලිකා ස්වරූපයෙන් ඉදිරිපත් කොට ඇත. ඒ රසික සිත් ඇද ගැනීමේ තවත් උපක්‍රමයක් ලෙසිනි. මෙම ප්‍රෙහේලිකා සීගිරිගාමී දෙදෙනෙකු අතර සිදුවන මිත්‍රශීලී විහිලුවකට හෝ විකට කියමන්වල හෝ ස්වරූපය ගෙන ඇත. "...ඔබ විහිළුවෙන් කීවක් සත්‍ය කියයි... සත්‍යය දකිමි (Paranavitana 1956:396). මේ මාගේ වරද විය..."(Paranavitana 1956:204) යනාදී ඊට නිදර්ශන සපයයි.

## සීගිරි ගී තුළ දක්නට ලැබෙන සන්නිවේදනය

සරල සමාජක සිට අද්‍යතන සමාජය දක්වා මිනිසා විසූ සමාජය ගොඩනැගීමේ දී අදහස් හුවමාරුව හෙවත් සන්නිවේදනය විශාල බලපෑමක් වී තිබේ (ධර්මදාස 1999: 12). කිසිවෙකු විසින් කිසියම් අදහසක් අන්‍යයන්ට දැනුම් දීම ලෙස සැලකෙන සන්නිවේදනය සඳහා ඈත අතීතයේ සිට මනුෂ්‍යයන් විවිධාකාර ක්‍රම උපයෝගී කරගෙන ඇති අයුරු ශ්‍රී ලාංකීය සීගිරි ගී තුළින් ද පැහැදිලි වෙයි. කවර සමාජයක වුව ද කිසියම් "ප්‍රකාශන මාධ්‍යයක්" අඛණ්ඩව ප්‍රසාරණය වෙමින් පවතියි. සීගිරි ගී පද බැන්දවුන් මෙන් ම ගී ලියැවූ අය ද වෙති. රජුගේ සිට සාමාන්‍ය ජනයා දක්වා රාජාණ්ඩුවේ සහ සමාජයේ විවිධ කොටස් සීගිරියට විත් කාව්‍ය ලියූහ. සමහරු අනුන් ලවා ගී බන්දවා ගත්හ. තවත් සමහරු අනුන්ගේ කාව්‍ය තමන්ගේ නමින් ලියා තැබූහ. එකල සීගිරි කාව්‍ය ඇතැම් සමාජ ප්‍රභූන්ගේ පුරමාරම් පුහුමානය ආදිය ලියා දක්වූ තෝතැන්නක් මෙන් ම වාද විවාද මණ්ඩපයක් ද විය (විතාන 1992: 29). මේ ගී තුළ තත්කාලීන, ඓතිහාසික, සාමාජයීය හා දේශපාලනික තොරතුරු නිරූපණය වේ. ඒ අනුව තත්කාලීන සමාජයෙහි කැඩපතක් සේ මෙම කැටපත් පවුරේ කුරුටු ගෑ ගී සැලකිය හැකිය.

සීගිරි ගී සමස්තයක් ලෙස ගත් කළ සීගිරි බිතු සිතුවම්වල වූ සීගිරි අප්සරාවන් වර්ණනා කිරීම මත පදනම් වී කවි රස පබැඳුනා යැයි කීම සාවද්‍ය නොවේ. මීට අමතරව සීගිරි පර්වතය, සීගිරියෙහි විරාජමානව වැඩ සිටි සිංහ රුව, සීගිරි පව්ව නැගීමෙහි වූ කටුක බව, ජල උද්‍යානය, හා සීගිරි පව්වෙහි වූ මාළිගාව යනාදී විවිධ තේමා පදනම් කොටගෙන කවි පද ගෙතී ඇත ( Paranavitana 1956).

## සීගිරි අප්සරාවන්

තත්කාලීන ස්ත්‍රීන්ගේ ස්වරූපය පිළිබඳව හා ඇඳුම් පැළඳුම් මෙන්ම ආභරණ පිළිබඳව අධ්‍යයනය කළ හැකි විශිෂ්ට ස්ථානය ලෙස සීගිරිය හැඳින්විය හැකිය. දස දහස් ගණන් ජනයා සීගිරිය නැරඹීමට පැමිණීමේ දී ඔවුන්ගේ සිත්හි පහළ වූ චින්තනය කැටපත් පවුරේ නිර්ලෝභීව සනිටුහන් කළ බව පෙනේ. ඒ අතර බිතු සිතුවම් තුළින් ස්ත්‍රිය විවිධ පුද්ගලයින් විසින් විවිධ ස්වරූපයෙන් දැකගත් ආකාරය පෙනේ. ඉන් පැහැදිලි වන්නේ එකල සිටි ජනයා තම හද පත්ලේ ගොඩනැගුණ ස්ත්‍රිය පිළිබඳ හැඟීම් කිසිඳු බියක් සැකයකින් තොරව දැක්වීමට සමත් වී ඇති බවයි.

**ස්ත්‍රී රූප ස්වභාවය**

සීගිරි පද්‍ය බොහෝමයක අප්සරාවන්ගේ රූ සපුවේ සුවිශේෂ අංග වර්ණනා කොට ඇත. මුදු පෙම්බර නෙත්, මල් ගැවසු සොඳුරු නිල් වරලස, මුතුවන් දත්, හංසයන් බඳු පියයුරු, සිහිනිඟ, මනෝහාරී දෑත් යන මේවා ඒ ඒ පුද්ගලයන්ගේ රුචිකත්වය අනුව වර්ණනා සඳහා තෝරාගෙන ඇත.

ස්ත්‍රීන්ගේ රූප ස්වභාවය කිසිවෙකුට නොදෙවෙනි යැයි ඇතමෙකු දක්වයි. එමෙන්ම සීගිරි රාජ භවනෙහි වෙසෙන මෙම ලඳුන්ගේ වසඟයට පත් වූ බොහෝ දෙනෙක් විය. එසේ වර්ණනා කිරීමේ දී ස්වභාවික පරිසරයේ දේ උපමා කොටගෙන තිබේ. "තොප නුවන් මහනෙල් මල් යුග්මයකට සම කළ තැනැත්තෝ සැබවින් ම චින්තකයෝ ය" (Paranavitana 1956: 191).

සීගිරි සිතුවම් ඇතමෙකුගේ කාමය උද්දීපනය හා සරාගී හැඟීම් ජනිත කරවීමට හේතු වී තිබේ. එනම්, "දෙවියනි මෙවැනි කතුන් හා සැපතක් ඇති කරන්න. දෙඅත් වටා පළ වූ මගේ රූපයේ ආස්වාදය විඳින්න. දෙතොල් හැර දමා පැමිණි අහංකාර ස්ත්‍රිය කුරිරු වන්නීය....."(Paranavitana 1956: 320). මෙවැනි වූ කාමෝස්වාදය විඳි රසිකයෝ ද එකල සමාජයේ වූ බව පෙනේ. ඔවුන් නිර්ලෝභීව තම අදහස් ප්‍රදර්ශනය කොට ඇත. සිතෙහි නැගුණ කාමුක සිතුවිල්ල සඟවා තබාගැනීමට උත්සාහ දරා නොමැත.

"බෙයඳ නැග රන්වනුන් අතර සිටි හිණෙහි වස්ත්‍රය ලිහිල් වූ කතක දෙස බැලීමු. ඇය අප අඹුව ද යි" (Paranavitana 1956 :37) යනුවෙන් රසිකයෙකුගේ සිතෙහි නැගුණ රාගික හැඟීමක් ප්‍රකාශ කොට ඇත. මෙවැනි මොහොතක පවා මතකයට නැගුනේ තම අඹුව යි. සැබවින් ම සීගිරි කතට, සිය අඹුව සම කිරීමට ඔහු උත්සාහගෙන ඇත. තම අඹුව ඒ සා සුන්දර ලඳක් යැයි ඔහු සිතුවාට සැක නැත. මෙවැනි රාගික හැඟීම් ප්‍රකාශ කිරීමට පවා යොදාගත් බස සරල ය. සුගමය. කවිපද ගෙතු තැනැත්තා කෙරෙහි පිළිකුල් සහගත හැඟීමක් තවකෙකුගේ සිතෙහි ජනිත නොවේ. සංගමයෙන් ස්ව ආශාව ප්‍රකාශ කිරීමට එකල ජනයා සමත් වී තිබේ.

සීගිරි අප්සරාවන්ගේ ස්ත්‍රී රූප ස්වභාවය කොතරම් ද යත් අප්සරාවන් දුටු කල්හි නිකෙලෙස් තවන පැවිද්දන් තම හැඟීම් පාලනය කොට ගත් අපහසුතාවය දක්වයි. සැබවින් ම ස්ත්‍රි රුව කෙලෙස් තවන පැවිද්දන්ගේ සීලය බිඳීමට සමත් බව අතීත කථා පුවත් හරහා බොහෝ සේ අසා තිබේ. සීගිරි පව්ව නැඟීමට එකල පැමිණි පැවිද්දන් පවා තම සිතුවිලි කැටපත් පව්රෙහි සටහන් කළේ මෙසේය. ‘‘තොප

දැකුමින් කවර අයුරින් වදවෙම් ද" (Paranavitana 1956 :37). "තොප මහනෙල් වන් නුවන් නිසා තොප කරා අදවනු ලැබෙයි......."( Paranavitana 1956 :350).

**ස්ත්‍රිය සතු ගුණාංග**

සීගිරි කව්‍යක්කාරයින් ඇතැම් විටක සීගිරි අප්සරාවිය සුකුමාල සේ දැක්ක ද ඇතැම් අවස්ථාවක ඇය සිත් පිත් නොමැති තැනැත්තියන් සේ දක්වා තිබේ. ස්ත්‍රියගේ බාහිර ස්වරූපය පමණක් නොව අභ්‍යන්තර ගුණාංග පවා ඇතැම් සීගිරිගාමීන් දුටු බව පෙනේ. එනම් සීගිරි ලඳුන් හදවත මොලොක් නොවූ අකාරුණික හදවත් ඇති බව කියයි. හදවත තද කළු ගලකට උපමා කොට ඇත. "තොප කෙරෙහි කැළුම් හා බැලුම් මිස ආදර සිතක් නොමැත්තේය. හා ද්‍රෝහි කතුනි තොප ළය තද ගලක් කළ බව මම නොදනිත් ද....." (Paranavitana 1956 :87) යනුවෙන් කිවිඳියක් සඳහන් කොට තිබේ. තවත් කිවිඳියක් "ඇය ගේ හදවත මොළොක් වුව ඇත්තෙන් ම ඇය කිපියා සේ ය. එය ඇය වගා කළ පුරුදු නිසා නොවේ ද" (Paranavitana 1956 :87). යනුවෙන් දක්වා තිබේ. සැබවින් ම මෙලෙස සීගිරි අප්සරාවන් පිළිබඳ දුටුවේ තවත් ස්ත්‍රියකි. ස්ත්‍රියක් තවත් ස්ත්‍රියක් කෙරෙහි දක්වන ආකල්පය මෙයින් පැහැදිලි වෙයි. එහෙත් එක් කිවියෙක් "මෙහි සිටිවුන් බැලූ සඳ තොප ඉසින ලද මල් මාලා බෙයදෙහි රන්වන් තැනැත්තියන්ගේ සිත ඔවුන් ගත් මල්වලින් හෙළි විය යි මා කිවේ සිරිතක් ලෙස ය" (Paranavitana 1956 :454). යනුවෙන් දක්වයි. පුරුෂ පාර්ශවය ස්ත්‍රිය පිළිබඳ දැක්වූ ආකල්පය ස්ත්‍රී පාර්ශවයට සාපේක්ෂව ඉඳුරා වෙනස් බව මෙවැනි ගීවලින් පෙනේ. මෙම ස්වභාවය සමාජ යථාර්ථයයි. ස්ත්‍රියක් තවත් ස්ත්‍රියක් කෙරෙහි දක්වන්නේ යහපත් ආකල්පයක් නොවේ. සමස්ත සමාජය අතීතයේ පටන් අද්‍යතන මේ යුගයේ ද පොදු ගුණාංගයක් සේ මෙය දැකගත හැකිය.

ස්ත්‍රීය වනාහි ස්වාමි භක්තියෙන් යුක්ත තැනැතියන් සේ ඇතැම් කිවියන් දැක තිබේ. සීගිරි කුරුටු ගී 108ක ම මල් හෝ මල් දම් ගත් ස්ත්‍රීන් පිළිබඳ කියවේ (මනතුංග 2004: 62). යුද්ධයට ගිය කාශ්‍යප රජු පෙරළා එන තෙක් මේ ලඳුන් මල් හා මල් දම් රැගෙන පෙර මඟ බලා සිටින බව බොහෝ ගීවලින් ගම්‍ය වේ. ".....අතෙන් මල් ගත් සෙයින් සිත්තරා තොප සිත්තම් කළේය. පර්වත පාර්ශවය ස්වර්ගය සේ දිස් වුයේ ය" (Paranavitana 1956 :558). "....තිගේ සැමියා තී කරා ආවේ නැති වුව ද මේ අයුරින් සැරසුණේ....ය" ( Paranavitana 1956 :518). මෙවැනි ගීවලින් සිය ස්වාමියා යුද්ධය ජය ගෙන එන තෙක් පෙර මඟ බලා ඉන්නා බව ඉන් ජනිත වේ. "පර්වත බිත්තියේ හදවත බඳින රූමත් කතුන් බැලුවෙමි. ඔවුන් තම හිමියා කොයි ගියේ දැයි

බලමින් සිටියවුන් වැන්න"(Paranavitana 1956 :109). තවත් කිව්යෙකු ගේ අදහස විය. මේ තුළින් ස්ත්‍රිය සතු ස්වාමි භක්තිය මොනවට පසක් වේ. සීගිරි ලඳුන් සතු වූ ස්වාමි භක්තිය කොයි සා ද කිවහොත් කාශ්‍යප රජුවන් වීරයෙකු, ආදර ස්වාමියෙකු මෙතෙක් කලක් නොදුටු බව කියයි. ඒ බව "....ඔහු මළේ වී නමුත් මියනු නොහැකිව අප විසුව ද මනා මිනිසෙකු මෙතෙක් කල් නොදකිමු" ( Paranavitana 1956 :22). යන ගීත මඟින් පසක් වේ. සීගිරි ලඳුන් කථා නොකර සිටින්නේ ස්වාමියා, පෙම්වතා මියගිය ශෝකය නිසා යැයි පරිකල්පනය කරයි. එහිදි ඇතැම් කාන්තාවන් ශෝකය නිසා පර්වතයෙන් පනින්ට සැරසෙන බව ද කියයි. මේ තුළින් ස්වාමි භක්තිය කොයි සා එකල සමාජයේ අගය කළා ද ඊට ගරු කළා ද යන්න පැහැදිලි වේ.

තවද, ස්වාමියා මියගිය පසු ඉන්දීය සමාජයේ මෙන් සති පූජාව පැවැත්වීම ලාංකීය සමාජයේ නොවූ බව ඉන් කියවේ. චපල නොවන මේ සීගිරි ලඳුන් අදට ද තම රජු එන තෙක් බලා සිටියි. මෙවැනි ගීත මඟින් එකල සමාජයේ පැවති ස්වරූපය නිරූපණය වේ. විවාහක ස්ත්‍රියක් තම ස්වාමියා කෙරෙහි වූ භක්තිය හා ගෞරවය, නිරතුරුව ම ඔහුගේ ජයග්‍රහණ බලා තුටු සිතින් කල් ගෙවීම සහ පෙර මඟට ගොස් මහත් හර සරින් ඔහු පිළිගැනීම යනාදී ගුණාංග පිළිබඳ කියවෙයි.

"මාගේ ස්වාමියා බලනු...."(Paranavitana 1956:564) යනුවෙන් ඇතම් ගීවල දැක්වෙයි. මේ මාගේ ස්වාමි පුරුෂයා නොවේ දැයි යන එන පුද්ගලයන් අතරින් ඇතමුන් දුටු විට ස්ත්‍රීන් එකිනෙකා පවසාගන්නා බව සඳහන් කරයි (මනතුංග 2004 :64). මෙවැනි ගී තුළින් සීගිරි ලඳුන් චලප ස්ත්‍රීන් සේ දුටු රසිකයින් ද වූ බව පෙනේ. එකල සමාජයේ මිනිස් සිතුවිලිවල විවිධත්වය හා ස්වරූපය මනාව පෙන්වයි.

සීගිරි ගීවල ඇතැම් කවාක්කාරයින් සීගිරි ලඳුන් එකිනෙකා කථාබයෙහි යෙදෙන ආකාරයට ගීත ගොඩනඟා තිබේ. එනම් "බලන්න රජතුමා පැමිණියේ ය. එතුමා එනකල නොදැක්කෙමි එතුමා පැමිණි ආකාරය කියන්න" (Paranavitana 1956 :586) යනුවෙන් අප්සරාවියක් තවත් අප්සරාවියකට කියයි.

සීගිරි අප්සරාවියන්ට බැන වැදුන හා ලඳුන් කෙරෙහි ද්වේශ සිතුවිල්ලෙන් කවි පබැඳුන ආකාරයක් ද ඇතැම් ගීත මඟින් පෙනේ. ඒ මන්ද යත් සීගිරි ලඳුන් බොහෝ දෙනෙක් මල් හා මල් දම් අතැතිව සිටීම යි. රජු මිය ගොස් ඇති විට පවා සීගිරි ලඳුන් මල් රැගෙන සිටීම රජුට කරන අපහාසයක් ලෙස කවාක්කාරයින් දකින්නට ඇත (මනතුංග 2004 :63). ".....බැලු බැලු අතක ම සෙනෙහස ඇති බවක් නොපෙනෙයි...... හා ඔහු මළ කල්හි පවා තොප අතින් මල් දම් ඉවත නො දැමුවාහුය" (Paranavitana 1965 :326). යනාදී ලෙසින් චෝදනා කරමින් කුරුටු ගැ

ගී තුළින් පෙනේ. එමෙන් ම "තොපි ගලින් කළ තද ළය ඇති බැවින් මිස ඔහු මළේ වුව ද රතු අතින් මල්දම් ගත් බවක් සැබවින් ම තොප කෙරෙහි ඇති වේ ද (Paranavitana 1956 :353). යනුවෙන් තවත් කවියෙකු ඔහුගේ ද්වේශ සහගතභාවය දක්වා ඇත. මෙවැනි ගී තුළින් හැඟෙන්නේ තම ස්වාමියා මළ පසු කාන්තාව පැවතිය යුතු ආකාරයි. එකල සමාජයේ ඉන්දිය සමාජයේ මෙන් දැඩි නොවුන ද ස්වාමියා මළ ස්ත්‍රිය ඉතා ශෝචනීය තත්ත්වයකට මුහුණ දෙන ආකාරයක් මින් කියවෙන බව සිතිය හැකිය.

සීගිරි ලියන් මේ ආකාරයට මල් දම් රැගෙන සිටීම නිසා ඔවුන්ගේ හදවත දැඩි බවත්, අකාරුණික බව හා ද්‍රෝහී බවට ඇතමෙක් චෝදනා කරයි. සීගිරිගාමීන් එකිනෙකා සීගිරි අප්සරාවියන් දුටු ආකාරය තුළින් සමාජයේ විවිධ පැතිකඩයන් නිරූපණය කරයි. මල් රැගෙන ඉතා අලංකාර වස්ත්‍රයෙන් හා ආභරණ අතැතිව සිටින සුරූපී ලඳුන් ඇතමෙකු දැක්කේ ඉතා සුන්දර දසුන් ලෙසය. මෙවැනි සුන්දර ලියන්ට සමාන කළ හැකි අන් කිසිවක් නොමැති බව යි. තවත් අයෙකු මල් දම් තමා වෙත දිගු කර ආකාරයක් දැක ඇත. "........ ජනයා පර්වතය වෙත යන කළ දෙපියවුරෙහි වූ මලක් ගෙන පහතට දමුවා ය" (Paranavitana 1956 :183). තවකෙකු සීගිරි ලඳක් තම සිත් සොරාගත් බව කියයි (Paranavitana 1956 :350). මෙවැනි විවිධ වූ ආකාරයන් මඟින් සීගිරි ලඳුන් කෙරෙහි ඇති වූ ආදර හැඟීම් ඉස්මතු කොට දක්වා ඇත.

දුකට කරදරයකට පත් වූ අවස්ථාවක පිහිට වීම මානුෂීය ගුණාංගයකි. මේ සුගත ගුණය සීගිරි ගී ඇසුරෙහි ද දක්නට ලැබේ. "සිහි ලද කල්හි ඔහු ඒවි මෙතෙක් කල්ගත වූ හෙයින් ඔහු ඒවි..." යි (Paranavitana 1956:465). යනුවෙන් මොවුන් අස්වැසීමට උත්සාහ කළ බව පෙනේ.

ස්ත්‍රිය මෙන්ම ඇය සතු සුවිශේෂී හැකියාවන්, සමාජයේ ඇය දුටු ආකාරය විවිධ දෘෂ්ටිපත හරහා ධ්වනිත කරවීමට සීගිරි කිවියන් සමත් වී ඇත.

**පර්වතය මත වූ මාළිගය**

පද්‍ය කිහිපයක තේමාව වන්නේ පර්වතය මත වූ මාළිගාව වර්ණනා කිරීමයි. සීගිරි අප්සරාවන් බලන්නා සේ ම සීගිරි මාළිගාව ද බොහෝදෙනා නරඹා ඇත. එකී ගීවල සීගිරි බැලුම සිතෙහි රැඳෙන්නේ මාළිගාවත් නැරඹුවහොත් පමණක් ය බව දක්වයි (Paranavitana 1956 :275). බොහෝ දෙනෙක් මාළිගයෙහි අලංකාරත්වය, මනබඳින ආකාරයේ නිර්මාණය පිළිබඳ දක්වා ඇත. සීගිරි අප්සරාවන් සැප විඳින මන්දිරය

ලෙස ද ඇතමෙකු මාළිගය දැක තිබේ. මාළිගයෙහි බිත්ති මත මනස්කාන්ත සිතුවම් තිබූ බව ද ඇතමෙකුගේ කවි පබැඳුම් මඟින් කියවෙයි (Paranavitana 1956 :71).

**ස්වභාවික පරිසරය**

සීගිරි නම් නිර්මාණය ස්වභාවධර්මයට අනුගත වෙමින් නිර්මාණය වූවකි. ජල උද්‍යානය, ශිලා උද්‍යානය යනාදී ලෙසින් ස්වභාවික පරිසරය ඒ අයුරින් ම නිර්මාණකරුවා යොදාගෙන තිබේ. සීගිරිගාමීන් මෙම ස්වභාවික පරිසර නිර්මාණ පිළිබඳ කවි පබැඳුම් ගොතා ඇත. සිතුවම් කෙවෙනිවල සිට පහත බැලූ කල නෙත් ඇදී යන්නේ ජල උද්‍යානය වෙතටය. මේ බව "අලුයම අවුත් නැඟ මේ දෙස බලා සිටි මම මන්ද මාරුතය සමඟ එන නෙළුම් වනයේ සුවඳ වින්දෙමි......"(Paranavitana 1956:4). යනුවෙන් සඳහන් වේ. ජල උද්‍යානයේ නෙළුම් මල්වලින් අලංකාර වී තිබූ බව මේ තුළින් පැහැදිලි වෙයි.

සීගිරි කව්‍යක්කාරයින් කවි පබැඳුම්වල දී ස්වභාවධර්මය නිරීක්ෂණයෙන් නිර්මාණය කරගන්නා වූ තත් කාලීන පොදු ජන වහරින් ගන්නා වූ උපමා යොදාගෙන තිබේ. "ලියක දත් දක්වා සෙන සිනාව කැකිරි ඇට පෙළක් බඳු ය" ( Paranavitana 1956: 357)., "මහනෙල් වනක සමඟ හුන් රන්වන් ලිය නිල් කටරොළු මලක ඇවුණු වැටකොළු මල සේ ය" (Paranavitana 1956: 334). "...මහනෙල් මලක් අසල සිටි ඇසල මලක් වැනි ය..."(Paranavitana 1956:538). "...මහත් ප්‍රයත්නයෙන් ලත් ආදරය ඝන පර්වතයක් බිඳ ලත් පැනිත්තක් වැනි ය.." (Paranavitana 1956: 109). මේ බොහෝ උපමා රූපක ලෙසින් යෙදී ඇත. මෙවැනි පබැඳුම් ස්වභාවධර්මයෙන් වෙන් නොවී ජීවත් වුවන්ට පහසුවෙන් අවබෝධ වූ දෛනික භාෂාවෙන් ලියා තිබේ. මේ තුළින් සුන්දර සීගිරි පරිසරයෙහි ඇතැම් විට සංගීතයට අනුව ගැයුණු මේ ගීත ඇසුවන්ගේ මනස තුළ උචිත මනෝභාවය දැනවීමෙහිලා පොහොසත් වී තිබේ.

**සීගිරි කාව්‍යකාරයින්**

සීගිරි ගීත සමස්තයක් ලෙස ගත් කල විවිධ ජීවන ක්‍රමවලට අයත් වූ විවිධ පුද්ගලයන් විසින් ලියන ලද බවක් පෙනේ. රජවරු, ඇමතිවරු, සෙන්පතිවරු, කුමාරවරු, වෙළෙන්දෝ සහ ලේඛකයෝ ද සීගිරියට පැමිණියහ. මේ පිරිස අතර පැවිදි පක්ෂයේ අය ද බොහෝ වූහ. දිවයිනේ නන් දෙසින් පැමිණි පිරිස් අතර රුහුණින් ද විවිධ පිරිස් සීගිරිය නැරඹීමට පැමිණියහ (විතාන 1992: 48). එක ම තේමාවක් පදනම් කොටගෙන ගී පද පබැඳුනත් කිසියම් පෞද්ගලිකත්වයක්, අන්න්‍යන්ගෙන් වෙනස් වූ යමක් දැක්වීමට උත්සාහ ගෙන ඇත (Paranavitana 1956: 268). සීගිරිය

නැරඹුවන් සීගිරියට පැමිණි ආකාරය හා විනෝද වූ ආකාරය ප්‍රකාශ කරයි. එමෙන්ම මොවුන් කණ්ඩායම් වශයෙන් පැමිණි අතර උනුන් සීගිරිය තරණය කිරීම සඳහා දිරිගැන්විය. සීගිරිය නැගීම දුෂ්කර බවත්, කැලෑ මැදින් රිංගා යා යුතු බවත්, සුළං පහරින් පීඩා ඇති වූ ආකාරය ද දක්වා තිබේ. සීගිරිය තරණය පැරැණ්නන් ට කොපමණ අපහසු වුවත් ඊට පසුබට නොවීය. මින් පැහැදිලි වන්නේ පැරැණ්නන් සතුව පැවති අප්‍රතිහත ධෛර්‍ය යි. ඉතා අපහසු කාර්යන් පවා සාමාන්‍යකරණය කොටගත් බව පෙනේ.

සීගිරි කවිකාරයින් ඇතමෙකු කවි පද බැඳීමට උපන් සමතුන් බව කියතත් තවකෙකුට කවි පද ඇමිණීමට නොහැකි බව කියයි. ඔවුන් ඒ බව නිර්ව්‍යාජව කියූ අවස්ථාවන් හමුවෙයි. "බුදල් නම් වෙමි, සමුහයක් සමඟ පැමිණියෙමි සීගිරි බැලිමි බැලු බැලු බොහෝ දෙනා ගී ලියුවෙන් නො ලිමි" (Paranavitana 1956: 290). තවකෙක, "මෙහි පැමිණ ගීයක් නොබඳිනා ලදැයි නැඟෙන බියෙන් බියපත් වී සිටිමි......." (Paranavitana 1956: 405). යනුවෙන් සඳහන් වීමෙන් පැහැදිලි වෙයි. මේ වැනි පද්‍යවලින් හැඟෙන්නේ සීගිරි පව්ව තරණය කළ බොහෝ දෙනෙකුගේ මනෝභාවය කුරුටු ගෑ බවයි. නමුත් සීගිරිය නැරඹුවන් කිසිඳු අදහසක් හදවත ට නොනැඟුණ ද කවියක් ලිවීමට පසුබට නොවීය. මෙකල කවි පද ඇමිණීම සිරිතක්, අනිවාර්ය කාර්යයක් ලෙසින් සැලකුණා විය හැකිය. නැතහොත් මෙලෙස කුරුටුගෑම තම හැකියාව ප්‍රදර්ශනය කිරීමක් ද විය හැකිය. එකල සමාජයේ බොහෝදෙනාට විචක්ෂණ බුද්ධියක් පැවතුනා යැයි පෙනේ. මන්ද යත් කවියක් ඇමිණීමට කිසිඳු අදහසක් නැතත් ඒ බව කාව්‍යක් ලෙසින් ගොඩනැගීම යි.

කැටපත් පවුරේ වූ පද්‍ය බොහෝමය අතරින් 357කට නො අඩු ප්‍රමාණයක් කාව්‍ය ඇමුණුවන්ගේ නම් වාර්තාගත කොට ඇත. මෙය නිර්ව්‍යාජත්වයේ සංකේතයකි. එකිනෙකාට ගොඩනැගුණු අදහස් විශ්වාසයකින් ඉදිරිපත් කළා ද විය හැකිය. සීගිරිය නම් වූ අතිවිශිෂ්ට නිර්මාණය විශිෂ්ට වූවා සේ ම එකී ස්ථානයේ කාව්‍ය නිර්මාණය රසිකයින්ට මහත් වූ විනෝදයක් මෙන්ම උදම්වීමක් ද වන්නට ඇත.

සමාජයේ සෑම ක්ෂේත්‍රයක් ම නියෝජනය කරන්නන් පැමිණි බවත්, කිසිඳු භේදයකින් තොරව සමානාත්මතාවයෙන් කැටපත් පවුරේ කුරුටු ගෑමට නිදහසක් පැවති බවත් පෙනේ. විවිධ සමාජ තත්ත්වයන්ට අයත් වූවන් පමණක් නොව එකිනෙකට බොහෝ දුරස්ථ වූ ස්ථානවලින් පැමිණි අය ද වූ බව කාව්‍ය නිර්මාණ ඇසුරෙන් පැහැදිලි වෙයි. සමාජ ස්ථරායනය නොහොත් පන්ති පරතරය මෙකල සමාජයේ නොවූ බව ද මින් කියවෙයි. සමස්ත රසික ජනයාට කාව්‍ය පබැඳුමට විවෘත තෝතැන්නක් වීමෙන් ඒ බව පසක් වෙයි.

## නිගමනය

අතීත ශ්‍රී ලාංකිකයින් විනෝදකාමී ජාතියක් ලෙස හැඳින්වීම නිවැරදි වේ. මන්ද යත් සීගිරිය වැනි විශාල උසකින් පිහිටි පර්වතයක් තරණය කොට එහි දකින්නට ලැබෙන දේ බලා රසවිඳීමට හැකි වීමයි. එකී රසය අක්ෂරයකට නැඟීමට සමත් වීම තවත් අගය කළ යුත්තකි. එක ම තේමාවක් මත පදනම් වුවත්, එකිනෙකා රසවිඳි ආකාරය විවිධ ය. මේ රසවින්දනය තුළින් ශ්‍රී ලාංකීකයින් සතුව පැවති චිත්ත අභ්‍යන්තරය විනිවිද දැකීමට හැකි වී තිබේ. විවිධ මනෝමය සිතුවිලි කවි පබැඳුම් හරහා උද්දීපනය වී ඇත. එමෙන් ම විවිධ සමාජ මට්ටම් නියෝජනය කරන පුද්ගල කාණ්ඩ පැමිණි අතර ඒ සැම අයෙකුට ම අක්ෂර භාවිතය පිළිබඳ හැකියාව පැවති බව පෙනේ. සමස්තයක් ලෙස දක්වන්නේ නම් සීගිරි ගී තුළින් සමස්ත සමාජය ඉස්තු වී පෙනේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


**මහාවංසය** 1994 පී. බුද්ධදත්ත හිමි, (සං) ගුණසේන සහ සමාගම, කොළඹ.

ආටිගල, එන්. 2000 ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.*** පළමුවන කාණ්ඩය. කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

ආර්යසිංහ, ඒ. සහ ආර්. එම්. ඩබ්ලිව්. රාජපක්ෂ 1989 ***භාෂා විඥාන භාෂා විෂයක ලිපි සංග්‍රහය.*** අබයරත්න මුද්‍රණාලය, රදාවාන.

උඩගම, පී. 1965 භූගෝලීය පසුතලය ඉතිහාසය කෙරෙහි බල පෑ අයුරු, ***අනුරාධපුර යුගය.*** (සං.) අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය. පිටු. 37-45.

කල්‍යාණවංශ හිමි, 1964 ***ලංකාවේ ඓතිහාසික භූමි සිතුවම්.*** ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ධර්මදාස, කේ.එන්.ඕ. 1996 ***භාෂාව හා සමාජය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ධර්මදාස, කේ.එන්.ඕ. 1999 ***භාෂාවේ සම්භවය හා සංස්කෘතික මුහුණුවර***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

පරණවිතාන, එස්. 2000 ***සීගිරි කුරුටු ගී.*** 1 වෙළුම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

මනතුංග, ඒ. 2004 ***සීගිරි චිත්‍ර,*** සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා ඇල.

ලියනගමගේ, ඒ. සහ ආර්. ගුණවර්ධන, 1965 ***අනුරාධපුර යුගය.*** විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය, කැලණිය.

විතාන, ගුණසේන 1992 ***සීගිරි ගීයේ සමාජ දැක්ම.*** ලස්සන මුද්‍රණ ශිල්පියෝ, වැල්ලම්පිටිය.

විමලවංශ හිමි, බී. 1964 ***අපේ සංස්කෘතිය.*** ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

සුරවීර, ඒ. වී. 1962 ***අනුරාධපුර සමාජය***. සොමිසඳ මුද්‍රණාලය, දෙමටගොඩ.

Bell, H.C.P. 1897 Interim Report on the Operations of the Archeological Survey at Sigiriya, ***Journal of the Ceylon Branch of the Royal Asiatic Society*** Vol. xiv, Vol.47

Disanayaka,J.B. 1996 ***The New face of the Sinhala Language***, Department of Government Printing, Colombo.

Paranavitana, S. 1956 ***Sigiri Graffity***.1& 2 Vols , Oxford University Press, London.

# ස්වභාවික උරුමයක් වන කන්නෙලිය වැසි වනාන්තරය හා බැඳුණු ග්‍රාමීය ජීවනෝපාය

**එච්.එල්.අයි. මිහිරිණි**

භූගෝල විද්‍යා අධ්‍යනය අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

mihiriniliyanage@gmail.com

***සංක්ෂේපය***

*මෙම ශාස්ත්‍රීය ලිපිය මගින් අවධානය යොමු කරනු ලබන්නේ ස්වභාවික උරුමයක් වන කන්නෙලිය වැසි වනාන්තරය හා බැඳුණු ග්‍රාමීය ජීවනෝපාය පිළිබඳවයි. කන්නෙලිය වන රක්ෂිතය ශ්‍රී ලංකාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි පහත් බිම් නිවර්තන වැසි වනාන්තරයකි. සිංහරාජ ලෝක උරුම වැසි වනාන්තරයට සාපේක්ෂව කන්නෙලිය ශාක විවිධත්වයෙන් පොහොසත් ම වනාන්තරය ලෙස සැලකේ. ලංකා ප්ලයිවුඩ් සංස්ථාව (Ceylon Plywood Corporation) වර්ෂ 1968 සිට වර්ෂ 1988 දී දැව කැපීම අත්හිටුවන තෙක් මෙම සංකීර්ණයේ දැව කැපීමේ කටයුතුවල නිරත වී ඇත. නමුත් ස්වභාවික සම්පතක් වශයෙන් කන්නෙලිය වැසි වනාන්තරය ග්‍රාමීය ජීවනෝපාය තර කර ගැනීම සඳහා ගම්මුන් තවමත් උපයෝජනය කර ගනී. ඒ අනුව මෙහි පර්යේෂණ ගැටළුව ලෙස කන්නෙලිය වැසි වනාන්තරය හා බැඳුණු ග්‍රාමීය ජීවනෝපායන් මොනවාද යන්න හැඳින්විය හැකි ය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ග්‍රාමීය ජීවනෝපායන් හඳුනාගැනීම වේ. පර්යේෂණ ගැටළුවට අදාළව ප්‍රාථමික හා ද්විතියික දත්ත අධ්‍යනය තුළ රැස්කර ඇති අතර ලබාගන්නා ලද ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණය ඇසුරින් විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනය තුළ ලබාගන්නා ලද ප්‍රාථමික දත්ත උද්ගාමී තර්කන ප්‍රවේශය යටතේ මිශ්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් විශ්ලේෂණය කර ඇති අතර එහි ප්‍රතිඵල වගු හා ප්‍රස්ථාර මගින් ඉදිරිපත් කර ඇත. ප්‍රතිඵල හා සාකච්ඡාව තුළ කන්නෙලිය වැසි වනාන්තරයට ප්‍රතිවිරුද්ධ පැති දෙකක පිහිටා තිබෙන නාකියාදෙණිය හා දෙදියගල ගම්මාන අවට ගම්වාසීන්ගේ මානව හා කෘෂි ආර්ථික කටයුතු වනාන්තරය සමග දක්වන අන්තර් සම්බන්ධතාවයන් විශ්ලේෂණය කර විග්‍රහ කර ඇති අතර පර්යේෂණය තුළ හේන් ගොවිතැන, වී වගාව, වන ද්‍රව්‍ය රැස්කිරීම හා කිතුල් කර්මාන්තය, රබර් කිරි කැපීම, කුරුඳු කැපීම, ගම්මිරිස් වගාව, තේ ගස් සිටුවීම, කන්නෙලිය ආශ්‍රිත සංචාරක කර්මාන්තය සහ සංචාරක මාර්ගෝපදේශ රැකියාව ග්‍රාමීය ජීවනෝපායන් වශයෙන් හඳුනාගෙන ඇත.*

***මුඛ්‍ය පද*** *- ස්වභාවික ප්‍රාග්ධනය, කන්නෙලිය වැසි වනාන්තරය, ග්‍රාමීය ජීවනෝපායන්, ප්‍රාථමික ආර්ථික කටයුතු*

**හැඳින්වීම**

ස්වභාවික සම්පත් ස්වභාවික ප්‍රාග්ධනය ලෙස සැලකේ. ලෝකයේ සෑම රටක් ම කවර හෝ ස්වභාවික සම්පත් පදනමක් මත ගොඩනැගී ඇත. එහෙත් ආර්ථිකයක් තුළ ස්වභාවික සම්පත්වල වැදගත්කම රටින් රටට වෙනස් වේ. ස්වභාවික සම්පතක් ලෙස වනාන්තර, ගහකොළ, ජලය නොමැතිනම් මිහිපිටින් ජීවය තුරන්වනු ඇත. වනාන්තර ලෙස සැලකිය යුත්තේ ස්වභාවික සම්පත්වල යථා ස්වභාවයයි. එහෙත් හිරු එළිය, වාතය හා ඇතැම් ජල මූලාශ්‍ර වැනි ස්වභාවික සම්පත් හැර බොහොමයක් ස්වභාවික සම්පත් ඒවායේ ප්‍රකෘති තත්වයෙන් ම ප්‍රයෝජනයට ගත නොහැක. ඒවා ප්‍රයෝජනයට ගතහැකි තත්වයට පත්කිරීමට අනෙකුත් නිෂ්පාදන සම්පත් යොදා යෝග්‍ය තත්වයට පත්කර ගත යුතුය. එසේ කිරීමෙන් පසු තවදුරටත් එම සම්පත වනාන්තර ලෙස හැඳින්විය නොහැකි අතර, එය ප්‍රාග්ධනය බවට පත්වේ. උදාහරණයක් ලෙස වනාන්තරවලින් සපයා ගන්නා ඖෂධ, දර ඇතුළු වන ද්‍රව්‍ය ස්වභාවික ප්‍රාග්ධනයයි. එම ද්‍රව්‍ය වනාන්තරයෙන් ලබා ගැනීමට පෙර පැවතියේ ප්‍රකෘති තත්වයෙනි.

වැසි වනාන්තර යනු ඉතා ඉහළ වර්ෂාපතනයක් ලැබෙන වනාන්තර වේ. අර්ථ දැක්වීමට අනුව එය අවම වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1750 - 2000 (අඟල් 68 - 78) අතර ප්‍රමාණයක් විය යුතුය. වැසි වනාන්තර පෘථිවිය මත ජීවත් වන ශාක හා සත්ත්ව විශේෂ 2/3කට ම වාසස්ථාන වේ. (*Bandarathilake, HM 2003*) තක්සේරු කර ඇති අන්දමට මෙහි ජීවත්වන ශාක, කෘමි සහ බොහෝ ක්ෂුද්‍ර ජීවීන් විශේෂ මිලියන ප්‍රමාණයක් තවමත් හඳුනාගෙන නොමැත. නිවර්තන වැසි වනාන්තර පෘථිවිය මත ඇති ආභරණයක් ලෙස ද හැඳින්වෙන අතර එය ලොව විශාලතම ඖෂධාගාරය ලෙස ද හැඳින්වෙන්නේ ඒ තුළින් සොයා ගන්නා ලද විශාල ප්‍රමාණයක ස්වභාවික ඖෂධ ප්‍රමාණයක් හේතුවෙනි. ලංකාවේ තෙත් කලාපයේ ඇති සත්ත්ව හා ශාක විශේෂ සංඛ්‍යාව මෙන්ම ජාන විවිධත්වය වියළි කලාපයට වඩා බෙහෙවින් ඉහළ ය. එම නිසා තෙත් කලාපයේ වැඩිම අවධානයකට ලක් වූ වනාන්තරයක් ලෙස කන්නෙලිය දෙවැනි වන්නේ සිංහරාජයට පමණි.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ කන්නෙලිය වනාන්තරය අවට ගම්මානවල මානව ක්‍රියාකාරකම් වනාන්තරයත් සමඟින් දක්වන අන්තර් සබඳතාවයන් විශ්ලේෂණය කර, ගම්වල ජනතාව තම ජීවනෝපායන් සරිකර ගැනීමට ස්වභාවික සම්පතක් ලෙස කන්නෙලිය වනාන්තරය උපයෝගී කර ගන්නා ආකාරය පිළිබඳව විශ්ලේෂණය කිරීමයි. ඒ අනුව කන්නෙලියේ ප්‍රතිවිරුද්ධ පැති දෙකක

පිහිටා තිබෙන ගම්මාන දෙකක් වන දෙදියගල හා නාකියාදෙණිය තෝරාගෙන ඒවායේ මානව හා කෘෂි ආර්ථික කටයුතු කෙසේ සිදුවන්නේ ද යන්න අධ්‍යයනයක් සිදු කෙරිණි. දිළිඳු ජීවිත ගතකරන ගම්මුන් වනබිමෙන් එලවැල නෙලාගනිමින්, කිතුල්, වේවැල් ආශ්‍රිත නිෂ්පාදන සිදුකරමින් මෙම ගම්මානවල ප්‍රධාන ආදායම වන තේ වගාව ආශ්‍රිත භූමි පරිභෝජන රටාවන් නිර්මාණය කරගැනීම ඔස්සේ තම ජීවනෝපාය වනාන්තරයට අවම හානියක් කරන හෝ කිසිදු හානියක් නොකරන ලෙස පවත්වා ගනිමින් ජීවත්වන ආකාරය දැකගත හැකිවිය.

**ක්‍රමවේදය**

මෙම ශාස්ත්‍රීය අධ්‍යයනය තුළ මූලික වශයෙන් ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත යන දෙආකාරයේ ම දත්ත රැස්කොට ඇති අතර සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ, ප්‍රශ්නාවලි ආදී ක්ෂේත්‍ර සමීක්ෂණ මඟින් ප්‍රාථමික දත්ත ලබාගෙන ඇති අතර පර්යේෂණ සමුළු, පර්යේෂණ පත්‍රිකා, සඟරා හා පොත්පත් මඟින් ද්විතියික දත්ත රැස්කොට ඇත. ලබාගන්නා ලද ගුණාත්මක දත්ත උද්ගාමී තර්කන ප්‍රවේශය ඔස්සේ මිශ්‍ර ක්‍රමවේදය භාවිතා කරගනිමින් තේමා විශ්ලේෂණය ඇසුරින් විශ්ලේෂණය කර ඇත.


**ප්‍රතිඵල හා සාකච්ඡාව**

**කන්නෙලිය වැසි වනාන්තරය සහ අධ්‍යයන ප්‍රදේශයේ පිහිටීම**

ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක අතරමැද කන්නෙලිය වනාන්තරය පිහිටා ඇත. මෙය නිවර්තන තෙත් කලාපීය වැසි වනාන්තරයක් ලෙස සැලකේ. උතුරු අක්ෂාංශ අංශක 06-09 හා 06-18ත් නැගෙනහිර දේශාංශ 80-90ත් හා 80-27ක් අතර පිහිටා ඇති වනාන්තරයේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය හෙක්ටයාර 5305කි. *(Conservation Management Plan 1995)* ආසියාවේ ඇති වැසි වනාන්තර අතුරින් ඒකදේශීය විශේෂ වැඩි ගණනකින් සමන්විත වනාන්තරයක් ලෙස කන්නෙලිය වනාන්තරය පිළිගැනේ. කන්නෙලිය වනාන්තරය බටහිර දෙසින් ගලා බස්නා ගිං ගඟත් නැගෙනහිර දෙසින් ගලා බස්නා නිල්වලා ගඟත් මඟින් පෝෂණය කරයි. ගංගාවල අසිරිය පමණක් නොව ඒ ආශ්‍රිතව සැදුණු නොයෙක් භූ ලක්ෂණත් සෞන්දර්යත් මෙම වනාන්තරය තුළ දී විඳගැනීමට හැකිය. එමෙන්ම මේ කන්නෙලිය, දෙදියගල, නාකියාදෙනිය වනාන්තර පද්ධතිය සමාන්තර කඳු පන්ති කිහිපයකින් යුක්ත වේ. තව ද කන්නෙලිය ශ්‍රී ලංකාව තුළ මෙන්ම ලෝකයේ ඇති ජෛව විවිධත්වයෙන් ඉහළ ම ස්ථාන අතරින් එකක් ලෙස හැඳින්විය හැකි සේ ම කන්නෙලිය තුළ ඇති ජෛව විවිධත්වය ලෝක උරුමයක් ලෙස සලකන ''සිංහරාජ'' වැසි වනාන්තරයටත්

වඩා ඉහළ බව හැඳින්වේ. මේ හේතූන් නිසා ම 2004 වර්ෂයේ දී එය ජෛවගෝල රක්ෂිතයක් ලෙස යුනෙස්කෝ විසින් නම් කර තිබේ (UNESCO 2004).

දෙසැම්බර් සහ පෙබරවාරි මාස කන්නෙලියේ සංචාරයට වඩාත් සුදුසු කාලයන් වේ. මන්දයත් වර්ෂාව හොඳින් ලැබෙන කාල නිසාවෙනි. එම කාලවලට දොළවල් ජලයෙන් පිරී පවතින නිසා සුන්දර දසුන් නැරඹීමට අවස්ථාව හිමි වන අතර ම ස්වභාවික ස්නානයක් ද ලබාගත හැකිය. සංචාරකයන් වැඩි වශයෙන් මෙහි පැමිණෙනුයේ පා ගමන් සඳහා වන අතර ඒ සඳහා සුදුසු කාලය වනුයේ මාර්තු සහ අප්‍රේල් මාසයි. මන්ද එම කාලයේ වර්ෂාව අඩු හෙයිනි.




**Source : Compiled by Author Using Digital Data**

***සිතියම් අංක 01 :*** *අධ්‍යයන ප්‍රදේශයේ පිහිටීම*

**කන්නෙලියට ලඟා විය හැකි ආකාර**

- පළාත - දකුණු පලාත
- දිස්ත්‍රික්කය - ගාල්ල
- පිහිටීම - ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත.

- ගමන් මාර්ගය - කන්නෙලිය වන පිවිසුමට කෝරලේගම - කන්නෙලිය මාර්ගය ඔස්සේ ලඟාවිය හැකිය. කෝරලේගම - කන්නෙලිය මාර්ගය ගාල්ල, උඩුගම, තවලම හරහා නෙළුව ප්‍රධාන මාර්ගයට ඔබ්බෙන් වූ රථ වාහන ගමන් කළ හැකි කුඩා මාර්ගයකි. කොළඹ සිට කළුතර හෝ හොරණ හරහා මතුගමට පැමිණ මීගහතැන්න, නෙළුව, තවලම, හිනිදුම හරහා කෝරලේගමට පැමිණිය හැකිය. නැතිනම් මීගහතැන්න - පිටිගල මාර්ගයේ බොරළුහේන හරහා තවලම මාර්ගයේ පැමිණ හිනිදුම හරහා ද පැමිණිය හැකිය. ගාල්ල උඩුගම හරහා පැමිණීම මෙන්ම දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයේ බද්දේගම පිවිසුම් මඟ හරහා උඩුගමට පැමිණීමෙන් ද මෙහි ළඟාවිය හැකිය.

**කන්නෙලිය- නාකියාදෙණිය- දෙදියගල වනාන්තර සංකීර්ණය**

| වනාන්තර | සන වනාන්තර (හෙක්ටයාර) | විරල වනාන්තර (හෙක්ටයාර) | වන වගාව (හෙක්ටයාර) | එකතුව |
|---|---|---|---|---|
| කන්නෙලිය | 5,108 | 168 | 29 | 5,306 |
| දෙදියගල | 3,306 | 198 | - | 3,504 |
| නාකියාදෙණිය | 1,300 | 29 | - | 1,329 |
| එකතුව | 9,714 | 395 | 29 | 10,139 |

***වගු අංක 01 :*** *කන්නෙලිය- නාකියාදෙණිය- දෙදියගල වනාන්තර සංකීර්ණයේ පැතිරීම*

*Source: KDN Forest Complex - Conservation Management Plan (1995)*

**ස්වභාවික සම්පතක් ලෙස කන්නෙලියේ වැදගත්කම**

පරිසර සංචරණයේ පිවිසුම් දොරටුව ලෙස සැලකෙන කන්නෙලිය රක්ෂිතය කඳු හා නිම්නවලින් යුත් මීටර් 60 - 425 උච්චත්වයකින් යුතු ඉහළ ජෛව විවිධත්වයක් දක්නට ලැබෙන වන ගොමුවකි. එක් කුඩා ප්‍රදේශයක හමුවන වැඩි ම ජෛව විවිධත්වය වාර්තා වන්නේ ද කන්නෙලිය රක්ෂිතයෙනි. මේ නිසා කන්නෙලිය ජෛව විද්‍යාත්මක උණුසුම් කලාප හෙවත් Bio diversity hot spot ලෙස සලකයි. අධික ජෛව විවිධත්වයක් පැවතිය ද කන්නෙලිය වනාන්තරය තුළ ප්‍රාථමික වනාන්තර (primary forest) ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. වනාන්තරය පුරා පැතිර පවතින්නේ අලුතින් වැඩුණු ශාකවලින් යුත් ද්විතියික වනාන්තර (secondary forest) ය. මීට හේතුවී ඇත්තේ 1960 දශකයේ සිට 1970 අගභාගය වන තුරු තුනී ලෑලි සංස්ථාවේ ගාල්ල ගිංතොට කම්හල වෙත තුනී ලෑලි නිෂ්පාදනය සඳහා දැව ලබා ගැනීමට වරණීය ලෙස දැව හෙළීමට ලක්කිරීමයි. වර්තමානයේ පවා දැව හෙළීම සඳහා ඉදිකරන ලද ගොඩනැගිලි සහ තාර දමා සකස් කළ මාර්ග පද්ධතිය වනාන්තරය තුළ දක්නට ලැබේ. මෙම මාර්ග වනාන්තරය සංචාරක කටයුතු සඳහා යොදාගෙන ඇත. ලෑලි සඳහා දැව කැපීම නතරවීමෙන් පසු වනාන්තරය ඝනව වැඩී ඇති අතර, අද වන විට වනාන්තර විනාශයක් සිදුවී ඇති බවට සලකුණු මැකී ගොස් තිබේ.

කන්නෙලිය දකුණු ආසියාවේ පිහිටි ශාක සම්පත අතින් ඉහළ ම වටිනාකමකින් යුක්ත වනාන්තරයකි. කන්නෙලිය වනාන්තරයෙන් ශාක විශේෂ 301ක් වාර්තා වී තිබේ. මෙම ශාක විශේෂවලට ශාක, පඳුරු සහ පැළෑටි අයත්වන අතර, ඉන් 25%ක් ම ශ්‍රී ලංකාවට ආවේණික වේ. *(Conservation Management Plan 1995)* මෙම ශාක විශේෂ අතුරින් විශේෂ 26ක් අප රටෙන් වඳවීයාමේ තර්ජනයට ලක්වී තිබේ. කන්නෙලිය වනාන්තරය තෙත් කලාපීය වනාන්තර අතුරින් ඉහළම ආවේණික කාෂ්ඨීය ශාක විශේෂ ප්‍රතිශතයක් (60%) සතු වනාන්තරයකි. කන්නෙලිය වනාන්තරයේ ප්‍රමුඛ ශාක කුලය ලෙස හොර කුලය හැඳින්විය හැකිය. තවද, නා, දුන් ,ඇටඹ, කීන, කැකුණ, බදුල්ල, රං දෝතළු, දොරණ, බෙරලිය දුන්, හොඳ බෙරලිය, තිනිය, දියපර, ආරිද්ද, මඩොල් ආදී ශාක විශේෂ බහුලව දැකිය හැකිය. මෙහි දක්නට ලැබෙන මැන්ඩෝරා විශේෂයක් මුළු ලොවින් ම දක්නට ලැබෙන්නේ කන්නෙලියේ පමණි. වනාන්තරය තුළ ඖෂධ ශාක වර්ග ද රාශියක් හමුවේ. ඒවා අතර රසකිඳ, වෙනිවැල්, හාතාවාරිය, එනසාල්, කුඩා හැඩයා, මහා හැඩයා, සත්සඳ, සඳරාජ, වනරාජ, ඉරු රාජ, කොකුම්, දුම්මල වැනි ශාක මුල් තැනක් ගනී.

කන්නෙලිය තුළ අනෙකුත් වැසි වනාන්තරයකට නොදෙවෙනි මට්ටමේ ඉහළ සත්ව විවිධත්වයක් ද දක්නට ලැබේ.

කන්නෙලිය රක්ෂිතය තුළින් පක්ෂි විශේෂ 120ක් පමණ හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂි විශේෂ 24 අතරින් පක්ෂි විශේෂ 14ක් ම මේ අතර සිටීම සුවිශේෂී වැදගත්කමකි. බට ඇටිකුකුලා, කැහිබෙල්ලා, වලිකුකුලා, දෙමලිච්චා, හබන් කුකුලා, අළුගිරවා, වත රතුමල් කොහා, ලංකා සැලලිහිණියා වැනි දුර්ලභ පක්ෂි විශේෂ රාශියක් කන්නෙලිය තුළ දී දැක බලාගත හැකිය. *(Conservation Management Plan 1995)* කන්නෙලිය තුළින් ක්ෂීරපායි විශේෂ 20ක් පමණ හඳුනාගෙන ඇති අතර කළු වඳුරා, මී මින්නා, රත් උණහපුළුවා, රන් හෝතඹුවා, ගෝනා, කබල්ලැවා, බටුලේනා, දඬු ලේනා, දම් මුහුණැති කොළ වඳුරා බහුලව හඳුනාගත හැකිය. මෙම විශේෂ අතුරින් ගෝනා විශාලතම ශාක භක්ෂක සත්ත්ව විශේෂය වේ. ශ්‍රී ලංකාවේ වෙසෙන විශාලතම මාංශ භක්ෂක සත්ත්වයා වන දිවියා ද මෙම වනාන්තරය තුළින් වාර්තා වී තිබේ.

දකුණු ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රධාන ගංගා දෙක වන ගිං හා නිල්වලා ගංගා දෙකෙහි ම ප්‍රධාන පෝෂක ප්‍රදේශය වන්නේ කන්නෙලිය වනාන්තරයයි. වනාන්තරය තුළින් ආරම්භ වන දිය දහරා විශාල ප්‍රමාණයක් පවතින බැවින් ජල විද්‍යාත්මකව දකුණු ලංකාවේ ප්‍රථම ස්ථානය හිමි වන්නේ ද කන්නෙලියට ය. වනය තුළ ඇති කුඩා දිය දහරාවන් මඟින් ප්‍රධාන ජල දහරාවන් තුනකට ජලය සපයන අතර මෙම අතු ගංගා තුන ඔස්සේ ගිං ගඟ වෙත ජලය සැපයීම සිදුකරයි. මේ එක් අතු ගංගාවක් මඟින් වනයේ පිහිටි සුන්දර ම දියඇලි දෙක වන අනගිමල ඇල්ල හා නාරංගස් ඇල්ල යන සුන්දර දියඇලි දෙක ඇති වේ.

කන්නෙලිය රක්ෂිතයේ ඇති සුවිශේෂී ලක්ෂණය වන්නේ එහි පාරිසරික සංචරණය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමයි. මෙම වනාන්තරයේ ජෛව විවිධත්වයේ සුවිශේෂීත්වය නිසා ම 2002 වසරේ සිට දේශිය හා විදේශිය සංචාරකයන් වෙනුවෙන් කන්නෙලියෙහි පිවිසුම් දොරටුවක් නිර්මාණය කොට තිබේ. එමෙන්ම පරිසරය හා ජෛව විවිධත්වය පිළිබඳව අධ්‍යයනය කිරීමට අවශ්‍ය පහසුකම් හා සුදුසු වටපිටාවක් ද මෙහි පවතී. මේ නිසා ම පරිසරවේදීහු, විද්‍යාඥයින් පර්යේෂකයින්, පාසල් හා විශ්වවිද්‍යාල සිසුහු, ඡායාරූප ශිල්පීහු මෙන්ම සාමාන්‍ය ජනතාව ද නිරන්තරයෙන් ම කන්නෙලිය වනපෙත වෙත පැමිණීමට පුරුදුවී සිටිති. කන්නෙලියට පැමිණෙන පරිසරලෝලීන් වෙනුවෙන් අවශ්‍ය සියලු පහසුකම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිදුකරයි. වනාන්තරයට පැමිණෙන්නන් වෙනුවෙන් අවශ්‍ය පුහුණු මාර්ගෝපදේශකයින් වනාන්තරයේ විවිධ ස්ථානවල

නිරීක්ෂණ අට්ටාල සහ ගිමන් හැරීමේ ස්ථාන, තොරතුරු මධ්‍යස්ථාන, ප්‍රවේශපත්‍ර කාර්යාල, සම්මන්ත්‍රණ ශාලා පහසුකම් සහ පිටත හිඳගෙන විවේක ගැනීමට සැකසුණු ස්ථානවලින් සමන්විත වූ සංරක්ෂණ මධ්‍යස්ථානය සහ තොරතුරු සහ මුද්‍රිත ද්‍රව්‍ය මිලදීගත හැකි අලෙවිහල් ආදී සියලු පහසුකම් දෙපාර්තමේන්තුව මඟින් සපයා ඇත. එමෙන්ම ඉතාමත් අඩු මුදලකට රාත්‍රී කාලයේ නැවතීම සඳහා සුවපහසු කාමර පහසුකම් දෙපාර්තමේන්තුව මඟින් සංචාරකයින්ට සපයා දී තිබේ. කෑමට අවශ්‍ය කරන ද්‍රව්‍ය පිටතින් රැගෙන පැමිණියහොත් කෑම සකසා දීමට ද මෙහි අරක්කැමියෝ සූදානමින් සිටිති. කන්නෙලිය රක්ෂිතය නැරඹීමට යන සංචාරකයෙකුට දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන මඟ පෙන්වන්නෙකු සහ ඇතුළුවීමට ප්‍රවේශපත්‍ර ලබා ගැනීම අනිවාර්ය වේ. මඟ පෙන්වන්නෙකු නොමැතිව වනයට ඇතුළුවීමට කිසිසේත් ම අවසර ලබා නො දේ.

ජෛව විවිධත්වය අතින් අතිශය සංවේදී කලාපයක් වන ජීවයේ හදවත බඳු කන්නෙලිය මිනිසාගේ පැවැත්මට අවශ්‍ය ස්වභාවික ප්‍රාග්ධනය උත්පාදනය කරන තෝතැන්නක් වශයෙන් හැඳින්විය හැකිය.

**කන්නෙලිය වැසි වනාන්තරය අවට ගම්මාන**

කන්නෙලිය වනාන්තර සංකීර්ණය අවට ගම්මාන 78ක ගැමියන් 10,000ක් පමණ ජීවත් වෙති. වන වගාව, දැව නොවන නිෂ්පාදන එකතු කිරීම, වී වගාව, තේ, රබර් සහ කුරුඳු වගාවන්, සත්ත්ව පාලනය සහ වෙනත් කෘෂිකාර්මික හා ගෘහ කර්මාන්ත වැනි ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් වනාන්තරය වටා සිදු වේ. කෙසේ නමුත් ස්වභාවික ප්‍රාග්ධනය සහ ලංකාවේ ජීවනෝපාය යන නිබන්ධනයට පාදක කරගනු ලැබුවේ කන්නෙලිය අවට ඇති නාකියාදෙණිය හා දෙදියගල ගම්මාන දෙක වේ. ගාල්ලට උතුරින් සහ නැගෙනහිර දෙසින් පිහිටි කන්නෙලියට අයත් සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර 5305කි. ඒ අතරින් හෙක්ටයාර 5108ක් ඝණ වනාන්තරය ලෙසත් ඉතිරි හෙක්ටයාර 168 එළිමහන් ප්‍රදේශ ලෙසත් පවතී. කන්නෙලිය වශයෙන් තනිව සැලකීමේ දී තත්ත්වය එසේ වුවත් කලින් සඳහන් කළ ප්‍රදේශ තුන ම එකතුව පද්ධතියක් ලෙස සැලකීමේ දී එය ඉතා ම විශාල ප්‍රදේශයකි. කන්නෙලිය, දෙදියගල සහ නාකියාදෙණිය යන පද්ධතිය ම එකට සැලකුවිට එහි සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර 1200කට ආසන්න වේ.

වනාන්තරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල ජීවත්වන ගැමියන් බොහෝ දෙනා තවමත් දරිද්‍රතාවයයෙන් බැටකන ජන කොට්ඨාසයක් ලෙස හැඳින්විය හැකි ය. එමෙන්ම ගම්මානත් අවම පහසුකම් යටතේ තවමත් නොදියුණු තත්වයේ පවතින ප්‍රදේශ වේ.

අධ්‍යයනය සඳහා තෝරාගත් කන්නෙලිය වනාන්තරයට ඉතාමත් ආසන්න, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාකියාදෙණිය සහ දෙදියගල ප්‍රදේශත් තවමත් ඌණ සංවර්ධිත තත්වයේ පවතින ගම්මාන වේ. කෙටියෙන් ම කිවහොත් රෝහල් පහසුකම් ලබාගැනීමට පවා අධ්‍යයන ප්‍රදේශවලින් තරමක් දුරින් පිහිටි උඩුගම ප්‍රදේශයට ම යා යුතුය. ග්‍රාමීය පාසල් හතරක් අධ්‍යයන ප්‍රදේශ තුළ පිහිටා තිබෙන අතර එයින් පාසල් දෙකක් කනිෂ්ඨ විද්‍යාල වේ. ගම්මාන දෙකටම ආසන්නතම ප්‍රධාන බස් නැවතුම්පොළ උඩුගම ප්‍රධාන බස් නැවතුම්පොළයි. වනජ ද්‍රව්‍ය ද අලෙවි කරමින් පවත්නා සතිපොළ සෑම සති අන්තයකම ඉරිදා දින උඩුගම ප්‍රධාන බස් නැවතුම අසල පැවැත්වේ.

අඩු පහසුකම් තත්වයන් පැවතිය ද ස්වභාව සෞන්දර්ය අතින් ඉතාමත් සුන්දර වපසරියක පිහිටා ඇති ප්‍රදේශයක් ලෙස නාකියාදෙණිය සහ දෙදියගල ගම්මාන හැඳින්විය හැකිය. දූෂිත වායූන් රහිත පිරිසිදු ඔක්සිජන් ආශ්වාස කරන නිරෝගී මිනිසුන් ජීවත්වන හරිත කලාපයක් ලෙස මෙම ගම්මාන හැඳින්විය හැකිය. තිරසාර ලෙස වන සම්පත පරිහරණය කරමින් ස්වභාවික ප්‍රාග්ධනය උත්පාදනය කර ගැනීමට ග්‍රාමීය ජනතාව තව තවත් උත්සුක වන්නේ නම් දරිද්‍රතාවයෙන් දුක් විඳින මෙකී ප්‍රාථමික ගම්මාන සම්පත් කලාපයන් බවට පත්වනු නොඅනුමානය. ඒ සඳහා අවශ්‍ය අදහස් හා යෝජනාවලියක් ලිපිය අවසානයේ සඳහන් කර තිබෙයි.

**ග්‍රාමීය භූමි පරිභෝජන රටාව**

කන්නෙලිය ජනාවාස වූ මුල් යුගයේ දී වන්නියෙන් පැමිණි මිනිසුන් ගොවිතැන් කරමින් ජීවත් වී ඇත. එහි දී ප්‍රධාන වශයෙන් ම හේන් ගොවිතැන සිදුකර ඇත. පසුව ක්‍රම ක්‍රමයෙන් 19 හා 20 වෙනි සියවස් හි ග්‍රාමීය කේන්ද්‍ර නාකියාදෙණිය හා දෙදියගල අවට ස්ථාපනය වෙත් ම වනබිමෙන් ලබාගත හැකි ද්‍රව්‍ය වලින් ද ඔවුහු පෝෂිත වූහ. ඒ අතර බෙරලිය, හල්, තොලොල්, ඉදලෝලු හතු හා විවිධ පලා වර්ග, අල වර්ග වැනි දෑ ආහාර සඳහා ඔවුන් සපයා ගන්නා ලදී. කිතුල් පැණි හා මී පැණි ද වනබිමෙන් ගෙන තිබේ. මුල් යුගයේ හේන් වගාව හා වී ගොවිතැනෙන් යැපුණු ඔවුහු පසුව වනබිමෙන් එනසාල් නෙලීම, දුම්මල කැඩීම, ලී ඉරීම, මිනිරන් පතල් කැපීම, මැණික් ගැරීම හා වෙනත් සුළු වෙළඳාම් හි නිරතව සිය ආර්ථිකය තරකර ගත්හ.

මේ වන විට ගම්වාසින්ගෙන් නිරන්තරයෙන් වනාන්තර බිමට ඇතුළු වන්නේ බොහෝවිට පුරුද්දට මෙන් ඉඳහිට එහි යන පිරිමි උදවිය හෝ වනරොදේ කිතුල් ගහක් මැදගන්නා අයෙකු පමණි. සැප්තැම්බර් සිට ඔක්තෝම්බර් අතර මාසවල හැදෙන දුඹුරු පාටට හුරු පිසූ විට ඌරු මස්වලට සමාන ඉදලොලු නම් බිම්වල්


වර්ගය නෙළීමට ගම්මුන් වන වදිති. මෙම හතු වියළා කල්තබා ගත හැකිය. ගල් වෙරළු, හිඹටු, ඩොංගා ආදී පලතුරු කන්නෙලියේ ඇත. තව ද වසර 5කට පමණ වරක් හැදෙන අඟලක පමණ විෂ්කම්භයක් ඇති බෙරලිය ගෙඩි ජනවාරි මස දී වනබිමට ගොස් රැස්කර ගනී. තව ද වසරකට වරක් ජූලි - අගෝස්තු මාසවල නෙලා ගත හැකි තොලොල් නම් ගෙඩි වර්ගයක් ද වනාන්තරයේ ඇත. මෙම බෙරලිය හා තොලොල් කඩා ගැනීම දැනටත් කන්නෙලිය අවට දෙදියගල හා නාකියාදෙණිය ගම්මානවල ගම්මුන් නියමිත කාල වකවානුවල දී වනයට පිවිසෙති. ගැමියන් කන්නෙලියෙන් ලබා ගන්නා ඖෂධ අතර වෙනිවැල් (බාන්වැල්), පුස් ඇට, වැල් කුරුඳු, බිං කොහොඹ ආදිය වෙයි. වනබිමෙන් ලබාගන්නා රෙසින් වර්ග අතර දුම්මල හා දොරන තෙල් විශේෂ වේ. නිවෙස් හෙවිලි කිරීමට ගන්නා ද්‍රව්‍ය අතර ඉලුක්, වියළි බෙරු පත්‍ර හා බටකොළ ඇත. ඒවා වෙළීමට බාඳුරා වැල්, පෝට වැල් ආදිය ගනී. නමුත් වේවැල් (කුකුල් වැල්), වෙනිවැල් යනාදිය වර්ෂ 1970 දී පමණ තේ ආර්ථිකය පැමිණීමත් සමඟ නෙලාගැනීම සීමිත විය. 2004 දී කන්නෙලිය ජෛවගෝල රක්ෂිතයක් කළ පසුව වේවැල් වනාන්තරයෙන් ලබා ගැනීම දුෂ්කර වී ඇත. වේවැල් කපා කුඩ, මළු, පුටු, පෙට්ටි, පිඟන් ආදිය සකසා ගැමියන් කන්නෙලියට එන සංචාරකයන්ට අලෙවි කරයි.

ගැමියන් ආහාරයට ගන්නා මීවන ශාක අතර, ගමේ බඩවැටිවල සෑදෙන පාත්තරං කොකු හා ගිනිහොඩ ශාක ඇත. තව ද දෝතලු, පුවක් ශාකයේ බඩ හා කටු කිතුල් ශාකයේ බඩ ව්‍යංජනයට උයා ගනී. කන්නෙලිය හා අවට වනබිමෙහි ඇති ශාක විශේෂ 179ක් පමණ අවට ගම්වාසීන් විසින් වනජ ද්‍රව්‍ය සපයා ගැනීමට යොදාගන්නා බව හඳුනාගෙන ඇත. වනබිමෙන් ගම්මුන් කුළුබඩු ලෙස එනසාල් හා ගොරකා ලබාගනී. මෙම එනසාල් ස්වභාවිකව ම පැතිරී ඇත. 1960 ගණන් හි වනබිම තුළ තාවකාලිකව කුඩාරම් ගසා මිනිසුන් එනසාල් එකතු කර ඇත. තුනී ලෑලි කර්මාන්තය සඳහා වනාන්තරයේ ගස් කැපීමත් සමඟ එනසාල් ගහනය මේ වනවිට තරමක් අඩු වී ඇත.

**නාකියාදෙණිය හා දෙදියගල ගම්වාසීන්ගේ ආර්ථික ප්‍රභවයන්**

කන්නෙලිය ආශ්‍රිත ගම්මානවල විවිධ ආදායම් ප්‍රභවයන් කාලානුරූපීව විකාශනය වී ඇත. මුල් කාලයේ වූ හේන් ගොවිතැන, වී වගාව, වන ද්‍රව්‍ය රැස්කිරීම හා කිතුල් කර්මාන්තය වෙනුවට දැන් ඒ ඒ ගම්මානවල අඩු වැඩි වශයෙන් රබර් කිරි කැපීම, කුරුඳු කැපීම, ගම්මිරිස් වගාව, තේ ගස් සිටුවීම, කන්නෙලිය ආශ්‍රිත සංචාරක කර්මාන්තය සහ සංචාරක මාර්ගෝපදේශ ක්‍රියාව ද වර්ධනය වී ඇත.

ක්ෂේත්‍ර




***වගු අංක 02 - නාකියාදෙණිය හා දෙදියගල ආර්ථික ප්‍රභවයන්***

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත ඇසුරෙනි*

රබර් ඉඩම්හි ඉතා කලාතුරකින් කිරි කැපෙන අතර එය ද ඉදිරි කාලවල නතර වනු ඇත්තේ රබර් ගස් දරට විකුණන හෙයිනි. අක්කර 5ක් පමණ ඇති කුරුඳු වගාව දෛනික රැකියාවක් නොවන අතර නියමිත කාලවල දී කුරුඳු ගස් වැවුණු පසුව එකවර අතු කපා අස්වනු නෙළාගනී. වන ද්‍රව්‍ය ලබා ගැනීම, කුලී වැඩ ආදිය මධ්‍යස්ථ ආර්ථික කටයුතු වෙති. සංචාරක මාර්ගෝපදේශකත්වය හා සංචාරක කර්මාන්තය කන්නෙලිය අවට නාකියාදෙණිය ගම්මානයට සීමා වී ඇත. කිතුල් කර්මාන්තය හා කුඹුරු වැඩවල නියැලෙන පිරිස ඊට වඩා බහුල ය. මන්ද ඍජුව කිතුල් මදින්නන්ට අමතරව කිතුල් පැණි එකතුකර හකුරු සාදන, එම ක්‍රියාවලියට ද්විතීයව එකතුවන පවුල් ද බොහෝ ඇත. වී වගා කරන කුඹුරුවල දවස් කුලියට වැඩකරන අය ඇත. ඉහළ ම ආර්ථික කටයුත්ත වන තේ වගාව නාකියාදෙණිය, දෙදියගල පමණක් නොව සෑම කන්නෙලිය මායිම් ගමක ම ප්‍රධාන ආර්ථික කටයුත්ත හා වනාන්තරයට අතිශය අන්තරායකාරී ලෙස පැතිරෙන තර්ජනය වී ඇත.

සංචාරකයන් වැඩි වශයෙන් කන්නෙලියට සංචාරය සඳහා යොමුවීමත් සමග සංචාරක නිවාස නාකියාදෙණිය ගම්මානය අවට නිර්මාණය වී ඇති අතර සිංහරාජය ද මේ ආසන්නව පිහිටා ඇති බැවින් සංචාරක කලාපයක් ලෙස මෙම ප්‍රදේශ සංවර්ධනය කළ හැකි මට්ටමේ පවතී. සංචාරක මාර්ගෝපදේශකයන් ද ගම්මාන අවටින් ම බිහිවී ඇති අතර රැකියා විරහිත තරුණ ප්‍රජාවට තම ජීවන තත්වය උසස් කර ගැනීමට එය මහඟු අත්වැලකි. මේ ආකාරයට කන්නෙලිය

අවට ග්‍රාමීය භූමි පරිභෝජන රටාව නාකියාදෙණිය හා දෙදියගල ගම්මාන පාදක කරගනිමින් පැහැදිලි කළ හැකිය.

**ග්‍රාමීය ජීවනෝපාය ගොඩනැංවීම සඳහා කන්නෙලියෙන් ලැබෙන දායකත්වය**

ඉහත විග්‍රහ කරන ලද ග්‍රාමීය භූමි පරිභෝජන රටාව තුළ ග්‍රාමීය ජීවනෝපාය ගොඩනැංවීමට කන්නෙලියෙන් ලැබෙන දායකත්වය අති මහත් ය. ග්‍රාමීය ජනතාව වන සම්පත ස්වභාවික ප්‍රාග්ධනය බවට පත්කොට සිය ආර්ථික කටයුතු තර කර ගනී. වී වගාවට හා තේ වගාවට අවශ්‍ය කරන ජල සංචිත ගිං ගඟ හා නිල්වලා ගඟෙහි ප්‍රධාන පෝෂක ප්‍රදේශය වශයෙන් කන්නෙලියෙන් ලැබේ. ජල පෝෂක ප්‍රදේශයක් ලෙස එදිනදා කටයුතු හා වගා කටයුතු සඳහා අවශ්‍ය කරන ජල සම්පත නොඅඩුව ගම්වාසීන්ට ලබාදීමට කන්නෙලිය සමත්ය. එහෙයින් මෙම ගම්මාන වනාන්තරයට පින් සිදුවන්නට කිසිදා නියං තත්වයකට මුහුණ පා නැත. වනාන්තරයේ ඇති කිතුල් ගස් කිතුල් කර්මාන්තයට අවශ්‍ය වටපිටාව ස්වභාවයෙන් ම සකසා ඇත. කිතුල් පැණිවලට අමතරව කිතුල් හකුරු නිෂ්පාදනයට ගම්මුන් යොමුවීමත් සමඟ ඒ ආශ්‍රිතව ආදායම් මාර්ග ද සරු වී ඇත. වනාන්තරයෙන් සපයා ගන්නා එනසාල්, වෙනිවැල්, හල්, බෙරලිය, මොර ආදී වනජ ද්‍රව්‍ය වෙළඳපොළට ඉහළ මිලකට අලෙවි කිරීමට ගම්මුන්ට හැකියාව ලැබී ඇත. නීති විරෝධී ලෙස සිදුකරන වල්ලාපට්ටා වෙළඳාමෙන් ද ගම්මුන් ආදායම් උපයා ගනී. කන්නෙලිය ජෛව රක්ෂිතයක් බවට පත් කිරීමත් සමඟ දෙස් විදෙස් සංචාරකයන් වැඩි වශයෙන් වනාන්තරයේ සුන්දරත්වය විඳීමට ගලා එන්නට විය. පාරිසරික සංචාරක කර්මාන්තය මෑත කාලීනව වඩාත් ජනප්‍රිය වී ඇත. කඳු නැඟීම, වනාන්තර තරණය සඳහා සංචාරකයන් වඩාත් ජේවී ඇති හැඩක් අධ්‍යනයේ දී පසක් විය. මෙය කරුණු කොටගෙන කන්නෙලිය වනාන්තරය අවට සංචාරක නිකේතන, හෝටල් රාශියක් බිහි වී ඇත. මේවා පාරිසරික සංචාරක කර්මාන්තයේ යෙදෙන සංචාරකයන්ට සොඳුරු නවාතැන්පොළක් වනවා සේ ම ගම්මුන්ට ද ඉහළ ආදායම් ලබාගැනීමට මහඟු තෝතැන්නකි.

වනාන්තරය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සියළුදෙනා වනාන්තරයට ඇතුළුවීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයක් මිළදී ගැනීම අනිවාර්ය වේ. එමඟින් ද රජයට ප්‍රමාණාත්මක ආදායමක් ලබා ගැනීමට හැකියාව ලැබී ඇත. එපමණක් නොව දෙස් විදෙස් කිසිදු සංචාරකයෙකුට සංචාරක මඟපෙන්වන්නෙක් නොමැතිව වනාන්තරය තුළට පිවිසීමට හැකියාවක් නොමැත. එහෙයින් ග්‍රාමීය ප්‍රදේශයෙන් ම සංචාරක මඟපෙන්වන්නන් මේ සඳහා පුරුදු පුහුණුකොට මානව ප්‍රාග්ධනයක් වශයෙන් යොදවා ඇත. ඒ තුළින් රැකියා විරහිත ග්‍රාමීය තරුණ ප්‍රජාවට රැකියා

අවස්ථාවන් උද්පාදනය වී ඇත. තරුණ ප්‍රජාව පමණක් නොව රැකියා විරහිත වැඩිහිටියන් පවා මේ සඳහා ස්ව කැමැත්තෙන් හා උද්යෝගයෙන් යුතුව සහභාගීවීම භාග්‍යකි. සංචාරක මඟපෙන්වන්නන් අතර මෙම කටයුත්ත ස්වේච්ඡාවෙන් කිසිදු වැටුපක් නොලබා සිදුකරන පිරිස් ද සිටී. කන්නෙලිය වැසි වනාන්තරය පාදක කොටගෙන මානව සම්පත ඵලදායී ලෙස ආර්ථික ක්‍රියාවලියට යෙදවීමට හැකිවීම මහත් භාග්‍යකි.

සොබාදම් මාතාවගේ ජීවනාලිය බඳු කන්නෙලිය වැසි වනාන්තරය ප්‍රදේශවාසීන්ට පිරිසිදු ජලය හා වාතය දායාද කරනවා මෙන්ම සිය ආර්ථිකය තර කරගැනීම සඳහා අවැසි ආර්ථික සම්පත් ද සපයයි. ඉහතින් විග්‍රහ කරන ලද ග්‍රාමීය ජීවනෝපායන් පිරික්සීමේ දී ඒ බැව් මැනවින් පැහැදිලි වේ.

**නිගමනය**

ලෝකයේ සෑම රටක් ම කවර හෝ ස්වභාවික සම්පත් පදනමක් මත ගොඩනැගී ඇත. වනාන්තර ස්වභාවික සම්පත්වල යථා ස්වභාවය ලෙස සැලකිය හැකිය. ඒ අතරින් නිවර්තන වර්ෂා වනාන්තර ජෛව විවිධත්වයෙන් ඉහළ පරිසර පද්ධතියක් ලෙස සැලකිය හැකිය. කන්නෙලිය යනු ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ පිහිටා ඇති නිවර්තන තෙත් කලාපීය වනාන්තරයකි. ශ්‍රී ලංකාවේ විශාලතම වැසි වනාන්තරය වන සිංහරාජ වනාන්තරයටත් වඩා ඉහළ ජෛව විවිධත්වයක් කන්නෙලිය තුළ දැකගත හැකිය. වනාන්තරය අවට ගම්මානවල මානව ක්‍රියාකාරකම් වනාන්තරයත් සමඟින් දක්වන අන්තර් සබඳතාවයන් විශ්ලේෂණය කර, ගම්වාසි ජනතාව තම ජීවනෝපායන් සරිකර ගැනීමට ස්වභාවික සම්පතක් ලෙස කන්නෙලිය වනාන්තරය උපයෝගී කර ගන්නා ආකාරය පිළිබඳව විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යනය තුළ සිදුකර ඇත. ඒ අනුව ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය සවිමත් කිරීමෙහිලා කන්නෙලිය වැසි වනාන්තරය දක්වන දායකත්වය අති මහත්ය. කන්නෙලිය වනාන්තරය හා බැඳී පවතින ග්‍රාමීය ජීවනෝපායන් පිරික්සීමේ දී ඒ බැව් පසක් වේ. සංචාරක කර්මාන්තය, කිතුල් හා හකුරු කර්මාන්තය, වේවැල් කර්මාන්තය, වන ද්‍රව්‍ය එක් රැස්කිරීම හා වෙළදාම උක්ත ග්‍රාමීය ජීවනෝපායන් අතර ප්‍රධාන වේ. තිරසාර සංවර්ධනය කරා යන ගමනේ දී ස්වභාවික සම්පත් නිසි කළමනාකරණයකින් යුක්තව පරිභෝජනය කරනවාත් සමඟ ම අනාගත පරපුර සඳහා රක්ෂා කොට පවත්වා ගැනීම අප සැමගේ යුතුකමකි.

## ආශ්‍රිත ග්‍රන්ථ

Bandarathilake, H.M (2003) Community participation in the management of the Kanneliya, Dediyagala, Nakiyadeniya proposed biosphere reserve, Science foundation Sri Lanka, 31 (1&2) 139-145

Barbier, Edward B. (1987). "The Concept of Sustainable Economic Development." Environmental Conservation.

Conservation of Globally Threatened Species in the Rain Forests of Southwest of Sri Lanka (1999). UNDP/GEF, Colombo.

Kanneliya-Dediyagala-Nakiyadeniya Forest Complex, Conservation Management Plan (1995). IUCN/FD, Colombo.

Barbier, Edward B. (1987). "The Concept of Sustainable Economic Development." Environmental Conservation.

FAO 1998. Forestry Sector Outlook Study. Report of the Food and Agricultural Organization Asia-Pacific Forestry Policy and Planning Division, Bangkok.

Godoy R.A. and Bawa K.S. 1993. The economic value and sustainable harvest of plants and animals from the tropical forest: Assumption, hypotheses, and methods. Econ. Bot. 47: 215–19.

Godoy R.A., Lubowski R. and Markandya A. 1993. A method for the economic valuation of non-timber forest products. Econ. Bot. 47: 220–33.

Gunatilake H.M. 1998. The role of rural development in protecting tropical rainforests: Evidence from Sri Lanka. J. Environ. Manage. 53: 273–92

Mekonnen A. 1998. Rural household fuel production and consumption in Ethiopia: A case study in rural energy and afforestation. PhD dissertation, Department of Economics, Goteborg University, Sweden.

Ministry of Forestry and Environment. 1995. Sri Lanka Forestry Sector Master Plan. Forestry Planning Unit, Ministry of Forestry and Environment, Battaramulla, Sri Lanka.

ධනපාල, ඒ. එච්. (2012) ස්වභාවික සම්පත් කළමනාකරණය සහ තිරසාර සංවර්ධනය. වතවැනි මුද්‍රණය, සරසවි ප්‍රකාශන.

# කොටියාගල, වත්තේගම පුරාණ රජමහා විහාරයේ අස්පර්ශිත සිතුවම් කලාව පිළිබඳ අධ්‍යයනයක්

**ජේ.එම්.ඩී.ඒ.කේ. සෙනරත්[1], ජේ.එම්.අයි.කේ. සෙනරත්[2]**

[1]පශ්චාත් උපාධි අපේක්ෂක, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

[2]උපාධි අපේක්ෂක, මානව හා සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

dinushaamila94@gmail.com

***සංක්ෂේපය***

*බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටි අවධිය දක්වා විහිදෙන්නා වූ විහාර ආරාම නිර්මාණයේ ආරම්භය විවිධ යුග පරාසයන් රැසක් පසුකරමින් වර්තමානය දක්වා විකාශනය වී ඇත. අනුරාධපුර රාජධානිය පිහිටුවීමටත් පෙර සිට ලංකාවේ ජනයා ආගමික කටයුතුවල නිරන්තරයෙන් නියුතු වී සිටි බවට බොහෝ සාධක සෙල්ලිපි ආශ්‍රයෙන් හමුවී ඇත. මේ සමග ම නිර්මාණය වූ විහාර සංකල්පය හා ඒ ආශ්‍රිත අවශේෂ කලා නිර්මාණ කෘති ඉතා සුවිශේෂී ස්ථානයක් හොබවනු ලැබේ. අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කරවීම නිසා දියුණුවට පත් අංශයක් ලෙසට ගෘහ නිර්මාණ හා චිත්‍ර කලාව හැඳින්වීම හැකිය. මෙලෙස නිර්මාණය වූ ගෘහ නිර්මාණ හා චිත්‍ර විවිධ යුග පසු කරමින් විවිධ ප්‍රතිසංස්කරණයන්ට මෙන්ම විවිධ සතුරු උපද්‍රවයන්ට නතු වෙමින් මේ දක්වා විකාශනය වී තිබීම හඳුනාගත හැකිය. මෙම ලිපියෙහි මුඛ්‍ය අරමුණ වන්නේ කොටියාගල, වත්තේගම පුරාණ රජමහා විහාරයේ හඳුනාගත හැකි අස්පර්ශිත උරුම පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීමයි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සාහිත්‍ය මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර භාවිතය මෙන්ම මානව විද්‍යාත්මක මූලාශ්‍ර භාවිත කරනු ලැබේ. විහාර ආශ්‍රිතව නිර්මාණය වූ ගෘහ නිර්මාණ හා චිත්‍ර කලාව මඟින් පිළිබිඹු කරන ශ්‍රී ලාංකීය ජනයාගේ අනන්‍යතාවය අනාගතය උදෙසා රැකගැනීමේ අවශ්‍යතාවය හඳුනාගත හැකිය. වර්තමානයේ බෙහෙවින් කැපීපෙනෙන සඳකඩපහණ, මුරගල, මකර තොරණ, පනේල චිත්‍ර, පිළිම නෙළීමේ කලාව විවිධ ආකාරයෙන් විකාශනය වී තිබේ. බුදු දහම පොදු ජනතාව අතරට රැගෙන යාම පිණිස උපයෝගී කරගත් මෙම කලා නිර්මාණ බුද්ධ චරිතය, බෝසත් චරිත කථා මෙන්ම ශාසන ඉතිහාසය යන අංශ පිළිබඳව පුළුල් අවබෝධයක් පහසුවෙන් ම ලබා දීමට යොදාගෙන ඇත. කලා රසය මෙන්ම ඉපැරණි කලා නිර්මාණ ශිල්පියා සතු දක්ෂතාවය පිළිබිඹු වන්නා වූ සංස්කෘතික අංශ ආරක්ෂා කිරීමත් එම නිර්මාණ අනාගත පරපුර වෙනුවෙන් රැක ගැනීමත් ලෝක ප්‍රජාවන්ගේ වගකීමක් මෙන්ම යුතුකමක් වේ.*

***මුඛ්‍ය පද -** චිත්‍ර කලාව, කලා ශිල්ප, මූර්ති, ගෘහ නිර්මාණ, සංස්කෘතිය*

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ උරුම අධ්‍යයනය කිරීමේ දී සම්භාව්‍ය චිත්‍ර හා මූර්ති පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. පාරම්පරික ශිල්පියා සතුව දක්ෂතාවය හා සංස්කෘතිය කෙරෙහි දැක්වූ සුවිශේෂී ඇල්ම නිර්මාණ අධ්‍යයනය කිරීම තුළින් තහවුරු වේ.

භූගෝල විද්‍යාඥයන් පවසන ආකාරයට අතීතයේ ලංකාව සහ ඉන්දියාව ගොඩබිමින් එකට සම්බන්ධව තිබී ඇත (එපිටවත්ත,2014). මේ බව සනාථ වන්නේ වෘක්ෂලතා, සතුන් හා පරිසරය දෙරටට ම සමාන බැවිණි (Bawa et al,2007). එසේ ම ඉන්දියාවත් ලංකාවත් අතර ඇති පටු මුහුදු තීරය නොගැඹුරුය. මේ හේතුව නිසා දෙරට අතර සමීප සබඳතා පවතින්නට ඇත. එසේ ම ශ්‍රී ලංකාව පෙර අපර දෙදිග මුහුදු මාර්ගයේ සුවිශේෂී ස්ථානයක පිහිටීම ආදී භූගෝල විද්‍යාත්මක සාධක ද ශ්‍රී ලංකාවේ කලා නිර්මාණ විෂයෙහි බලපා තිබේ. මීට අමතරව බුදුන් වහන්සේ තෙවරක් ලංකාවට වැඩම කිරීම, මහින්දාගමනය, විවිධ ආක්‍රමණ ආදි කරුණු රැසක් සෘජු හා වක්‍ර ලෙසට බලපා ඇත.

ලංකාවේ සම්භාව්‍ය චිත්‍ර හා මූර්ති පිළිබඳ සාකච්ඡා කිරීමේ දී එය විවිධ යුගයන් අනුව විකාශනය වෙමින් සංවර්ධනය වී ඇත. එහිදී මෙම චිත්‍ර හා මූර්ති,

- අනුරාධපුර යුගය
- පොළොන්නරු යුගය
- මහනුවර යුගය

ආදී වූ වශයෙන් විවිධ යුග පරාසයන් රැසක් පසු කරමින් වර්තමානය දක්වා විකාශනය වී ඇත (ධර්මබන්දු,2014). මෙහි දී සම්භාව්‍යය චිත්‍ර හා මූර්ති පිළිබඳ සාකච්ඡා කිරීමේ දී මොණරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති කොටියාගල වත්තේගම පුරාණ විහාරය වඩා වැදගත්වනු ඇත. මෙහි ඇති චිත්‍ර හා මූර්ති අධ්‍යයනය තුළින් ඒ සඳහා භාවිත ශිල්පීය ඥාණය, කලාත්මක හැකියාව වැනි අස්පර්ශිත උරුමයන්හි වැදගත්කම අවධාරණය කරගත හැකි වනු ඇත.

## භූගෝලීය පිහිටීම

කොටියාගල වත්තේගම පුරාණ විහාරයෙහි පිහිටීම පිළිබඳ සඳහන් කිරීමේ දී මොණරාගල - අම්පාර ප්‍රධාන මාර්ගය තුල ඇති කොඩයාන හන්දියෙන් හැරී කිලෝමීටර් 15ක් පමණ ඉදිරියට පැමිණීමෙන් පසුව මෙම විහාරය පිහිටා ඇති අතර

අක්ෂාංශ දේශාංශ අනුව මෙහි පිහිටීම $6^{0}47^{'}30.2^{''}N$, $81^{0}30^{'}13.0^{''}E$ ලෙස පෙන්වාදිය හැකිය.




***සිතියම් අංක 01:*** *වත්තේගම පුරාණ විහාරය Google Map ඔස්සේ නිරීක්ෂණය කරන විට දිස්වන ආකාරය (මූලාශ්‍රය - අන්තර්ජාලය ඇසුරෙන් උපුටා ගන්නා ලද්දකි)*

**විහාරස්ථානයේ ඉතිහාසය**

විහාරාධිපති හිමියන් පවසන ආකාරයට මෙම විහාරය ආරම්භ කර ඇත්තේ අනුරාධපුර යුගයේ මුල් කාලයේ දී වන අතර ඉපැරණි විහාරස්ථානයක් වන මෙම ස්ථානයේ ඉපැරණි බව පෙන්වාලන නටබුන් රැසක් තැනින් තැන විසිරී පැවතීම තුළින් ද ඒ බව සනාථ කරගත හැකිය. ඒවා අතර පැරණි යුගයට අයත් සඳකඩපහණක්, මුරගලක් ආදිය ද හඳුනාගත හැකි අතර සඳකඩපහණ අධ්‍යයනයේ දී එය සඳකඩපහණෙහි විකාශනයේ මුල් අදියරේ බව ද වටහාගත හැකිය. එහි අනුරාධපුර යුගයේ මුල් කාලීනව නිර්මාණය වූ සඳකඩපහණෙහි කැටයම් නොමැති අතර රේඛා ත්‍රිත්වයක් පමණක් හඳුනාගත හැකිය. අතර ඒ අනුව කොටියාගල වත්තේගම පුරාණ විහාරය ඉතා පැරණි ඉතිහාසයකට නෑකම් කියන බව නොරහසකි.




***ඡායාරූප අංක 01 :*** *විහාර භූමියේ ඇති ඉපැරණි සඳකඩපහණක්*

*(මූලාශ්‍රය - 13.08.2022 වන දින ක්ෂේත්‍ර අධ්‍යයනය)*

## විහාරස්ථානයේ හඳුනාගත හැකි ඉපැරණි සිතුවම්

විහාරස්ථානයේ විහාර මන්දිරය තුළ හඳුනාගත හැකි සිතුවම් ඉපැරණි ය. එනම්, එම සිතුවම් තුළ හඳුනාගත හැකි ලක්ෂණ අනුව මහනුවර යුගයේ ශෛලියට අයත් සිතුවම් බව සැක මතු වේ. මහනුවර යුගයේ අඳින ලද සිතුවම් එක ම විධි නියමයකට අනුව එක ම ශෛලියකින් අඳින ලද ඒවා වන අතර ඇතැම්විට ප්‍රාදේශීය ශෛලිය හා පුද්ගල ශෛලිය අනුව යම් යම් වෙනස්කම් දක්නට ලැබිය හැකි නමුදු ඒ සියල්ල අභිබවා මෙහි ඉස්මතු වන්නේ මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදාය වේ. මෙම විහාර මන්දිරය ප්‍රධාන ලෙස ඇතුළු මාලය සහ පිටත මාලය වශයෙන් වෙන් වූ කොටස් දෙකකින් සමන්විත ය.




***රූපසටහන් අංක 01:*** *විහාර මන්දිරයේ දළ සැලැස්ම*

*(මූලාශ්‍රය - කතෘ විසින් නිර්මාණය කරන ලද සැලැස්මකි)*

විහාර මන්දිරයේ ඇතුළු කුටියට පිවිසෙන දොරෙහි දර්ශනීය මකර තොරණක් හඳුනාගත හැකිය.






***ඡායාරූප අංක 02:*** *මකර තොරණ* ***ඡායාරූප අංක 03:*** *මකර තොරණ*

*(මූලාශ්‍රය - 13.08.2022 වන දින ක්ෂේත්‍ර අධ්‍යයනය)*

මකර තොරණෙහි ඉහළ දෙපස ද ප්‍රතිමා සයක් නිර්මාණය කර ඇති අතර එම නිර්මාණයන් දේවතා රූපයන් යැයි සිතිය හැකිය. මහනුවර චිත්‍ර තුළ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ චිත්‍රයේ පසුබිම සඳහා රතු වර්ණය යොදා ගැනීමයි. මෙම මකර තොරණ සඳහා ද පසුබිම සඳහා රතු වර්ණය යොදාගෙන ඇති බවට හඳුනාගත හැකි අතර කෙසේ වෙතත් වර්තමානයේ මෙහි වර්ණයන් වියැකී ගොස් ඇති අතර තව දුරටත් වියැකී යමින් පවති.

**සත්සතිය සිතුවම්**

ඇතුළු මාලයේ සත්සතිය නිරූපිත චිත්‍ර පෙළ ඉතාමත් අලංකාරය. එහි බෝරුක නිරූපණය කිරීම සඳහා වැඩි වශයෙන් නිල් පැහැය යොදා ගැනීමට කටයුතු කිරීමට චිත්‍ර ශිල්පියා සමත් වී ඇත. එක් එක් සතිය නිරූපණය කිරීම සඳහා මල් කිහිපයක් යොදාගෙන ඇති අතර එනම්, පහළ රතු පසුබිම තුළ ද ඉහළින් කළු පසුබිම තුළ ද සුදු පැහැති මල් යොදා ගනිමින් එම චිත්‍රයන් වෙන්කර දක්වා ඇත.



***ඡායාරූප අංක 03: සත්සතිය දැකවෙනු ලබන සිතුවමින් කොටසක්***

*(මූලාශ්‍රය: 13.08.2022 වන දින ක්ෂේත්‍ර අධ්‍යයනය)*

සයවෙනි සතිය තුළ දී මුචලින්ද නාග දරණයෙහි ගත කළ අවස්ථාව නිරූපණය කිරීමේ දී මුචලින්ද නා රජු දෙපස පෙණය ඔසවාගෙන සිටින නාගයන් තිදෙනෙකු බැගින් සය දෙනෙකු සිතුවම් කර තිබීම විශේෂයකි. ඒ අනුව එහි නාගයන් සත් දෙනෙකු ම දැකගත හැකිය. එම නාගයන් වර්ණ ගැන්වීම සඳහා ද නිල් සහ සුදු වර්ණය යොදා ගැනීමට චිත්‍ර ශිල්පියා කටයුතු කර ඇත.

එම සත්සතිය තුළ හඳුනාගත හැකි අනෙකුත් විහාරයන් තුළ එතරම් දැකිය නොහැකි විශේෂ ලක්ෂණයක් වශයෙන් එම සත්සතිය එකින් එක් අවස්ථාව නම් කර තිබීම දැක්විය හැකිය. මෙය අනෙකුත් විහාරයන් තුළ සුලභව දැකිය හැකි ලක්ෂණයක් නොවනු ඇත.

**ඇතුලු මාලයේ පහළ තීරුව**

ඇතුළු මාලයේ පහළ ම තීරුවේ මෙම යුගයට අයත් එනම් මහනුවර යුගයට අයත් අන් කිසිදු විහාරයක දක්නට නොලැබෙන චිත්‍ර කිහිපයක් වෙයි. එනම්, ප්‍රදේශයේ ගිහි ප්‍රභූන් සිව් දෙනෙකුගේ සහ පැවිදි තෙරුන් වහන්සේ තිදෙනෙකුගේ රූප ය. ඒවා එකිනෙක නම් කර ඇත. නිදසුනක් වශයෙන්, එක් ප්‍රභූවරයෙකු හඳුන්වා ඇත්තේ,

> ***"බිබිලේ ජයසුන්දර රාජකරුණා නවරත්න පන්ඩිත අත්තනායක මුදියන්සේලාගේ අභය සුන්දර බණ්ඩාර රටේ මහත්මයා"***

ලෙසටය. අනෙක් දෙදෙනාගේ නම් එතරම් පැහැදිලි නොවන අතර කෙසේ වෙතත් ඒ කොරලේ මහත්මයෙකු, විදානේ මහත්මයකු සහ ආරච්චි මහත්මයකු බව පෙනේ. පැවිදි තෙරුන් වහන්සේ තිදෙනා බොල්ගල්ලේ සුමංගල, වත්තේගම සුමන, මුප්පනේ පියදස්සී ලෙස නම් කර ඇත. එම නම් සඳහන් කර ඇත්තේ උෟවහගේ (උන්වහන්සේ) යනුවෙනි.



***ඡායාරූප අංක 04: විහාරය ආරම්භ කිරීමට දායක වූ පුද්ගලයන් ලෙස සිතිය හැකිය***

*(මූලාශ්‍රය - 13.08.2022 වන දින ක්ෂේත්‍ර අධ්‍යයනය)*

කෙසේ වෙතත් මොවුන් මෙම විහාරය ඉදිකිරීමට හා සංවර්ධනය සඳහා කටයුතු කරන ලද පුද්ගලයින් යැයි සිතිය හැක.

**විහාරයේ පිටත මාලය**

විහාරයේ ඇතුළු මාලයේ මෙන් ම පිටත මාලයේ ද සිතුවම් කර ඇති අතර එහි අලංකාර පෙරහැරක් වැනි ලක්ෂණ හඳුනාගත හැක. ඇතුළු මාලයට වඩා පිටත මාලයේ සිතුවම් මැකී ගොස් ඇත. විහාර සංකීර්ණයෙහි වහලය ලී වලින් සිවිලිම් කර තිබෙයි. එම සිවිලිම් තුළ ද විවිධ රටාවන් වැඩි වශයෙන් නිර්මාණය කර තිබී ඇති නමුත් අවාසනාවකට මෙන් වර්තමානයේ දී එම රටාවන් හඳුනාගැනීමට ද අපහසු වන අයුරින් සිතුවම් මැකී ගොස් ඇත.



***ඡායාරූප අංක 05:*** *විහාර මන්දිරයේ සිවිලිම තුළ සිතුවම් කර ඇති සිතුවම්*

*(මූලාශ්‍රය - 13.08.2022 වන දින ක්ෂේත්‍ර අධ්‍යයනය)*

**බුද්ධ ප්‍රතිමා පිළිබඳ තොරතුරු**

**හිඳි පිළිමය**

විහාර මන්දිර තුළට ප්‍රවේශවීමත් සමඟ ඇතුලු මාලය තුළ මෙම හිඳි පිළිමය හඳුනාගත හැකිවනු ඇත. මෙහි ප්‍රතිමා තුළ දැකිය හැකි ලක්ෂණ අනුව ප්‍රධාන ලෙස මහනුවර යුගයෙහි පිළිමයන් හඳුනාගත හැකිය. එනම්, විවෘත ඇස් ඇති සහ මද සිනහවක් සහිත මහනුවර යුගයට අයත් පිළිමයන් තුළ හඳුනාගත හැකි විවිධ ලක්ෂණයන් මෙම කොටියාගල වත්තේගම විහාරය තුළ දී ද හඳුනාගත හැක. ඒ අනුව මෙම පිළිමයන් ද මහනුවර යුගයට අයත් පිළිමයන් ලෙස අනුමාන කළ හැක.

මෙහි හිඳි පිළිමය දෙපස හිටි පිළිමයන් දෙකක් නිර්මාණය කර ඇති අතර ඒවා සැරියුත්, මුගලන් දෙනමගේ පිළිරූ ලෙස සිතීම මඳක් අපහසුය. මක්නිසාද යත්, පිළිම දෙකම කහ වර්ණයෙන් ආලේප කර තිබීම නිසාවෙනි. එමෙන් ම හිඳි පිළිමය ප්‍රධාන ලෙස පද්මාකර ඉරියව්වෙන් යුතුව දෙඅත් සමාධි මුද්‍රාවෙන් යුතුව නිර්මාණය කර ඇත. බදාම සහ ගඩොල් යොදා ගනිමින් නිර්මාණය කර තිබෙන අතර වර්තමානයේ දී එම පිළිමයේ යම් යම් පිළිසකර කිරීම් සිදු කර ඇත. පිළිමයෙහි පිටුපස අලංකාර රැස් වළල්ලක් නිර්මාණය කර ඇති අතර ම භික්ෂූන් වහන්සේලා කිහිප නමක් ද සිතුවම් කර ඇත.



***ඡායාරූප අංක 06:** හිඳි පිළිමය*

*(මූලාශ්‍රය - 13.08.2022 වන දින ක්ෂේත්‍ර අධ්‍යයනය)*

**සාරාංශය**

කොටියාගල වත්තේගම පුරාණ විහාරයෙහි සිතුවම් හා මූර්ති පිළිබඳ සාකච්ඡාවේ දී ප්‍රධාන ලෙස මහනුවර යුගයට අයත් චිත්‍ර සහ මූර්ති හඳුනාගැනීමට හැකි විය. එහි දී විහාරයෙහි සිතුවම් තුළ ප්‍රධාන ලෙස අනෙක් විහාරයන් තුළ හඳුනාගත නොහැකි විශේෂ ලක්ෂණයක් වශයෙන් සිතුවම්කරණයෙහි එම සිතුවම් කුමන අවස්ථාවේ සිතුවමක් ද යන වග හඳුනාගැනීමට සිතුවමට යටින් එම අවස්ථාව සටහන් කර තිබීමයි. තව ද විහාරය නිර්මාණය මෙන්ම සංවර්ධන කටයුතු සඳහා දායක වන ලද පුද්ගලයින් හා භික්ෂූන් සිතුවම් කර තිබීම මෙන් ම එම පුද්ගලයින් සහ භික්ෂූන්ගෙ නම් සටහන් කර තිබීම ද මෙහිලා වඩා වැදගත් වනු ඇත. එය අනෙක් විහාරයන් තුළ දැකිය නොහැකි ලක්ෂණයක් ලෙස ඉස්මතු කළ හැකිය.

එමෙන් ම මූර්ති තුළ දී ඉපැරණි සඳකඩපහණ වැනි දේවල් මෙන්ම පිළිමයන් ද වැදගත් අතර එහි දී හිඳි පිළිමයක් මෙන්ම සැතපෙන පිළිමයක්ද හඳුනාගත හැකි අතර එහි දී එම පිළිමයන් ද මහනුවර යුගය දක්වා දිවයන බව එම ලක්ෂණ අනුව හඳුනාගත හැකි ය.

ඒ අනුව කොටියාගල වත්තේගම පුරාණ රජමහා විහාරය යනු ලංකාවේ පිහිටා ඇති තවත් එක් පුරාණ ඓතිහාසික වටිනාකමක් සහිත විහාරයක් වශයෙන් හඳුන්වාදිය

හැකිවන අතර තවමත් සංරක්ෂණය නොකෙරුණු අස්පර්ෂිත උරුමයක් වශයෙන් ද හඳුනාගත හැකිය. දිනෙන් දින විනාශ මුඛයට ඇද වැටෙන මෙම ඉපැරණි සංස්කෘතික උරුමය රැකගත යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ


Bawa,K.S., Das,A., Krishnaswamy,J.(2007). Western Gharts & Sri Lanka Biodiversity Hotspot:Western Gharts Region. *Ecosystem Profile*

උපරතන හිමි. (2021). වෙල්ලස්සේ අභිමානයඃ ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුව, කොළඹ

එපිටවත්ත, සෙනවි. (2014). භූරූප විද්‍යාවඃ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, කොළඹ

ධර්මබන්දු, එස්. (2014). චිත්‍ර හා මූර්ති කලාවඃ ගුණසේන සහ සමාගම, කොළඹ

සේනාරත්න, පී. එම්. (2001). ශ්‍රී ලංකාවේ සංස්කෘතික දායාදඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

# ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය තුළ ප්‍රදර්ශිත කෞතුක වස්තු සම්බන්ධයෙන් අනුගමනය කර ඇති 'ඉදිරිපත් කිරීම හා අර්ථකථන' ක්‍රියාමාර්ග පිළිබඳ ස්වාධීන අධ්‍යයනයක්

**යූ.ඩී.ආර්. ෂෙහාන් තිලකරත්න**

පර්යේෂණ සහකාර, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

shehanthilakarathna1205@gmail.com

## *සංක්ෂේපය*

*කිසියම් රටක ජීවත්වන ජනතාවගේ ආරම්භය හෝ මුල් පදිංචියේ සිට මෑත කාලය දක්වා සිදුව ඇති වෙනස්වීම් සමුදාය ප්‍රදර්ශිත කැඩපතක් වශයෙන් කෞතුකාගාර හඳුනාගත හැකිය. පෞරාණික භාණ්ඩ එක්රැස් කිරීම, සංරක්ෂණය, ප්‍රදර්ශනය කිරීම, ආරක්ෂා කිරීම වැනි වැදගත් කාර්යයන් රැසක් කෞතුකාගාරයකින් සිදුවේ. කෞතුකාගාරයක් සතු භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ දී 'අර්ථකථනය කිරීම හා ඉදිරිපත් කිරීම' යන සංකල්පය තීරණාත්මකව වැදගත් වේ. මන්ද කෞතුකාගාරයට ලැබෙන ජන ප්‍රසාදය තීරණය කිරීම කෙරෙහි ඒ සම්බන්ධයෙන් අනුගමනය කර තිබෙන ක්‍රියාමාර්ග ඍජුව ම බලපාන බැවිනි. උරුමය අර්ථකථනය හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු උපායමාර්ග පිළිබඳව 2008 ICOMOS ප්‍රඥප්තිය මඟින් ද ෆ්‍රීමන් ටිල්ඩන්, තිමෝති ඇම්බෲස් වැනි අය විසින් ද කරුණු ඉදිරිපත් කර ඇත. ඒවා අවධානයට ගනිමින් ගන්නෝරුව කෘෂි කෞතුකාගාරයේ කෞතුක වස්තු 'අර්ථකථනය කිරීම හා ඉදිරිපත් කිරීම' සම්බන්ධයෙන් අනුගමනය කර තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳව ස්වාධීන නිරීක්ෂණයක් සිදුකිරීම මෙහි අරමුණ විය. ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය තුළ කෘෂි උරුමය 'අර්ථකථනය කිරීම හා ඉදිරිපත් කිරීම' සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේද හා උපායමාර්ග අනුගමනය කර තිබේ ද? යන්න මෙහි අධ්‍යයන ගැටලුව විය. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය යන ක්‍රමවේද භාවිත කළ අතර වගු, රූක් සටහන් සහ ඡායාරූප භාවිතයෙන් තොරතුරු වර්ගීකරණය කොට විශ්ලේෂණාත්මක හා සංසන්දනාත්මක අධ්‍යයනය මඟින් අර්ථකථනයන් සිදුකෙරිණි. 'අර්ථකථනය කිරීම හා ඉදිරිපත් කිරීම' සම්බන්ධයෙන් ICOMOS ප්‍රඥප්තිය තුළ දැක්වෙන මූලධර්මවලට මෙන් ම ෆ්‍රීමන් ටිල්ඩන්, තිමෝති ඇම්බෲස් ඉදිරිපත් කර තිබෙන උපායමාර්ගවලට ද අවධානය යොමුකරමින් ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය තුළ කෞතුක වස්තු නරඹන්නන්ට අර්ථකථනය කොට ඉදිරිපත් කොට තිබේ. එය ප්‍රශස්ත ආකාරයෙන් සිදුකර තිබෙන බවට නිරීක්ෂණය විය. කොළඹ ජාතික කෞතුකාගාරයේ අංක 15 මැදිරිය සමඟ සැසඳීමේ දී තිමෝති ඇම්බෲස් දක්වන ගතික ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය කිරීමේ ක්‍රමවේද මේ තුළ අනුගමනය කර නොතිබීම දුර්වලතාවක් ලෙස හඳුනාගත හැකි වූ අතර මෙම කෞතුකාගාරයේ ඉදිරි සාර්ථකත්වය උදෙසා එම ගතික උපායමාර්ගික ක්‍රමවේද අනුගමනය කිරීම වැදගත් බවට පෙන්වාදිය හැකිය.*

**මුඛ්‍ය පද :** *අර්ථකථන කිරීම, ඉදිරිපත් කිරීම, කෞතුකාගාර, ගන්නෝරුව, නරඹන්නන්*

## හැඳින්වීම

වර්තමාන ලෝකය තුළ 'කෞතුකාගාර' යන්න සුවිශේෂී ආයතනයක් වශයෙන් සැලකෙයි. එය ලොව බොහෝ රටවල මිනිසාගේ දෛනික ජීවිතයට සමීප ආයතනයක් වශයෙන් ද හඳුනාගත හැකිය. ජාත්‍යන්තර කෞතුකාගාර සංගමය මඟින් 'කෞතුකාගාරය' යන්න පහත පරිදි නිර්වචනය කර තිබේ.

*"මිනිසා හා ඔහුගේ පරිසරය පිළිබඳ ද්‍රව්‍යමය සාක්ෂි අත්පත් කරගන්නා වූ, සංරක්ෂණය කරන්නා වූ, පර්යේෂණ පවත්වන්නා වූ හා ප්‍රදර්ශනය කරන්නා වූ ද, මහජනයාගේ අධ්‍යයනය, අධ්‍යාපනය හා සන්තුෂ්ටිය සඳහා විවෘතව පවතින, සමාජයේ සේවයට හා දියුණුවට පවත්වාගෙන යන ලාභ නොලබන ස්ථිර ආයතන කෞතුකාගාර වශයෙන් හැඳින්විය හැකිය."* (ද සිල්වා, 2016).

කෞතුකාගාරයක ප්‍රදර්ශිත කෞතුක වස්තු 'අර්ථකථනය කිරීම හා ඉදිරිපත් කිරීම' සිදුකර ඇති ආකාරය ඉතා වැදගත් වේ. මන්ද අදාළ කෞතුකාගාරයට ලැබෙන ජන ප්‍රසාදය ඒ මත රඳා පවතින බැවිනි. තමන් සතුව පවතින ප්‍රදර්ශක කෞතුක වස්තූන්හි වටිනාකම, ඒවායෙහි අදාළත්වය හා ඒවායේ ඓතිහාසිකත්වය පිළිබඳව නරඹන්නන්ට දැනුමක්, අවබෝධයක් ලබාදීම කෞතුකාගාරයක් පවත්වාගෙන යන්නන්ගේ ප්‍රධාන අරමුණකි. බොහෝවිට නරඹන්නන් කෞතුකාගාරයක හොඳ/නරක තීරණය කරන්නේ එයින් තමන්ට ලබාගත හැකි දැනුම මත පදනම්ව ය. එබැවින් කෞතුකාගරයක දක්ම, මෙහෙවර මෙන් ම නරඹන්නන්ගේ ආකර්ෂණය දිනාගන්නා අයුරින් ස්වකීය කෞතුක වස්තූන් අර්ථකථනය කිරීම සහ ප්‍රදර්ශනයට ඉදිරිපත් කර තිබීම ප්‍රමුඛ විය යුතුය. ඒ අනුව මෙම ලිපිය මඟින් මහනුවර දිස්ත්‍රික්කයේ ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය පිළිබඳව ස්වාධීන නිරීක්ෂණයකින් ලබාගත් තොරතුරු ඉදිරිපත් කර ඇත. නරඹන්නන්ගේ ආකර්ෂණය දිනා ගත හැකි පරිදි එම කෞතුකාගරයේ ප්‍රදර්ශිත කෞතුක වස්තු සම්බන්ධයෙන් අනුගමනය කර තිබෙන 'ඉදිරිපත් කිරීම හා අර්ථකථන' ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ස්වාධීන අධ්‍යයනයක් සිදුකිරීම වත්මන් පර්යේෂණයෙහි අරමුණයි.

## ක්‍රමවේදය

මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය යන ක්‍රමවේද භාවිත කෙරිණි. ඒ අනුව පුස්තකාල අධ්‍යයනය ඔස්සේ සාහිත්‍ය විමර්ශනයට අදාළ තොරතුරු එක්රැස් කරන ලදී. පුස්තකාල පරිහරණය කොට කෞතුකාගාර විද්‍යාව, කෞතුකාගාර වර්ග, කෞතුක වස්තු ප්‍රදර්ශන සහ අර්ථකථන මූලධර්ම සම්බන්ධයෙන් පවතින තොරතුරු විමර්ශනය කරන ලදී. ක්ෂේත්‍ර

අධ්‍යයනය යටතේ මෙහි දී සිදුකරනු ලැබුවේ මහනුවර ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය නිරීක්ෂණයට ලක් කිරීමයි. ඒ අනුව එම කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබෙන කෞතුකවස්තු සම්බන්ධයෙන් අනුගමනය කර තිබෙන 'ඉදිරිපත් කිරීම හා අර්ථකථන' ක්‍රියාමාර්ග පිළිබඳව ස්වාධීන අධ්‍යයනයක් සිදු කරන ලදී. මීට අමතරව කොළඹ ජාතික කෞතුකාගාරයේ උඩු මහලේ දේශීය කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන අංක පහළොව මැදිරිය ද නිරීක්ෂණයට ලක්කොට, මෙම කෞතුකාගාර දෙකෙහි එක ම ප්‍රස්තුතය නරඹන්නන්ට 'ඉදිරිපත් කිරීම හා අර්ථකථනය' සම්බන්ධයෙන් අනුගමනය කර තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳව සසඳන ලදි. වගු, රූක් සටහන් සහ ඡායාරූප භාවිතයෙන් තොරතුරු වර්ගීකරණය කළ අතර විශ්ලේෂණාත්මක හා සංසන්දනාත්මක අධ්‍යයනනය මඟින් අර්ථකථනයන් සිදු කෙරිණි.

**සාකච්ඡාව**

කෞතුකාගාරයක 'ඉදිරිපත් කිරීම් හා අර්ථකථන' කිරීමේ ක්‍රියාමාර්ග විවිධත්වයකින් යුතුව භාවිත කරන්නේ සංස්කෘතික සංචාරකයන් මූලික කොට ගනිමිනි. එහි දී සංස්කෘතික සංචාරකයන් ප්‍රධාන වශයෙන් තිදෙනෙකු හඳුනාගත හැකි බවට M. Bywater (1993) දක්වයි.

1. Culturally Motivated (සංස්කෘතිකමය වශයෙන් අභිප්‍රේරණය වූ)
2. Culturally Inspired (සංස්කෘතිකමය වශයෙන් අවධි වූ)
3. Culturally Attracted (සංස්කෘතිකමය වශයෙන් ආකර්ෂණය වූ)

M. Bywater මෙම වර්ග කිරීම සිදුකර තිබෙන්නේ සංස්කෘතික සංචාරකයන්ගේ හැසිරීම පදනම් කොට ගෙන ය. මෙයින් පළමු පිරිස උරුමය සම්බන්ධයෙන් ඉතා සංවේදී අය වේ. ප්‍රතිශතයක් ලෙස ගත්විට මෙම කාණ්ඩයට අයත් සංචාරකයන් සීමිතය. රටකට ආර්ථිකමය වශයෙන් මෙවැනි සංචාරකයන්ගේ පැමිණීම ඉතා වැදගත් වන අතර සංස්කෘතික ක්ෂේත්‍රවලට මොවුන් ගෙන් සිදුවන අහිතකර බලපෑම් ඉතා අවම ය. ඉහත දැක්වූ දෙවන කාණ්ඩයට අයත් සංචාරකයෝ පළමු කාණ්ඩයට සාපේක්ෂව උරුමයන් කෙරෙහි සංවේදී බවින් අඩු අය වෙති. ප්‍රමාණාත්මක බවින් ද පළමු පිරිසට වඩා වැඩි ය. මොවුන් ගෙන් වැඩි බලපෑමක් ඇත්තේ ජනප්‍රිය සංස්කෘතික ක්ෂේත්‍රවලට ය. ලොව වැඩි ම සංචාරකයන් පිරිසක් අයත් වන්නේ ඉහත දක්වා ඇති තෙවන කාණ්ඩයටයි. මොවුහු උරුමයට ඉතා අඩු සංවේදී බවක් දක්වති. සාමූහිකව සංචාරයේ යෙදෙන අතර අධ්‍යාපනයට වඩා විනෝදය අරමුණු කර ගෙන සංචාරය කරති. මහජන කෞතුකාගාරයක් තුළ

කෞතුකවස්තු 'ඉදිරිපත් කිරීම හා අර්ථකථනය' කිරීමේ දී මෙම කාණ්ඩ ත්‍රිත්වයට ම අයත් සංචාරකයන්ව සෑහීමකට පත්කළ යුතුය. එමනිසා කෞතුකවස්තු 'ඉදිරිපත් කිරීම හා අර්ථකථනය' කිරීමේ දී එක් කාණ්ඩයකට අයත් සංචාරකයන්ව පමණක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාමාර්ග අනුගමනය කරනවාට වඩා ඉහත දැක්වූ සංස්කෘතික සංචාරක කාණ්ඩ ත්‍රිත්වයට ම අයත් සංචාරකයන්ව ඉලක්ක කරමින් සමබරව කෞතුකවස්තු 'ඉදිරිපත් කිරීම හා අර්ථකථනය' කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. කෙසේ නමුත් ඇතැම් විෂයීය කෞතුකාගාර මේ තත්ත්වයෙන් වෙනස්ව ඉහත එක් සංස්කෘතික සංචාරක කාණ්ඩයක් පමණක් ඉලක්ක කර ගනිමින් පවත්වා ගෙන යන ආකාරය ද හඳුනාගත හැකිය. වත්මන් අධ්‍යයනයට පදනම්ව ඇත්තේ ද එවැනි කෞතුකාගාරයකි.


කෞතුක භාණ්ඩ විධිමත් ලෙස ප්‍රදර්ශනය කිරීම කෞතුකාගාරයක වැදගත් කාර්යයකි. කෞතුකාගාර විද්‍යාවට අනුව කෞතුකාගාරයක ඉතාම වැදගත් මෙන්ම අර්ථවත් කාර්යය වන්නේ ප්‍රදර්ශන අවස්ථාවයි (ජයවර්ධන, 2018). වර්ෂ 1962 දී ජාත්‍යන්තර කෞතුකාගාර සංවිධානය කෞතුකාගාර වර්ගීකරණයට අදාළව කරුණු දීර්ඝව සාකච්ඡා කොට කෞතුකාගාර වර්ග හතක් හඳුනාගෙන තිබේ. කලා, ඉතිහාස හා පුරාවිද්‍යා, මානවවංශ විද්‍යා, ස්වභාවික ඉතිහාසය, විද්‍යා හා තාක්ෂණික, ප්‍රාදේශීය කෞතුකාගාර, විෂයීය කෞතුකාගාර යනුවෙනි (ජයවර්ධන, 2018). වත්මන් අධ්‍යයනයට පාදක වන ගන්නෝරුව කෞතුකාගාරය අයත් වන්නේ මෙයින් අවසන් වර්ගය වන විෂයීය කෞතුකාගාර වර්ගයට ය. ගන්නෝරුව කෞතුකාගාරය කෘෂි කෞතුකාගාරයකි. එමඟින් මෙරට සාම්ප්‍රදායික කෘෂිකාර්මාන්තයට අදාළ දැනුම ඉදිරිපත් කෙරේ.

2004 වර්ෂයේ දී ගන්නෝරුව කෘෂිකර්ම සංකීර්ණය ගන්නෝරුව කෘෂි තාක්ෂණ උද්‍යානය ලෙස පරිවර්තනය කරන ලදී. 2016 වර්ෂයේ දී ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC) බිහි විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ සිට ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය යටතේ ගන්නෝරුව කෘෂි තාක්ෂණික උද්‍යානය වෙනම ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන්නට විය. මෙය මෙරට කෘෂි තාක්ෂණ උද්‍යාන සහ කෘෂිකර්ම ප්‍රදර්ශන කළමනාකරණය සඳහා වගකීම් දරණ ආයතනය ලෙස ක්‍රියාත්මක වෙයි. ගන්නොරුව ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයට (NAICC) සම්බන්ධ ආයතන ගණනාවක් තිබේ. ආදර්ශ ගෙවත්ත, බිම්මල් ඒකකය, පටක රෝපණ ඒකකය, පළිබෝධ සහ රෝග ඒකක, පැළෑටි නිරෝධායන ඒකකය ආදිය ඊට නිදසුන් කිහිපයකි. ගන්නොරුව කෘෂි කෞතුකාගාරය අයත් වන්නේ ද මේ යටතට ය. මෙම කෘෂි කෞතුකාගාරය පිහිටා තිබෙන්නේ ගන්නෝරුව කෘෂි

උද්‍යානය ඉදිරිපිට ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය අසල ය.

වත්මන් අධ්‍යයනයෙහි අධ්‍යයන ක්ෂේත්‍රය වූ මෙම ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන සංස්කෘතික සංචාරක කාණ්ඩය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ඉහත දැක්වූ සංස්කෘතික සංචාරක කාණ්ඩ ත්‍රිත්වය අතුරින් පළමු කාණ්ඩයට අයත් සංචාරකයන් මෙය නැරඹීමට පැමිණෙන බවට නිරීක්ෂණය විය. ඉහත දෙවන කාණ්ඩයට අයත් සංචාරකයන්ගේ නැරඹීමට ලක්වීමට තරම් මෙම කෞතුකාගාරය ප්‍රසිද්ධ වූවක් නොවේ. තෙවන කාණ්ඩයට අයත් සංචාරකයන් අධ්‍යාපනයට වඩා විනෝදය අරමුණු කර ගත් පිරිසක් බැවින් ඔවුන්ගේ නැරඹීමට ද මෙම කෞතුකාගාරය හසුනොවන බවට නිගමනය කළ හැකිය. මන්ද මෙම කෘෂි කෞතුකාගාරය තුළ අධ්‍යාපනික දැනුමක් ලබා දීමට මිස විනෝදාස්වාදය සඳහා කිසිඳු 'ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය' කිරීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොමැති බැවිනි. එබැවින් ශ්‍රී ලාංකේය පැරණි කෘෂි තාක්ෂණය පිළිබඳව අධ්‍යයනය කිරීමට උනන්දුවක් දක්වන ඉහත පළමු කාණ්ඩයට අයත් උරුමය කෙරෙහි ඉතා සංවේදී සංචාරකයන්ගේ නැරඹීමට ලක්වන කෞතුකාගාරයක් වශයෙන් ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය වත්මන් පර්යේෂණය මඟින් හඳුන්වාදිය හැකිය. මෙය මෙම කෞතුකාගාරයේ 'දැක්ම' මඟින් ද තහවුරු වේ. "පවුලේ පෝෂණය හා ආහාර සුරක්ෂිතභාවය රැක, වීදියේ ගනුදෙනුව අවම කරමින් පවුලේ ආර්ථිකය ක්‍රමානුකූලව ශක්තිමත් කරයි" යන්න මෙම කාෂි කෞතුකාගාරයේ 'දැක්ම' විය. ඒ අනුව එහි අරමුණ වී තිබෙන්නේ ගන්නෝරුව කෘෂි පර්යේෂණායතනයේ 'දැක්ම' සමඟ ඒකාබද්ධ වෙමින් කෘෂි හා ආහාර සුරක්ෂිතභාවය, අතීත කෘෂිකාර්මික තාක්ෂණය හා ලාංකේය කෘෂි උරුමය පිළිබඳ අවබෝධයක් ස්වකීය නරඹන්නන්ට ලබා දීමයි. මොවුන්ගේ එම දැක්ම අනුව ද දේශීය කෘෂිකර්මාන්තය පිළිබඳ සංවේදීතාවක් හා උනන්දුවක් පවතින සංචාරකයන්ගේ නැරඹීමට පමණක් මෙය බඳුන් වන බවට පෙන්වාදිය හැකිය.

උරුමය සංචාරකයන්ට ඉදිරිපත් කිරීමේ දී එය අයත් සංස්කෘතියට ගැළපෙන ලෙස ඉදිරිපත් කළ යුතුය. උරුමය සම්බන්ධ ඉදිරිපත් කිරීමක් සිදුකිරීමේ දී පහත සන්දර්භය වැදගත් වේ.




මෙම සන්දර්භය ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය තුළ සැලකිල්ලට ගෙන තිබේ. එහි දී ඔවුන් දේශීය කෘෂිකර්මාන්තය පිළිබඳ සංවේදී ස්වකීය නරඹන්නන්ව තෘප්තිමත් කිරීමට විවිධ ක්‍රමවේද අනුගමනය කරමින් තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට කටයුතු යොදා තිබෙනු නිරීක්ෂණය විය.

ස්මාරක හා ස්ථාන සඳහා වූ අන්තර්ජාතික කවුන්සිලය (ICOMOS) මඟින් 'ඉදිරිපත් කිරීම හා අර්ථකථනය (2008)' සම්බන්ධයෙන් ප්‍රඥප්තියක් නිර්මාණය කොට ඉදිරිපත් කර තිබේ. එම ප්‍රඥප්තිය තුළ 'ඉදිරිපත් කිරීම හා අර්ථකථනය කිරීම' යන්න නිර්වචනය කර ඇත. ඊට අනුව අර්ථකථනය කිරීම යනු මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීමට සහ සංස්කෘතික උරුමයන් පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමට යොදාගනු ලබන ක්‍රියාදාමයන් ය. ඉදිරිපත් කිරීමක් ලෙස එම ප්‍රඥප්තිය තුළ හඳුන්වා තිබෙන්නේ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා තොරතුරු ප්‍රවේශම් සහගතව අර්ථකථනාත්මක ක්‍රමවේදයන් ඔස්සේ සංවිධානාත්මකව සන්නිවේදනය කිරීමක් ලෙස ය (The ICOMOS Charter, 2008, p. 4). 2008 ICOMOS ප්‍රඥප්තියට අනුව අර්ථකථනය කිරීමක් හා ඉදිරිපත් කිරීමක් ප්‍රධාන මූලධර්ම හතක් අනුව සිදුවිය යුතුය. ඒවා නම්,

1. ප්‍රවේශය සහ අවබෝධය (Access and understanding)
2. තොරතුරු මූලාශ්‍රයයෝ (Information Sources)
3. සැකසීම සහ සන්දර්භය කෙරෙහි අවධානය යොමු කිරීම (Attention to setting and context)
4. තථ්‍යතාව සුරැකීම (Preservation of Authenticity)
5. තිරසාරත්වය සඳහා සැලසුම් (Planning for Sustainability)

6. ඇතුළත් කිරීම සඳහා සැලකිලිමත් වීම (Concern for Inclusiveness)
7. පර්යේෂණ, පුහුණුව සහ ඇගයීමේ වැදගත්කම (Importance of Research, Training and Evaluation) (The ICOMOS Charter, 2008, p. 5)

මෙම මූලධර්ම හත ගන්නොරුව කෞතුකාගාරය තුළ අනුගමනය කර තිබෙන ආකාරය පිළිබඳව අධ්‍යයනය කෙරුණි. ප්‍රවේශ සහ අවබෝධය උරුම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ. කෞතුකාගාරයක දී අදාළ කෞතුක වස්තුව අර්ථකථනය සහ ඉදිරිපත් කිරීමේ දී එය නරඹන්නාට පැහැදිලි අවබෝධයක් ලැබෙන ආකාරයට සිදුකළ යුතුය. එමෙන්ම කෞතුක භාණ්ඩ විස්තර කිරීමට යොදාගන්නා සියලුම ලේබල පහසුවෙන් කියවා තේරුම්ගත හැකි වචන යොදා සකස් කළ යුතුය (ද සිල්වා, 2016). මෙම පළමු මූලධර්මය කෙරෙහි ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය දැඩි අවධානයක් යොමුකර තිබෙනු නිරීක්ෂණය විය. ඔවුන් ස්වකීය නරඹන්නන්ට දේශීය කෘෂිකර්මාන්තය පිළිබඳ උපරිම දැනුමක් හා අවබෝධයක් ලබා දීමට කටයුතු කර ඇත. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යය ත්‍රිත්වයෙන් ම කෞතුක භාණ්ඩ සරලව විස්තර කොට ලේබල ප්‍රදර්ශිතය. ජනවාර්ගික භේදයකින් තොරව කෘෂි උරුමය පිළිබඳව උනන්දු වන අයෙකුට ප්‍රවේශතාවක් හා අවබෝධයක් ලබාදීමට ගන්නෝරුව කෘෂි කෞතුකාගාර නිලධාරීන් කටයුතු කර තිබෙන බව එයින් පැහැදිලි වේ.

තොරතුරු හැකිතාක් විවිධ මූලාශ්‍රයවලින් ගෙන නව්‍යතාවයකින් ඉදිරිපත් කිරීම වැදගත් වේ. එනම්, යාවත්කාලීන වූ දැනුමක් ඉදිරිපත් කළ යුතු බවට ඉහත ප්‍රඥප්තියේ දෙවන මූලධර්මයෙන් කියැවේ. ඊට ගරුකරමින් ගන්නෝරුව කෞතුකාගාරය තුළ දේශීය කෘෂි කර්මාන්තය, කමත් භාෂාව, කෘෂි උපකරණ ආදිය පිළිබඳ තොරතුරු යාවත්කාලීන ක්‍රමෝපායන් උපයෝගී කර ගෙන ඉදිරිපත් කොට තිබේ. වී බිස්ස, කුරක්කන් බිස්ස, පිදුරු බිස්ස, පිදුරු පන්දලම, ඉඟුරු කොටුව ආදී අපේ පැරණි කෘෂිකාර්මික ඉදිකිරීම්වල ආකෘති කෞතුකාගාර ප්‍රවේශය ආශ්‍රිතව එළිමහන් නැරඹුම් මධ්‍යස්ථානයක ස්වරූපයෙන් ඉදිකර තිබීම, නරඹන්නන්ට විස්තර ඉදිරිපත් කිරීමට දේශීය කෘෂිකර්මාන්තය පිළිබඳව මෙන් ම නූතන කෘෂි තාක්ෂණික දියුණුව පිළිබඳව දැනුම්වත් බවක් ඇති කෞතුකාගාර නිලධාරිනියක යොදවා තිබීම මෙම දෙවන මූලධර්මය ගරු කිරීමට අදාළ නිදසුන් වේ.

තෙවන මූලධර්මය වන්නේ සැකසීම සහ සන්දර්භය කෙරෙහි අවධානය යොමු කිරීමයි. මෙහි දී ගති ලක්ෂණ අවබෝධයකින් ඉදිරිපත් කළ යුතුය. ගන්නෝරුව කෞතුකාගාරය තුළ අංශ කිහිපයකට බෙදා ගොඩනැගිල්ල මනා ලෙස සැලසුම්

කොට කෞතුක වස්තු ප්‍රදර්ශනය කොට තිබේ. ඒ අනුව දෙමහල් ගොඩනැගිල්ලේ පහත මහලේ ගොවිතැන් කිරීමට භාවිත කෘෂි උපකරණ ද ඉහළ මහලේ වී වර්ග, වී මැනීමේ දී භාවිත උපකරණ සහ මුළුතැන්ගේ උපකරණ අදිය ප්‍රදර්ශනය කොට ඇත.

කෞතුක වස්තු ප්‍රදර්ශනය කිරීමේ දී තත්‍යතාවය වැදගත් වේ. සෑම කෞතුක භාණ්ඩයක්ම සත්‍ය, ත්‍රිධාවිස්තෘත භාණ්ඩයක් වන අතර එම භාණ්ඩ ඉතා වැදගත් දෘශ්‍ය අධ්‍යාපන ආධාරක වශයෙන් අද පිළිගැනේ (ද සිල්වා, 2016). ගන්නෝරුව කෞතුකාගාරය තුළ ද මෙම මූලධර්මයට ගරුකරමින් ප්‍රදර්ශිත කෘෂි උපකරණ, කෘෂි බීජ ආදිය තත්‍යතාවයෙන් යුක්තව ඉදිරිපත් කර තිබේ. ඒ අනුව මෙම කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන සිසුන්ට එම භාණ්ඩ අධ්‍යාපන ආධාරක වශයෙන් වැදගත් වේ.

තිරසාරත්වය කෞතුකාගාරයක් සම්බන්ධයෙන් ඉතා වැදගත් ය. ක්ෂේත්‍රයෙහි භෞතික, පාරිසරික, සංස්කෘතික පැවැත්ම කෙරෙහි මෙහි දී සැලකිලිමත් විය යුතුය. සැමවිටම ක්ෂේත්‍රයේ, එය භාවිත ප්‍රජාවගේ, එයින් ප්‍රතිලාභ ලබන්නන්ගේ, අනුග්‍රහකයන්ගේ යහපැවැත්ම පිළිබඳව කල්පනාකාරී විය යුතුය. ගන්නෝරුව කෞතුකාගාරය තුළ ද ප්‍රවේශ ආශ්‍රිතව පාවහන් ගළවා ඇතුළු වීමට උපදෙස් ලබා දීමෙන් සහ කෞතුකවස්තු ඇල්ලීමෙන් වළකින ලෙසට උපදෙස් ලබා දී මෙන් මේ පිළිබඳව අවධානය යොමු කර තිබේ. ප්‍රධාන භාෂා ත්‍රිත්වයෙන් ම කෞතුකාගාරය නැරඹීමට සම්බන්ධ උපදෙස් පුවරු ප්‍රදර්ශනය කර තිබේ.

ගන්නෝරුව කෞතුකාගාරය සම්බන්ධයෙන් 'ඇතුළත් කිරීම සඳහා සැලකිලිමත් වීම' නමැති හයවැනි මූලධර්මය වැදගත් වන්නේ මෙයට පැමිණෙන්නේ හුදෙක් දේශීය කෘෂිකර්මාන්තය පිළිබඳ උනන්දුවක් සහිත නරඹන්නන් වන බැවිනි. ඔවුන් Bywater නමැත්තා ඉදිරිපත් කර තිබෙන සංස්කෘතික සංචාරක කාණ්ඩ ත්‍රිත්වයෙන් පළමු කාණ්ඩයට අයත් පිරිස ය. මොවුන් උරුමය පිළිබඳව ඉතා සංවේදී අය වේ. එනිසා ප්‍රවේශ වීමේ දී ම දේශීය කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් චිත්තාකාර්ශනයක් ඇති වන පරිදි වී බිස්ස, කුරක්කන් බිස්ස, පිදුරු බිස්ස, පිදුරු පන්දලම, ඉඟුරු කොටුව ආදී අපේ පැරණි කෘෂිකාර්මික ඉදිකිරීම්වල ආකෘති කෞතුකාගාර ප්‍රවේශය ආශ්‍රිතව එළිමහන් නැරඹුම් මධ්‍යස්ථානයක ස්වරූපයෙන් ඉදිකර තිබේ. එය ලාංකේය පැරණි කෘෂි සමාජ පිළිබඳ චිත්තරූප මවා ගැනීමට මහඟු පිටිවහලකි.

ගන්නෝරුව කෞතුකාගාරය නැරඹීම මගින් පැරණි කෘෂි තාක්ෂණය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නවා සේ ම නූතන කෘෂි කර්මාන්තයේ දියුණුව, නූතන කෘෂි

තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් ද මේ ආසන්නයේ ම පිහිටා ඇති ගන්නොරුව කෘෂි පර්යේෂණ ආයතනයට ගොස් ලබා ගැනීමේ හැකියාව ගන්නෝරුව කෞතුකාගාරය නරඹන්නන්ට තිබේ. එය ඉහත දක්වූ ප්‍රඥප්තියෙහි හත්වන මූලධර්මය අනුගමනය කිරීමකි. නූතන කෘෂි තාක්ෂණය මඟින් නිෂ්පාදිත බෝග වර්ග අළෙවි සැලෙන් මිළ දී ගෙන යාමට අවස්ථාව උදා වේ.

ෆ්‍රීමන් ටිල්ඩන් (Freeman Tilden) පුරාවිද්‍යාව තුළ අර්ථකථනයේ පියා වශයෙන් සැලකෙයි. ඔහු වර්ෂ 1957 දී "Heritage Interpretation" (උරුම අර්ථ නිරූපණය) යනුවෙන් කෘතියක් ප්‍රකාශයට පත්කොට උරුමයක් ඉදිරිපත් කිරීමේ දී මුල් කරගත යුතු මූලධර්ම 6ක් දක්වා ඇත. ඒ අතුරින් ඔහු දක්වන වැදගත් මූලධර්මයක් වන්නේ 'ඉදිරිපත් කිරීමක් සියලු වයස් කාණ්ඩවලට ගැළපෙන ආකාරයෙන් සිදුකළ යුතුය' යන්නයි. ඒ අනුව බාල, තරුණ, මහලු ආදී ඕනෑම වයස් කාණ්ඩයකට අයත් නරඹන්නෙකුට ගැළපෙන ලෙස ඉදිරිපත් කිරීම සිදුකළ යුතුය. මෙම මූලධර්මය ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය තුළ ද අනුගමනය කර ඇත. බාල, තරුණ, මහලු යන සැම වයස් කාණ්ඩයකම නරඹන්නන් මෙම කෞතුකාගාරයට පැමිණේ. විශේෂයෙන් ම ලංකාවේ විවිධ ප්‍රදේශවල පාසල්වලින් ගන්නොරුව කෘෂි පර්යේෂණ ආයතනය නැරඹීමට පැමිණෙන අතර ඔවුන් මෙම කෞතුකාගාරය නැරඹීමට ද සම්බන්ධ වේ. එහි දී පාසල් සිසුන්ට ද පැරණි කෘෂි සමාජය පිළිබඳ උනන්දුවක් ඇති වන ආකාරයෙන් ආකර්ෂණීයව උපරිම දැනුමක් ලැබෙන පරිදි කෞතුක වස්තු ප්‍රදර්ශනය කර තිබීම මෙම කෞතුකාගාරයට වැදගත් වේ. ඒ අනුව මෙහි විවිධ ආකෘති, සිතුවම් හා ඡායාරූප යොදාගෙන තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත. එමඟින් ඕනෑම වයස් කාණ්ඩයක අයෙකුට පහසුවෙන් ප්‍රකාශිත ප්‍රස්තුතය අවබෝධ කර ගැනීමේ හැකියාව ලැබේ. දියහොල්මන, වී බිසි, පැරණි ස්වරූපයේ මුළුතැන්ගෙය ආදිය ඉදිරිපත් කර තිබෙන ආකාරය මෙයට නිදසුන් වේ.

අර්ථකථනයන් කිරීමේ දී අනුගමනය කළ යුතු බවට ෆ්‍රීමන් ටිල්ඩන් අවධාරණය කරන වැදගත් මූලධර්මයක් වන්නේ "The chief aim of Interpretation is not instruction, but provocation" යන්නයි. මෙයින් ඔහු අදහස් කරන්නේ අර්ථකථනයෙහි අරමුණ වන්නේ කෙනෙකුට උපදෙස් දීම නොවේ යන්නය. ඉදිරිපත් කිරීමකින් නරඹන්නාව ඇවිස්සීමකට, පෙළඹවීමකට ලක්කළ යුතුය. මෙය ඉතා හොඳින් ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය අනුගමනය කර තිබේ. ප්‍රවේශ වීමේ දී ම දේශීය කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් චිත්තාකර්ශනයක් ඇති වන පරිදි වී බිස්ස, කුරක්කන් බිස්ස, පිදුරු බිස්ස, පිදුරු පන්දලම, ඉඟුරු කොටුව ආදී

අපේ පැරණි කෘෂිකාර්මික ඉදිකිරීම්වල ආකෘති කෞතුකාගාර ප්‍රවේශය ආශ්‍රිතව එළිමහන් නැරඹුම් මධ්‍යස්ථානයක ස්වරූපයෙන් ඉදිකර තිබීමෙන් එය දකින අයව මෙය නැරඹීම කෙරෙහි පෙළඹවීමක් ඇති කරවයි.

"Interpretation should aim to present a whole rather than a part, and must address itself to the whole man rather than any phase" යන්න ටිල්ඩන් අවධාරණය කරන වැදගත් උපායමාර්ගයකි. මෙහි දී සැමවිට ම අතීතයේ සිට වර්තමානය දක්වා පවතින සම්බන්ධතාවය ඉදිරිපත් කිරීම කෙරෙහි සැලකිලිමත් විය යුතුය. මෙම උපායමාර්ගය සැලකිල්ලට ගනිමින් ගන්නොරුව කෘෂි කෞතුකාගාරය තුළ ද අතීතයේ සිට වර්තමානය දක්වා ම භාවිත කෘෂි උපකරණ සහ කෘෂි තාක්ෂණය වටහාගත හැකි පරිදි ආකෘති, සිතුවම්, ඡායාරූප ආදී සම්ප්‍රේෂණ මාධ්‍ය භාවිතයෙන් ඒවා පිළිබඳව ඉදිරිපත් කිරීම් සිදුකර තිබේ. මේවා ඇසුරින් මෙරට කෘෂිකර්මාන්තය සාම්ප්‍රදායික මට්ටමේ සිට අද දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳව වටහාගත හැකිය.

තිමෝති ඇම්බෲස් (Timothy Ambrusse) විසින් ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය කිරීමේ උපාය මාර්ග ක්‍රමවේද ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වයි.

1. ස්ථිතික ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය කිරීමේ ක්‍රමඃ විෂය මූලික ඉදිරිපත් කිරීම් (Objective Presentation), ආකෘති (Models), සිතුවම් (Drawings), ඡායාරූප (Photos), සන්ධාන කුටි/ඩයොරාම (Diorama)
2. ගතික ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය කිරීමේ ක්‍රමඃ ශබ්ද මාර්ගෝපදේශ (Sound Guides), චිත්‍රපටි සහ වීඩියෝ දර්ශන (Films, Video and slides), ක්‍රියාකාරී ආකෘති (Working Models), අන්තර් ක්‍රියාකාරී ඉදිරිපත් කිරීම් (Interactive Presentations), දේශන සහ පුද්ගලික මාර්ගෝපදේශන (Lectures and Personal guides).

තිමෝති ඇම්බෲස් දක්වූ ඉහත උපායමාර්ග ක්‍රමවේද දෙවර්ගය අතුරින් ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය තුළ අනුගමනය කර තිබෙන්නේ ස්ථිතික ලැයිස්තුවේ දක්වෙන උපායමාර්ග පමණි. කෘෂිකර්මාන්තය විෂය කරගත් මෙම කෞතුකාගාරය තුළ කෘෂිකර්මාන්තයේ දී භාවිත උපකරණ සැබෑ ලෙසින් ම ප්‍රදර්ශනයට තබා තිබුණි. වැව ආශ්‍රිත වගා රටාව නිරූපිත ආකෘතිය, හේන් පැලක ආකෘතිය, පැරණි මුළුතැන්ගෙයක ආකෘතිය, ගවයන් යොදා සීසාන ආකෘතිය ආදී ආකෘති (Models) රැසක් ම මෙහි ප්‍රදර්ශිතය. ගවයන් යොදා ගෙන සීසාන ආකාරය, කුඹුරේ නියර

බඳින හා මඩ පෙරළන ආකාරය, කරක් ගෙඩිය භාවිතයෙන් මසුන් අල්ලන ආකාරය ආදිය දැක්වෙන සිතුවම් සහ ඡායාරූප ද මෙහි ඉදිරිපත් කිරීමේ සහ අර්ථකථනය කිරීමේ උපායමාර්ග ලෙස යොදා ගෙන ඇත. නරඹන්නන්ට කමත් භාෂාව පිළිබඳව, ගන්නෝරුව කෘෂි පර්යේෂණ ආයතනය පිළිබඳව තොරතුරු ඇතුළත් අත්පත්‍රිකා කිහිපයක්ම මෙම කෞතුකාගාරය මඟින් ලබා දෙයි. එය නරඹන්නාට පැරණි කෘෂිකර්මාන්තය පිළිබඳව තවදුරටත් උනන්දුවීමට උත්තේජනයකි.

**නිගමන හා නිර්දේශ**

ගන්නොරුව කෘෂි කෞතුකාගරය නැරඹීමට පැමිණෙන්නේ හුදෙක් මෙරට සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය පිළිබඳව උනන්දුවක් දක්වන පිරිස් ය. ඒ අනුව එම පිරිස M. Bywater (1993) ඉදිරිපත් කරන සංස්කෘතික සංචාරක කාණ්ඩ තුනෙන් උරුමය පිළිබඳ ඉතා සංවේදී Culturally Motivated (සංස්කෘතිකමය වශයෙන් අභිප්‍රේරණය වූ) නමැති පළමු කාණ්ඩයට අයත් පිරිසක් බවට පෙන්වාදිය හැකිය. ගන්නෝරුව කෘෂි කෞතුකාගාරය, විෂයීය කෞතුකාගාර වර්ගයට අයත් කෞතුකාගාරයකි. ඒ තුළ කෞතුකවස්තු 'ඉදිරිපත් කිරීම හා අර්ථකථන' ක්‍රියාමාර්ග ස්වකීය විෂයට හා දැක්මට ගැළපෙන අයුරින් ප්‍රශස්තව අනුගමනය කර තිබෙන බවට නිරීක්ෂණය විය. කොළඹ ජාතික කෞතුකාගාරයේ උඩු මහලේ ඇති දේශීය කෘෂිකර්මාන්තයට සම්බන්ධ අංක 15 මැදිරියේ කෞතුකවස්තු 'ඉදිරිපත් කිරීම හා අර්ථකථන' ක්‍රියාමාර්ග සමඟ සැසඳීමේ දී ඒ හා සමානව ම මෙම කෞතුකාගාරයෙහි ද එකී ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. තිමෝති ඇම්බෲස් දක්වන ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය කිරීමේ උපායමාර්ග දෙවර්ගය ම කොළඹ ජාතික කෞතුකාගාරයේ අංක 15 මැදිරියේ කෞතුකවස්තු 'ඉදිරිපත් කිරීම හා අර්ථකථන' කිරීමට යොදා ගෙන ඇති නමුත් ගන්නෝරුව කෞතුකාගාරය තුළ යොදා ගෙන තිබෙන්නේ ස්ථිතික ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය කිරීමේ උපායමාර්ග පමණි. ගන්නොරුව කෞතුකාගාරය සම්බන්ධයෙන් සිදුකළ වත්මන් අධ්‍යයනය මඟින් හඳුනාගත් දුර්වලතාවයක් ලෙසට තිමෝති ඇම්බෲස් දක්වා ඇති ගතික ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය කිරීමේ ක්‍රමවේද ගන්නෝරුව කෞතුකාගාරය තුළ යොදා නොගැනීම පෙන්වාදිය හැකිය. මෙහි දී කොළඹ ජාතික කෞතුකාගාරයේ අංක 15 මැදිරියෙහි අපේ පැරැණ්නන්, කුඹුරුවල වගා හානි කිරීමට එන පක්ෂීන්, මීයන් වැනි කුඩා සතුන්ව එළවීමට නිර්මාණය කරන 'දියහොල්මන' නමින් හඳුන්වන උපකරණය සජීවීව ක්‍රියාකරන ආකාරයෙන් නරඹන්නාට ඉදිරිපත් කර තිබේ. එය තිමෝති ඇම්බෲස්ගේ ගතික ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය කිරීමේ ක්‍රමවේද යටතේ එන ක්‍රියාකාරී ආකෘති (Working Models)

යොදා ගැනීමකි. ගන්නෝරුව කෞතුකාගාරය තුළ ද ඒ ආකාරයට තිමෝති ඇම්බෲස්ගේ ගතික ඉදිරිපත් කිරීමේ හා අර්ථකථනය කිරීමේ ක්‍රමවේද යටතේ එන ශබ්ද මාර්ගෝපදේශ (Sound Guides), චිත්‍රපටි සහ වීඩියෝ දර්ශන (Films, Video and slides), ක්‍රියාකාරී ආකෘති (Working Models), අන්තර් ක්‍රියාකාරී ඉදිරිපත් කිරීම් (Interactive Presentations), දේශන සහ පුද්ගලික මාර්ගෝපදේශන (Lectures and Personal guides) යන ක්‍රමවේද අනුගමන කිරීම මඟින් ස්වකීය නරඹන්නන්ට පිරිපුන් අවබෝධයක් මෙන්ම වින්දනීය අත්දැකීමක් ලබා දීමට හැකිවනු ඇත.

**ස්තුතිය**

කෞතුකාගාරයක දී නරඹන්නන් වෙනුවෙන් උරුමය 'ඉදිරිපත් කිරීම හා අර්ථකථනය' කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව කියාදෙමින් ගන්නෝරුව කෘෂි කෞතුකාගාරයේ අනුගමනය කර ඇති 'ඉදිරිපත් කිරීම හා අර්ථකථන' ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මා යොමුකළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අරුණ රාජපක්ෂ මාගේ ගුරුතුමාට, ගන්නෝරුව කෘෂි තාක්ෂණ උද්‍යානයේ ප්‍රධානීන්ට, ගන්නෝරුව කෘෂි කෞතුකාගාරයේ ප්‍රධානීන්ට, එම කෞතුකාගාරය පිළිබඳව විස්තර කිරීමට එහි සිටි නිධාරීතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ද සිල්වා, පී.එච්.ඩී.එච්. (2016). **කෞතුකාගාර විද්‍යා මූලධර්ම**. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයවර්ධන, සරත්චන්ද්‍ර. (2018). **ඉතිහාසය ඉගෙනීමට සහ ඉගැන්වීමට කෞතුකාගාර උපයෝගීකරණය**. සරසවි ප්‍රකාශකයෝ.

**The ICOMOS Charter for the Interpetation and Presentation of Cultural Heritage Sites**. (2008). Canada.

# කාලය හා අවකාශය තුළ මහනුවර නගරයේ ආරම්භය හා එහි විකාශනය පිළිබඳව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්


**එස්.ඒ. ප්‍රසන්න**

විද්‍යාපති (උපාධි අපේක්ෂක),

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය.

prasasakbo@gmail.com



***සංක්ෂේපය***

*වර්ෂ 1988 දී යුනෙස්කෝ (UNESCO) ලෝක උරුම සම්මුතිය මගින් සංස්කෘතික ලෝක උරුමයක් ලෙසින් ප්‍රකාශයට පත්කරන ලද සෙංකඩගල නුවර නොහොත් මහනුවර නගරයේ ඉතිහාසය පිළිබඳව විමසීමේ දී පෙනීයන්නේ එය ඉතා දීර්ඝ කාලයක සිට ක්‍රමයෙන් වර්ධනය වී ඇති බවයි. මෙම නගරයේ ආරම්භය පිළිබඳව විවිධ ආකාරයේ ජනප්‍රවාද රාශියක් ඇතිමුත් විද්වතුන් තුළ මේ කරුණු අරභයා පොදු එකඟතාවයක් ඇති බවක් නොපෙනේ. ඒ අනුව දැනට ඇති ඓතිහාසික කරුණු, ජනප්‍රවාද, සිතියම් හා පිඹුරු, එමෙන් ම ඉතිරිව ඇති පුරාවිද්‍යාත්මක ස්මාරක ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් මහනුවර නගරයේ බිහිවීම හා එහි විකාශනය පිළිබඳව ප්‍රමාණාත්මක අධ්‍යනයක් සිදුකිරීම මෙහි මූලික අරමුණයි. ඒ අනුව කාලය හා අවකාශය තුළ මහනුවර නගරයේ වර්ධනය කෙසේ සිදුවී ද? යන්න මෙහි මූලික පර්යේෂණ ගැටළුව ලෙසින් දැක්විය හැකිය. එසේම මෙහි පර්යේෂණ ක්‍රමවේදය පශ්චාත් ප්‍රත්‍යක්ෂ මූලවාදී විධි ක්‍රම අනුව සිදුකෙරී ඇති අතර එහි දී ගුණාත්මක දත්ත කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන ලදී. ඒ අනුව දත්ත රැස්කිරීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා හා පුස්තකාල අධ්‍යයනයන් මූලික වශයෙන් සිදුකරන ලදී. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ජනාවාස ලෙසින් පැවති මෙම භූ කලාපය ගම්පොළ රාජධානි සමයේ දී නගරයක් ලෙසින් ක්‍රමයෙන් වර්ධනය හා විකාශනය වීම සිදුව ඇත. එහි දී රජු හා දෙවියන් මූලික වුණු සැලසුමක් අනුව සිදුවී ඇති බව හඳුනාගත හැකිය. මහනුවර රාජධානී සමයේ දී එහි අග නගරය ලෙසින් මෙහි උපරිම අවස්ථාවට පත්වී ඇති අතර නගර සංවර්ධනයේ දී එහි ආරක්ෂාව කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා ඇති බව හඳුනාගත හැකිය. නමුත් විවිධ අවස්ථාවන්හි දී මෙම නගරය දෙස් විදෙස් ආක්‍රමණිකයන් විසින් විනාශකර ඇති අතර එම කාලයන් තුළ එහි පාලකයින් විසින් යළි ගොඩනැගීම ද මෙහි ඇති සුවිශේෂී ලක්ෂණයක් ලෙසින් පෙන්වාදිය හැකිය. එසේ ම බ්‍රිතාන්‍යන් විසින් මහනුවර බලය අල්ලාගෙන සිටි කාලයේ පැවති ඓතිහාසික භූ දර්ශනය වර්තමානය වන විට සැලකිය යුතු මට්ටමකින් ආරක්ෂා වී ඇති ආකාරය ද මේ තුළින් හඳුනාගත හැකිය.*



**මුඛ්‍ය පද -** *නගර සැලසුම, මහනුවර රාජධානිය, ඓතිහාසික භූ දර්ශනය , සිතියම්, ස්මාරක*

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ජනප්‍රවාදයන්ට අනුව ඈත අතීතයේ දී කඳු රටට අයත් මෙම කලාපය අසුරයින්ගේ පාලනයට අයත්ව තිබී ඇති අතර මහාබලි නම් රජු විසින් මෙහි නගරයක් කරවා පාලන කටයුතු සිදුකර ඇති බවට සැලකේ. එම නිසා මෙම නගරය මහාබලි නුවර යනුවෙන් එම කාලයේ දී හඳුන්වා ඇත. ඒ වටා වූ ගංගාව මහබලි ගංගාව ලෙසින් හැඳින්වූ අතර පසුකාලයේ දී මෙම නගරය මහවැලි නුවර ලෙසින් ද ගංගාව මහවැලි ගංගාව ලෙසින් ද භාවිතයේ දී පත්ව ඇත. ඉන්පසු මෙම වදන් කාලය සමඟ භාවිතයේ දී පහසුව සඳහා මහවැලි නුවර යන්නේ **"වැලි"** යන කොටස ලොප් වී, මහනුවර ලෙසින් භාවිතාකර ඇති බවට සැලකේ (ප්‍රේමසිරි,සුනන්දා:2015.59). ඉන් අනතුරුව අඛණ්ඩව පෙර විසූ ආදී කාලීන යක්ෂ හා රාක්ෂ ගෝත්‍රික ජනයා විසින් ජය භූමියක් ලෙසින් සලකමින්, ඔවුන්ගේ විවිධ ආගමික උත්සවයන් සඳහා භාවිතයට ගත් ස්ථානයක් ලෙසින් මෙම නගරය වැදගත්කමක් උසුලා ඇත. එයට නිදසුන් ලෙස මහනුවර අවට පෙදෙස් ආශ්‍රිතව පසු කාලීනව ඇති වී ඇති යාතු කර්ම හා නර්තන ශිල්පීන් (යක්දෙස්සන්) විසින් සිදුකරනු ලබන විවිධ නර්තන ක්‍රම හා වලියක් මංගල්‍යය, විදියක් මංගල්‍යය, පිටියක් මංගල්‍යය හා කොහොඹායක් මංගල්‍යය වැනි සුවිශේෂී ශාන්ති කර්මයන් පෙන්වා දිය හැකිය. විශේෂයෙන් ම කොහොඹා කංකාරියේ එන පුරාවෘතයන් අනුව මෙම ශාන්තිකර්මය සෙංකඩගල ඇසුරු කරගනිමින් ඇති වී ඇති බවට පිළිගැනෙන අතර කොහොඹා දෙවි තුන් කට්ටුව යනු සෙංකඩගල අවට ප්‍රදේශයෙහි විසූ ප්‍රභූ පුද්ගලයන් බවට ද සැළකේ. (සේනානායක:2007.04). ඒ අනුව මෙම ජනප්‍රවාද හා විශ්වාසයන් අනුව පෙනී යන්නේ මෙම භූමිය පුරාණ හෙළදිව්වාසී ජනයා විසින් සුවිශේෂී භූමියක් ලෙසින් සලකා ඇති බවයි. එසේ ම දැනට සිදුකෙරී ඇති පුරාවිද්‍යාත්මක පර්යේෂණ මඟින් ද මහනුවර අවට පෙදෙස් ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට අතීත මානවයින් විසූ බවට කරුණු අනාවරණය වී ඇත.

නමුත් සාහිත්‍ය මූලාශ්‍ර තුළ මුල් ම කාලයේ දී මෙම නගරය මහනුවර ලෙසින් දක්වා නොමැති අතර එහි 'කටුපුළු නගරය' ලෙසින් සඳහන් කර ඇත. මෙම නාමය ඇතිවීම පිළිබඳව ද විමසීමේ දී පෙනීයන්නේ අනුරාධපුර රාජධානි අවදියේ දී මෙය **"කණ්ඩක පේථක"** නමින් හඳුන්වා ඇති බවයි. මෙම කණ්ඩක පේථක නාමය පොළොන්නරු යුගයේ දී එහි විසූ සොළීන් විසින් කාට්ටු පලෙකෛ යන දමිළ බසින් හඳුන්වා ඇති අතර එම කාට්ටු පලෙකෛ නාමය පසු කාලීනව යලි සිංහල හුරුවට පෙරලීමෙන් "කටුපුළුව" ලෙස භාවිතයට ගෙන ඇති බවට සැලකේ (ගුණතිලක:1998.01). ඒ අනුව මෙම කටුපුළුව යන වචනයේ සිංහල අර්ථය වන්නේ කැලෑව මැද පිහිටි ජනාවාසය යන්නයි. එහි දී මෙම ජනාවාසය තුළට ඇතුල්වීමට


හා පිටවීමට කපොලු හෙවත් ද්වාර තිබී ඇති අතර එම කපොලු කටු පැළැලි මඟින් ආරක්ෂා කිරීම සිදුකෙරී ඇත. එම දොරටු විවෘත කිරීම හා වසා දැමීම රාජකාරී ලෙසින් සිදුකළ මිනිසුන් ඒ වෙනුවෙන් ම යොදවා සිටි අතර ඔවුන් පසු කාලීනව කටුපුල්ලේවරු ලෙසින් ද මහනුවර රාජධානියේ ප්‍රකට වී ඇත. නමුත් ඇතැම් තැනක දැක්වෙන්නේ කැලණිතිස්ස රජුගේ මළණුවන් වූ උත්තිය කුමරු කැලණි රාජධානියෙන් පලා විත් බුලුගස්වලින් පිරි මෙම නගරය ඇතිකර එහි ආරක්ෂාවට කටුපැළලිවලින් වට කළ නිසා කණ්ඩක සේල ලෙසින් හඳුන්වා පසුව කටුපුළුව නගරය බවට පත්වූ බවයි (ප්‍රේමසිරි,සුනන්දාඃ2015.59). කෙසේ හෝ පසු කාලීනව එනම්, ක්‍රිස්තු වර්ෂ නවවැනි සියවසේ දී පමණ ඇති වූ මහායාන බලපෑම නිසා මෙම කටුපුළුව නගරය **"ශ්‍රීවාස පුරය"** ලෙසින් ප්‍රචලිතව ඇත. එයට හේතු වී ඇත්තේ අවලෝකිතේශ්වර නාථ දෙවියන් හා ඔහුගේ බිරිඳ වූ තාරා දෙවඟනගේ භූමියක් ලෙසින් මෙම නගරය සැලකීමයි. ශ්‍රී ලාංකේය මහායාන බැතිමතුන්ට ප්‍රධාන රාජධානිය වූ අනුරාධපුරය තුළ දී ථෙරවාදී සම්ප්‍රදායෙන් ඇති වූ විවිධ බාධා හා හිරිහැර කිරීම් නිසා සිය ආගමික මධ්‍යස්ථානයන් අග නගරයෙන් වඩා ඈත වූ මහනුවර වැනි පෙදෙස් කරා ගෙන ඒමට සිදුවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙම නගරය නාථ දෙවියන් හා තාරා දේවිය වෙනුවෙන් කැපකර ඇති බවට සැලකේ. ඒ අනුව මෙහි අවලෝකිතේශ්වර නාථ දෙවියන් වෙනුවෙන් දේවාලයක් ඉදිකර ඇති අතර මෙම නාථ දේවාලය වැඳපුදා ගැනීම පිණිස දොළොස්වන සියවසේ දී පමණ පොළොන්නරුවේ රාජ්‍ය කළ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව.1187-1196) මෙහි පැමිණි බවට ද තොරතුරු ජනප්‍රවාද මඟින් හඳුනාගත හැකිය (ප්‍රේමසිරි,සුනන්දාඃ2015.64). එසේ ම ඔහු විසින් පිහිට වූ ශිලා ලේඛනයක කොටස් පසු කාලීනව මහනුවර නගරය ආශ්‍රිතව සොයාගෙන ඇති මුත් එහි අදහස අපැහැදිලිය. නමුත් ඉන් තහවුරුවන සුවිශේෂී කරුණක් වන්නේ පොළොන්නරු යුගය වන විට ද මෙම පෙදෙස ශිලා ලේඛනයක් පිහිටුවීමට තරම් වැදගත්කමකින් යුත් පෙදෙසක් වී ඇති ආකාරයයි.

ඉන්පසු දාහතර වැනි සියවස පමණ වන විට මෙම ශ්‍රිවාස පුරය යන්න කටුපුළු දනව්වේ සෙංකඩගල නුවර ශ්‍රී වර්ධනපුර යනුවෙන් ව්‍යවහාරයට පත්ව ඇත. මෙහි සෙංකඩගල නාමය ඇති වීමට හේතුව යාපනයේ ආර්ය චක්‍රවර්තී විසින් ගම්පොළ රාජධානිය වෙත ආක්‍රමණය කිරීමට සැරසුණු මොහොතේ ශ්‍රීවාස පුරයේ පාලන කටයුතු භාරව සිටි නිශ්ශංක අලකේශ්වර ඇමැතියා විසින් ඔහු පරාජයට පත්කිරීමේ ක්‍රියාවලිය යි. ඒ අනුව නාථ දෙවියන් විසින් ඔහුට සිහිනෙන් දුන් උපදෙස් මත සතුරු සේනා බණ්ඩනය කර ඇති අතර ඉන් පසු එම ස්ථානය සෙංකඩගල යනුවෙන් ජනප්‍රිය වූ බවට පිළිගැනේ. නමුත් අස්ගිරි තල්පත පෙන්වා දෙන්නේ එය

කුරුණෑගල හතරවන පරාක්‍රමබාහු රජු විසින් සිය බෑණනුවන් වූ සිරිවර්ධන නම් සේනාධිකාරී යටතේ නගරයක් දක්වා සංවර්ධනය කර ක්‍රි.ව.1312 දී කටුපුළු දනවුවේ සෙංකඩගල පැවති පැරණි ගම් දනවු සියල්ල සෙංකඩගල ශ්‍රී ජයවර්ධන පුර නමින් නම් කළ කථා පුවතයි. පසු කාලීනව ක්‍රි.ව.1360 දී තුන්වන වික්‍රමබාහුගේ අම්පිටිය ශිලා ලේඛනයෙන් ද ක්‍රි.ව.1380 දී පස්වන බුවනෙකභාහු පිහිට වූ සගම ශිලා ලේඛනයෙන් ද මෙම සෙංකඩගල යන නාමය හඳුනාගත හැකිය. එහි සෙංකඩගලපුර, සෙංකඩගල සුරිඳු යන පදයන් දැකිය හැකි අතර ඒ පිළිබඳව සෙනරත් පරණවිතාන පෙන්වා දෙන්නේ අම්පිටිය හා ඒ අවට පෙදෙස් සෙංකඩගල දෙවියන් වෙනුවෙන් කැපකර ඇති බවයි (රෝහණධීරඃ1998.24,25). එසේම මෙම සෙංකඩගල නාමය ඇතිවීම පිළිබඳව ක්‍රිස්තු වර්ෂ 1800 දී පමණ රචිත යැයි සැලකෙන අස්ගිරි විහාර ප්‍රකරණ කථා නැමති පුස්කොළ පොතෙහි ද සඳහන්ව ඇත. ඒ අනුව වර්තමාන උඩවත්ත කැළය ආශ්‍රිතව ඇති රාම ගුහාව ඇසුරුකර ගනිමින් සෙංකන්ඩ නම් තවුසෙක් වාසයකර ඇති අතර ඔහු විසින් මෙම භූමිය ජය භූමියක් ලෙස පෙන්වා දී ඇත. ඒ අනුව පසුකාලයේ දී එහි නගරය ඉදිකළ අතර ඔහුගේ නමින් සෙංකඩගල යනුවෙන් නගරය හැඳින්වූ බවට සැලකේ. එසේ ම තවත් ජනප්‍රවාදයක සඳහන් වන්නේ ගම්පොළ රජ කළ වික්‍රමබාහු රජු ගේ මෙහෙසියක් වූ සෙඞ්ඛණ්ඩා නම් කුමරියගේ නමින් සෙඞ්ඛණ්ඩ ශෛලාභිධාන පුරවරය ලෙසින් මෙම නගරය නම් කළ බවයි. මැය පණ්ඩිත පරාක්‍රමබාහුගේ දියණියක් වන අතර ඇය ආදාහනය කළ ස්ථානය වර්තමානයේ ද ආදාහනා මළුව ලෙසින් සැලකේ. එසේම පසු කාලීනව මෙම දේවිය හෙණකඳ බිසෝබණ්ඩාර දේවිය නමින් දේවත්වයට නගා මහනුවර අවට පෙදෙස්වල වැඳුම් පිදුම් සිදුකරන ආකාරයක් ද හඳුනාගත හැකිය (කරුණාතිලක,1955ඃ04). ඉහත සඳහන් කළ ජනප්‍රවාද, මූලාශ්‍රගත සාධක හා පුරාවිද්‍යාත්මක දත්ත දෙස සැලකීමේ දී මහනුවර නගරය හා බැඳි ප්‍රාග් ඓතිහාසික ආගමික විශ්වාස හා ඇදහිලි මෙන්ම පසු කාලීනව වර්ධනය වූ නාථ දේව ඇදහිල්ල අතර ඇති මතවාදයන් පහසුවෙන් බැහැර කළ නොහැකිය. විශේෂයෙන් ම නගරක් ලෙසින් සැළසුම් කෙරෙන මුල්කාල සීමාවේදී ම මහායානික බලපෑමට මෙම නගරය ලක් වී ඇත. විශේෂයෙන් ම මහායාන ඉගැන්වීම් අනුව භූමියේ උස් ම පෙදෙස මහාමෙරුව ලෙස සලකා ඊට පහළ පෙදෙස මහායානික මණ්ඩල යන්ත්‍රය ලෙසින් ගෙන නගරය සැලසුම්කර ඇති බවට ද මතයක් පවතී (ගුණතිලකඃ1998.14). ඒ අනුව නගරයේ උස් ම පෙදෙසට වන්නට නාථ දේවාලය ඉදිකර ඇති බව පෙනීයයි. එය මහාමෙරුව ලෙස සලකා ඊට පහළ පෙදෙස නගරයේ අනෙකුත් අවශ්‍යතා සඳහා යොදාගෙන ඇත. එහි දී වීදී සැලසුම් කිරීම ක්‍රමවත්ව මෙන් ම කිසියම් ආකෘතියක් අනුව ගොඩනගා ඇති ආකාරයක් වර්තමානයේ වුව ද හඳුනාගත හැකි අතර මහායානිකයන් එම යන්ත්‍රය යසස,

ජයග්‍රහණය මෙන්ම ජීවිත ආරක්ෂාව සැලසෙන ශක්ති ජනකයක් සේ සලකා ඇත. කෙසේ නමුදු මහනුවර නගරයේ විකාශනය පිළිබඳව අධ්‍යයනයේ දී පුරාවිද්‍යාත්මක සාධක ලෙසින් ගැනිය හැකි පැරණි ම සාධකය වන්නේ නාථ දේවාලයට සම්බන්ධ ගොඩනැගිල්ලයි. මෙහි වාස්තුවිද්‍යාත්මක ශෛලිය 14වැනි සියවසට අයත් ගඩලාදෙණි විහාරයේ මෙන් විජයනගර ගෘහ නිර්මාණාත්මක ශෛලියට ඉතාමත් සමීප අයුරින් ඉදිකර ඇති බවට සැලකේ (ප්‍රේමතිලකඃ1991.13). දැනට තහවුරු කෙරී ඇති සාධක අනුව ගම්පොළ රාජධානි සමයේ උප නගරයක් ලෙසින් පැවති සමයේ මෙම දේවාලය තුන්වන වික්‍රමබාහු රජ විසින් ඉදිකළ බවට සැලකේ. නමුත් අවධානය යොමුකළ යුතු කරුණක් වන්නේ පොළොන්නරු යුගයේ පටන් ම දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශෛලියේ ආභාෂය ශ්‍රී ලංකාවට ලැබී තිබීම හා පොළොන්නරු පාලකයින් මෙම නගරය හා තිබූ සම්බන්ධතා කෙරෙහිය. එසේම අස්ගිරි තල්පතට අනුව ක්‍රිඃවඃ 1312 දී පමණ කුරුණෑගල රජ කළ හතරවන පරාක්‍රමබාහු රජු විසින් සෙංකඩගල නුවරට නැගෙනහිර දෙසින් උඩවාසල වත්තේ වැට කඩ ද දකුණු දෙසින් කිතුල් ගොල්ලේ ඇල්ල හා බහිරව කන්ද ද, බටහිරින් නියඟගල ද උතුරින් මහායායේ ඇළ ද යන සතර මායිම් කඩයිම් කොට අස්ගිරි විහාරය කරවා එයට ගම් බිම් ප්‍රධානයන් සිදුකොට ඇති බව දක්වා ඇත (රෝහණධීරඃ1998.18). මෙම නගරයේ අනෙක් ප්‍රධාන ආගමික මධ්‍යස්ථානය වූ මල්වතු විහාරය නොහොත් පුප්ඵාරාමය ද වික්‍රමබාහු රජ විසින් ආරම්භ කරන්නට ඇතැයි සාමන්‍යයෙන් සැලකේ. ඒ අනුව මෙම ආරාම සංකීර්ණ දෙක ඉතා ඈත අතීතයේ පටන් ම මහනුවර නගරයේ ප්‍රධාන ආගමික සංස්ථාව ලෙසින් ක්‍රියාත්මකව ඇති ආකාරය හඳුනාගත හැකිය. කෙසේ නමුදු මහනුවර නගරයේ ඓතිහාසික භූ දර්ශනය ප්‍රතිනිර්මාණය කර ගැනීමේ දී මෙවැනි මුල් කාල පරාසයන්ට අයත් සාධක ඉතා සුළු ප්‍රමාණයක් හඳුනාගත හැකිමුත් ප්‍රමාණවත් තරම් වෙනත් තොරතුරු හා සාධක නොමැති තරම් ය. නමුත් දහසයවැනි සියවසේ පටන් විදේශීය පුද්ගලයන්ගේ විවිධ වාර්තා මඟින් මහනුවර නගරය පිළිබඳව වැඩිමනත් තොරතුරු සපයාගත හැකිය. එසේම විවිධ කාල පරාසයන් තුළ ඔවුන් විසින් අඳින ලද සිතියම් හා රූ සටහන් පෙළ ගැස්සීමෙන් ද මහනුවර නගරයේ විකාශනය පිළිබඳව යම් පැහැදිලි අදහසක් අපට සපයාගත හැකිය. මේ සඳහා දැනට ඇති පැරණිත ම සිතියමක් ලෙසින් ක්‍රි.ව.1602 දී Ambassador Spilberge නැමැත්තා විසින් අඳින ලද සිතියම දැකවිය හැකිය. මොහු පෘතුගීසි සොල්දාදුවෙක් වූ අතර, එය ශ්‍රී ලංකා දිවයිනේ අග නගරය හා බලකොටුවේ පිඹුර (Plan of the Town & port of Kandy capital of the Island of Ceylon) ලෙසින් ඔහු විසින් නම්කර ඇත (ගුණතිලකඃ1998.34). නමුත් පරිමාණයකට ඇද නොමැති මෙය ප්‍රාථමික සිතියමක් වුව ද දහසයවැනි සියවසේ පැවති මහනුවර නගරයේ අවකාශීය සැලැස්ම පිළිබඳව යම් අදහසක් ඒ මඟින් අපට

ඇතිකර ගත හැකිය. එහි මාළිගා හා විහාර ගොඩනැගිලි උස් තාප්පයකින් වට කොට දක්වා ඇත. එම විශේෂ ගොඩනැගිලි නැගෙනහිරට වන්නට පිහිටුවා ඇති අතර සෙසු නිවාස හා වෙළඳසැල් ආදිය බටහිර දිශාවට වන්නට දක්වා ඇත. සාහිත්‍ය මූලාශ්‍ර අනුව ද නගරය වටා මුල්වරට ප්‍රාකාර ගොඩනැගීම විමලධර්මසූරිය රජු විසින් සිදුකර ඇති බවට සැළකේ.




***සිතියම් අංක 01*** *- ක්‍රිස්තු වර්ෂ 1602 දී මහනුවර නගරය දැක්වෙන Spilberge ගේ සිතියම මූලාශ්‍රය - Conservation and Development Plan - CCF (1999)*

මෙම සිතියම අනුව මාළිගය හා ආගමික ස්ථාන තවත් බැම්මකින් කොටස් දෙකක් ලෙස වෙන්කර පැවති බවට හඳුනාගත හැකිය. එහි එකක රජුගේ මාළිගය හා දළදා මැඳුර ද අනෙක විහාර හා දේවාල සඳහා ද වෙන්කර ඇත. ඒ අනුව මාළිගය අවට කලාපය ආරක්ෂිත බැම් දෙකකින් වටකර තිබූ බව පෙනීයයි. මොහුගේ සිතියමේ නාථ දේවාලය දක්වා ඇත්තේ එහි කුඩා කොටුව තුළය. ඉන් අඩසිය වසකට පසු මෙහි පත්තිනි දේවාලය ඉදිකෙරී ඇති අතර නාථ දේවාලය අසල දේවතා බණ්ඩාර දෙවියන් වෙනුවෙන් වෙන් කළ කුඩා දේවාලයක් ද මේ කාලයේ දී පැවතී ඇත. මෙම සිතියමේ පසු කාලීන සිතියම් තුළ දැකිය හැකි බෝගම්බර වැව හා වීදි දැකිය නොහැකිය. එසේ ම මෙහි බලකොටුව ලෙසින් නම්කර ඇත්තේ නාථ, පත්තිනි ආදී දේවාල ද වටකොට ඇති අටළු සහිත මහා ප්‍රාකාරයයි. මෙම පැරණි සිතියම තුළ මාළිගා සංකීර්ණයන් ලෙස පෙන්වා දී ඇත්තේ විමලධර්මසූරිය රජු විසින් ඉදිකළ මාළිගය ලෙස සැලකුව ද මෙම ස්ථානයේ නිශ්ශංකමල්ල රජුගේ විවේකය සඳහා ඉදිකළ මාළිගයක් පොළොන්නරු යුගයේ පටන් පැවති බවට සැලකේ. එසේ ම මෙම ස්ථානයේ ගම්පල තුන්වන වික්‍රමබාහු රජුගේ මාළිගයත්, සේනාසම්මත

වික්‍රමබාහු රජුගේ මාළිගයත් ගොඩනඟා පැවති බවට සැලකේ. නමුත් මේ අසළ පළමුවරට ගබඩා ගර්භ සහිත දෙමහල් මැදුරක් කරවා දළදා වහන්සේ තැන්පත් කරවීම විමලධර්මසූරිය රජ දවස සිදුවී ඇත. මෙම නගරය ක්‍රිඃව 1594 දී පෘතුගීසි ආක්‍රමණිකයින් විසින් සම්පූර්ණයෙන් විනාශකර දවා අළුකර ඇති අතර, විමලධර්මසූරිය රජු විසින් එය නැවත ගොඩනැඟීමට සමත්ව ඇත. එසේ ම එම නගරය යලි ක්‍රි.ව.1610 දී සෙනරත් රජ දවස ඇති වූ තවත් පෘතුගීසි ආක්‍රමණයකින් සම්පූර්ණයෙන් විනාශයට පත්කර ඇති අතර එවර ද සෙනරත් රජු විසින් යළි නගරයක් ලෙසින් පිළිසකර කර ඇත. ඉන් පසු දෙවන රාජසිංහ රජු සමයේ මහනුවර නගරය සංවර්ධනය වීම තවත් සීඝ්‍රයෙන් සිදු ව ඇති අතර මෙම කාලයේ මහනුවර නගරය පිළිබඳව සැලකිය යුතු විස්තරයක් රොබට් නොක්ස්ගේ වාර්තා මඟින් හඳුනාගත හැකිය (ජයවර්ධනඃ2007.127) . ඒ අනුව මෙහි එක් කන්දක සිට අනෙක් කන්ද දක්වා මිටියාවත හරහා බඳින ලද පවුරු ප්‍රාකාර තිබී ඇති බව පෙනීයයි. එහි උස පිළිබඳව සමානතාවයක් දැකිය නොහැකි වුව ද උස ම තැන අඩි විස්සක් පමණ වෙතැයි සැලකේ. එසේ ම නගරයට යොමුවී ඇති සෑම මාර්ගයක ම නගර ද්වාරයට සැතපුම් තුනක් හෝ සතරක් ඇතින් මුරකාවලුන්ගේ නිත්‍ය රැකවරණ සහිත මුර ගෙවල් පිහිටුවා ඇත (කරුණාරත්නඃ2012.58). පසුකාලීනව ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සමයේ ද මහනුවර නගරයේ සිදුකෙරූ වැඩි දියුණු කිරීම් පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරෙන් තොරතුරු හඳුනාගත හැකි අතර එහිදී ද අනාදිමත් කාලයක සිට පැවති නගර ආරක්ෂිත පවුරු ප්‍රාකාර යලි ප්‍රතිසංස්කරණයන් සිදුකර ඇත (ප්‍රේමතිලකඃ1991.13). ක්‍රි.ව.1765 දී ලන්දේසී ආණ්ඩුකාරවරයෙකුගේ තානාපතිවරයෙක් වූ ජෝන් පයිබස් (John Pybus) නැමැත්තා මහනුවර සැලසුමක් ඇඳ *ප්ලෑන් කණ්ඩියා* හෙවත් "නුවර පිඹුර" යනුවෙන් නම් කොට ඇත. මෙම මුල් සැලසුම දැනට ඕලන්ද හේග් නුවර රාජ්‍ය ලේඛනාගාර කෞතුකාගාරයේ තැන්පත්කොට ඇති අතර මුලින් දැක්වූ සිතියමට සාපේක්ෂව මහනුවර නගර හා ඒ අවට පෙදෙස් හි අවකාශීය සැලසුම පිළිබඳව වඩා වැඩි තොරතුරු ප්‍රමාණයක් මෙයින් ලබා ගත හැකිය. ඒ අනුව නගරයට පිවිසෙන ප්‍රධාන මාර්ග ලෙස පෙන්වා දී ඇත්තේ උතුරු දෙසින් කටුගස්තොට දක්වා දිවෙන වීදියත්, දකුණු දෙසින් හඟුරන්කෙත දක්වා දිවෙන වීදිය හා නිරිත දෙසින් කොළඹ දක්වා ඇති ප්‍රධාන මාර්ගයන් බව පෙනීයයි. මෙම සිතියමෙන් මහනුවර නගරයට උතුරු දෙසින් ඇතුල්වන ප්‍රධාන තොටුපලක් වූ කටුගස්තොට තොටුපල හා අවට පෙදෙස හඳුනාගත හැකිය. එසේම බහිරව කන්ද හා උඩවාසල වත්ත යන වන පෙදෙස් ද නගරය වටා පිහිටි කුඹුරු ද මැනවින් නිරූපණය කර ඇත. මෙම සිතියමේ ද පසු කාලීන සිතියම්වල දැකිය හැකි බෝගම්බර වැව දැකිය

නොහැකිය. නමුත් පසු කාලීනව වැවට යට වූ එම පෙදෙස් මෙම කාල සීමාවේ දී වී වගාව සඳහා යොදාගත් කුඹුරුයායවල් ලෙසින් මෙහිදී හඳුනාගත හැකිය.





01-මාලිගා සංකීර්ණය 02-රාජ උද්‍යානය 03- අදිකාරම්ගේ නිවස 04- රජුගේ ඇත් ගාල 05-රජුගේ රිය ගාල 06-1සහ 6-2 දේවාල 07- හමුදා බැරැක්ක
08-නාගහ වීදිය 09- අෂ්ඨවංක වීදිය 10-බහිරව කන්ද 11-උඩවාසල වත්ත 12-තොටුපල 13- මහවැලි ගඟ 14- කටුගස්තොට අවට පෙදෙස

***සිතියම් අංක 02-*** *ක්‍රිස්තු වර්ෂ 1765 දී මහනුවර නගරය හා අවට ප්‍රදේශය දැක්වෙන ජෝන් පයිබස් ගේ සිතියම.*

*මූලාශ්‍රය - Grote Atlas vande verenigde Oost- Indische Compagnie, Comprehensive Atlas of the Dutch United East India Compeny*

මේ අනුව නගරයේ ආරක්ෂක පවුරු දකුණු හා නිරිත දිශාගතව පෙන්වා ඇති බවක් පෙනීයයි. එසේම මෙම සිතියමේ විශේෂිත ස්ථාන ලෙස රජුගේ මාළිගය හා උද්‍යානය, රජුගේ ඇත් හා රිය ගාල්, මහාදිකාරම්ගේ නිවස, නාථ හා පත්තිනි දේවාල දෙක දැක්විය හැකිය. එසේ ම නගරය මධ්‍යයේ ආරක්ෂාව උදෙසා හමුදා මුර පොළක් ද පවත්වාගෙන ගොස් ඇත. මෙම ලන්දේසී ජාතිකයාගේ වාර්තාව අනුව ඔහු එක් වීදියක වූ නිවාසයක ලැගුම්ගෙන සිට ඇති අතර එම වීදීය සැතපුමක්


පමණ දිගකින් යුත්ත වන්නට ඇතැයි දක්වා ඇත. ඔහු සඳහන් කරන පරිදි එහි නිවාස සැකැස්මෙන් මෙන්ම නිමාවෙන් ද ක්‍රමවත් බවක් නොපෙන්වා ඇත. එසේම උළු සෙවිලි කළ නිවාස තිබී ඇත. මාළිගා සංකීර්ණය කුටි රාශියකින් යුත් පුළුල් වූ ඉඩ ප්‍රමාණයකින් යුක්තවී ඇත. නගරයේ බටහිර දෙස සිට නැගෙනහිර දිශාවන්ට විහිදුනු හරස් වීදී ඇති මුත් දෙපසට වන්නට ඇති ස්වාභාවික කඳුවැටි නිසා එම වීදිවල දිග ප්‍රමාණය අඩුවී ඇති බව පෙනීයයි. මේ අනුව කාලයෙන් කාලයට මහනුවර නගරය ක්‍රමානුකූලව ඉදිවෙමින් වඩා සංකීර්ණත්වයට පත්ව ඇති ආකාරය හඳුනාගත හැකි අතර ක්‍රි.ව. 1810 ශ්‍රී වික්‍රම රාජසිංහ රජ දවස වන විට මහනුවර නගරය වර්තමාන තත්ත්වයට පත්ව ඇති බවට පිළිගත හැකිය. මූලාශ්‍රගත තොරතුරු අනුව එම නගර නිර්මාණය දේවේන්ද්‍ර ආචාර්යවරයා විසින් සිදුකර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය සිදුකර දීමට මීගස්තැන්නේ අධිකාරම් වෙත වගකීම් පවරා තිබී ඇත. දළදා මන්දිරයට පත්තිරිප්පුව එක්කිරීම ද කිරි සයුර නමින් කුඩා වැවක් මාලිගා සංකීර්ණය ආසන්නයේ ඉදිකිරීම ද මෙම යුගයේ දී මහනුවර නගරයේ සිදු වූ සුවිශේෂී ඉදිකිරීම් ලෙස පෙන්වාදිය හැකිය. ක්‍රි.ව. 1815 දී මහනුවර නගර සැලැස්ම දක්වෙන සිතියමක් බ්‍රිතාන්‍ය හමුදාවන් භාර නියෝජ්‍ය හමුදාපතිවරයෙක් වූ වෛද්‍ය හෙන්ද්‍රි මාෂල් විසින් සම්පාදනය කර ඇති අතර එය Ceylon General Description of the Island and its inhabitants යන ග්‍රන්ථයේ එය ඇතුළත්කර ඇත.




***සිතියම් අංක 03*** - *ක්‍රිස්තු වර්ෂ 1815 දී මහනුවර නගරය හා අවට ප්‍රදේශය දක්වෙන හෙන්ද්‍රි මාෂල්ගේ සිතියම.*

*මූලාශ්‍රය - Conservation and Development Plan - CCF (1999)*

හෙන්ද්‍රි මාෂල්ගේ මෙම සිතියමේ නගරය වටා වූ මහවැලි ගඟ හා එය තරණය කරමින් නගරයට පිවිසිය හැකි තොටුපලවල් හා මහා මාර්ගයන් පැහැදිලිව දක්වා ඇත. එසේ ම මෙම සිතියම මඟින් නගරය අවට භූ විෂමතාවය පිළිබඳව ද යම් අදහසක් ඇතිකරගත හැකිය. එසේ ම එහි කීර්ති ශ්‍රී රාජසිංහ රජු කරවූ ගංගාරාමය හා වේල්ස් පාර්ක් යනුවෙන් පසු කාලයේ හැඳින්වූ රාජකීය පුෂ්ප උද්‍යානය ද හඳුනාගත හැකිය. මීට අමතරව ක්‍රි.ව. 1815 දී පැවති මහනුවර නගරය හඳුනාගත හැකි සිතියමක් පසු කාලීනව ටී.බී. කැප්පෙටිපොළ නම් බස්නායක නිළමේවරයෙක් විසින් සම්පාදනයකර ඇති අතර මෙම සිතියම් අනුසාරයෙන් මහනුවර නගරය හා අවට අවකාශීය සැලැස්ම පිළිබඳව පූර්ණ අදහසක් ඇති කරගත හැකිය.




***සිතියම් අංක 18*** *- ක්‍රි.ව.1815 දී මහනුවර නගර සැලැස්ම*

*මූලාශ්‍රය - Conservation and Development Plan - CCF (1999)*

මහනුවර නගරයේ සුවිශේෂී ස්ථානය වූ රජුගේ මාළිගා සංකීර්ණය හා ශ්‍රී දළදා මන්දිරයේ පිහිටීම නගරයේ දකුණු හා ගිණිකොණ දිශාවන්ට බරව උඩවත්ත කැලේ නමින් හඳුන්වනු ලබන කඳු ගැටය පාමුල උස් ස්ථානයක නගරයට මුහුණලා පිහිටුවා ඇති බව එයින් විද්‍යාමාන වේ. මෙම කාලයේ දී මාළිගා සංකීර්ණය දිය අගලකින් හා එහි බටහිර මුහුණතේ පිහිටි ආධාරක ආරක්ෂක ප්‍රාකාරයකින් ආරක්ෂාකර ඇත. මෙම දිය අගල හරහා තිබූ ඉවත් කළ හැකි ශෛලමය පාලමක් මඟින් දළදා මන්දිරය හා රාජකීය උද්‍යානයට ඇතුළු විය හැකිවිය. එසේම මෙම සංකීර්ණයේ දකුණු කෙලවර කිරි සයුර නමින් හැඳින්වෙන වැවෙන් සීමාවී ඇත (ප්‍රේමතිලකඃ1991.08). මෙහි ඉදිරිපසින් සැකසූ මළුවක නාථ හා පත්තිනි හා ගම්බාර දේවාල වූ අතර උතුරු දෙසින් මහා දේවාලය ද විය. කතරගම දේවාලය මෙම සංකීර්ණ පෙදෙසින් බැහැරව බටහිර දෙසට වන්නට කවිකාර විදියට මුහුණලා පිහිටුවා ඇත. නගරයේ අනෙකුත් ප්‍රධාන ආගමික මධ්‍යස්ථාන දෙක වූ අස්ගිරි විහාරය බටහිර දෙසින් නගරයේ ඉහළ කෙළවරට වන්නට පිහිටා තිබූ අතර පුෂ්පාරාමය නගරයේ දකුණු දෙසට වන්නට පහළ ම සීමාවේ විය. මෙම මාළිගා සංකීර්ණයට ශ්‍රී දළදා විහාරය, රජ මාළිගය හා ඊට උපයෝගීතාවයක් සහිත විවිධ ගොඩනැගිලිවන බිසෝවරුන්ගේ කාමර, නාන පොකුණු හා වැව මධ්‍යයේ පිහිටි ජයතිලක මණ්ඩපය ආදී සුවිශේෂී ගොඩනැගිලි සමූහයකින් යුක්තව ඇත. විවිධ සතුරු ආක්‍රමණ හමුවේ විනාශ වීම්වලට ලක්වුව ද මෙම මාළිගා සංකීර්ණය සැලැස්ම හා ඉඩ ප්‍රමාණයන් වෙනස් කරමින් අවස්ථා කීපයක දී ම ගොඩනගා ඇති බව දැනට සිදුකෙරී ඇති පර්යේෂණ මඟින් ද තහවුරු කෙරී ඇත. මෙහි කිරි සයුර ලෙසින් හඳුන්වනු ලබන වැව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් කරවූ අතර එය බෝගම්බර නමින් හැඳින්වූ පැරණි වැවට ඉහළින් මාළිගා සංකීර්ණය ආසන්නයෙන් නිර්මාණයකර ඇත. මෙයට යට වූ පෙදෙස් මුල් කාලීනව මඩ කුඹුරු යායකින් යුක්ත වී ඇත. එය ක්‍රි.ව.1765 දී පමණ අඳින ලද ලන්දේසි සිතියම් මඟින් ද එය තහවුරු වේ. මෙම කුඹුරු පෙදෙස එකල ටිගොල්ල වෙල් යාය ලෙසින් හඳුන්වා ඇති අතර එය මල්වතු විහාරය වෙත පුජා කරන ලද්දකි. හීල්පැන්කඳුර නම් දිය පහරින් මෙයට ජලය ලබාගෙන ඇති අතර පසු කාලීනව රොන්මඩ පිරි වගුරු බිමක් බවට පත්ව ඇති බව සැලකේ. එනිසා නගරයේ ආරක්ෂාව මෙන් ම අලංකරණය පිළිබඳව අවධානය යොමුකරමින් මෙම වගුරු බිම මත වැවක් නිර්මාණය කර මෙහි වැඩි ජලය බෝගම්බර වැවට ගලා යාමට සලවා ඇත. එසේ ම මෙම වැව් සංකීර්ණය මඟින් දෙයියන්නේ වෙල හා මහයාය (පසුකාලීනව මහයියාව) නැමැති විශාල කුඹුරු යායවල් වෙත ජලය සපයා ඇත. (දැනට වසර 70-80කට ඉහත දී වර්තමාන මහයියාව රථවාහන සේල් ඇති සම්පූර්ණ භූමි භාගය ම කුඹුරු යායවල් ලෙසින් පැවති බව අප සිදුකළ සාකච්ඡාවල දී ද තහවුරු විය.) නගරයේ සුවිශේෂී මෙම

මාලිගා සංකීර්ණයට පිටතින් රාජ්‍ය පාලනයට සෘජු ලෙස සම්බන්ධ නිලතල දරූ ප්‍රභූන් නගරය තුළ පදිංචි කරවාගෙන තිබුණි. එය මහනුවර රාජධානියේ සුවිශේෂී ලක්ෂණයක් ලෙසින් ද සැලකිය හැකි අතර එය අභ්‍යන්තර කුමන්ත්‍රණ ආදියෙන් රජුගේ ආරාක්ෂාව පිණිස ක්‍රියාත්මක වුණු ආරක්ෂක ක්‍රමෝපායක් ලෙසින් ද පෙන්වාදිය හැකිය. නගරයේ පිහිටි එම ප්‍රභූ නිවාස වලව්ව යන පොදු නාමයෙන් හැඳින්වූ අතර දහ අටවන සියවසේ දී නගරය තුළ පැවති එවැනි වලව් 18ක් පමණ එම සිතියම ඇසුරෙන් හඳුනාගත හැකිය. රජුගේ මාළිගා සංකීර්ණය හා පූජනීය ස්ථානයන් ඉදිරිපසින් උතුරු හා බටහිර දිශාවන් වෙත නගරය ව්‍යාප්තව ඇති අතර එහි කිසියම් රටාවක් අනුව නිර්මාණය කෙරුණ මාර්ග පද්ධතියක් (වීදී) පැවති බව දැකිය හැකිය. එසේ ම මෙම කාලයේ දී නගරය තුළ ආරක්ෂක කටයුතු සඳහා ප්‍රධාන වාහල්කඩ හා මුර පොළවල් කීපයක් පිහිටුවා මේ සෑම ස්ථානයක රැකවලුන් රඳවා ආරක්ෂාව තරකර ඇති බවට සැලකේ. නගරයේ ආරක්ෂක කටයුතු පළමු හා දෙවනි අධිකාරම්වරුන්ගේ සෘජු අධීක්ෂණයට නතුකර තිබුණි. මේ ආකාරයෙන් මහනුවර රාජධානියේ ප්‍රධාන නගරය ලෙසින් සෙංකඩගල නුවර පැවති අතර එය මුල් කරගනිමින් ඒ වටා තවත් උප නගර ලෙස මැද මහනුවර, ගොඩපොළ නුවර, දියතිලක නුවර, අලුත් නුවර හා දෙනුවර පැවතී ඇත.

**නිගමනය**

මේ අනුව මහනුවර රාජධානියේ අග නගරය වූ සෙංකඩගල නගරයේ අවකාශීය සැලැස්ම පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී පෙනීයන්නේ එය මුල් කාලයේ පටන් ම රජු හා දෙවියන් මුල්කර ගනිමින් ගොඩනගා ඇති ආකාරයයි. එය රජු දේවත්වයට සමාන ලෙසින් සැලකීමට සමාජයන් වෙත කළ කිසියම් පෙළඹවීමක් ද විය. එසේ ම රජුගේ මාළිගයත්, පාලන තන්ත්‍රයට සම්බන්ධ ප්‍රභූ රදලයින්ගේ වාසස්ථාන නගරය තුළ ස්ථාපනයකර ඇති අතර ආගමික අනුශාසකයින් විසූ අස්ගිරි හා මල්වත්ත සංඝාරාම දෙක නගරය තුළ ස්ථාපනය කිරීමෙන් රාජ්‍ය පාලනය කෙරෙහි ඔවුන්ගේ දායකත්වය ලබාගැනීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමුකර ඇති බව පැහැදිළි වේ. එසේ ම සමස්ත නගර සැලැස්ම තුළ දැකිය හැකි අනෙක් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ රාජ්‍යයේ පැවැත්ම පිණිස ආරක්ෂක සංවිධානය කෙරෙහි වැඩි අවධානයක් යොමුකර පැවතීමයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

කරුණාතිලක,ඒ.ඩී.පී. (1955), සෙංකඩගල පුර ඉතිහාසය, සීමාසහිත කැන්ඩි ප්‍රින්ටර්ස් සමාගම.

ජයවර්ධන,එස්.කේ, (2007), සාරථී (සෙංකඩගල පැරණි බෝගම්බර වැව හා එය විනාශවීමට හේතු), මධ්‍යම පලාත් සභාව.

ප්‍රේමසිරි,සුනන්දා,(2015), මැදරට වංශය, (මහබලි නුවර සිට මහනුවර ලෝක උරුම නගරය දක්වා පියසටහන්), මධ්‍යම පලාත් සභාව.

ප්‍රේමතිලක, පී.එල්. (1991), මහනුවර ව්‍යාපෘතිය, I වන කැණීම් වාර්තාව, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

රෝහණදීර මැන්දිස්, (1998). අස්ගිරියෙන් උඩරට ඉතිහාසය, කතෘ ප්‍රකාශණය.

මුණසිංහ,ගුණතිලක, (1998), මහනුවර පුරවරයේ උපත, ඩී.ජයවික්‍රම සහෝදරයෝ, මහනුවර.

සේනානායක පියතිස්ස, (2007). සෙංකඩගල පුරාණය, ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යයංශය කොළඹ.

# ශ්‍රී ලංකාවේ ආදිවාසී ජන අස්පර්ශිත උරුමය පිළිබඳ අධ්‍යයනයක්

**පූජ්‍ය දෝතලුඔය නාරද හිමි**

සමාජවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය අනුරාධපුර

dothaluoyanarada2000@gmail.com

***සංක්ෂේපය***

*ව්‍යවහාරික, ප්‍රාසාංගික හා ලේඛනගත කලාවන් ද පාරම්පරික දේශීය දැනුම් සම්භාරය පොදුවේ අස්පර්ශිත උරුමය ලෙස ගත හැක. එකී අස්පර්ශිත උරුමයෙන් පෝෂණය වූ ජන කණ්ඩායමක් ලෙස ශ්‍රී ලංකාවේ ජීවත්වන ආදිවාසීන් (වැද්දන්) පෙන්වාදිය හැකිය. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ආදිවාසීන්ගේ අස්පර්ශිත උරුමය පිළිබඳ අධ්‍යයනය කොට එහි විවිධතා හඳුනාගැනීමයි. වැදි ජනතාවගේ අස්පර්ශිත උරුමයේ විවිධතා කවරේ ද? ඒ හා බැඳුන වැදි ජන ජීවිතය කෙබඳු ද? යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටළුව විය. පර්යේෂණය සාර්ථක කරගැනීම සඳහා සාහිත්‍යය මූලාශ්‍ර අධ්‍යයනය පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදාගන්නා ලදී. මෙම පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ විමර්ශනය කොට ලාංකික ආදිවාසී ජනතාවට ආවේණික වූ අස්පර්ශිත උරුමයේ විවිධතා පිළිබඳ කරුණු අනාවරණය කරගැනීමට හැකිවිය. විශේෂයෙන් ආදිවාසීනට අනිකුත් ජන කොට්ඨාසයන්ගෙන් වෙන් වූ සංස්කෘතියක් ඇත. එම සංස්කෘතියට අයත් වූ සංස්කෘතික අංගයන් සහ ප්‍රවේණිගතව පැවත එන ව්‍යවහාර භාෂාව, ජනශ්‍රැති, යාතුකර්ම විධි, ඇදහිලි හා විශ්වාස, සාම්ප්‍රදායික තාක්ෂණය, ජීවන රටාව හා බැඳුන ආහාර කල්තබා ගැනීම් ක්‍රම, ආහාර වර්ග, අභිචාර විධි, දඩයම් ක්‍රම, කෙම් ක්‍රම, හා සිරිත්විරිත්, නිතිරීති එනම් තහංචි, වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම යනාදිය පිළිබඳව අධ්‍යයනය කිරීමට හැකිවිය. මෙම අස්පර්ශිත උරුමයන් අනිකුත් ජන සමාජවලින් වෙනස් වූවකි. වර්තමානය වන විට වැදි ජනතාව තුළින් ද මෙම උරුමය වියැකී යන තත්වයක් ද දක්නට ලැබේ.*

***ප්‍රමුඛ පද** - අස්පර්ශිත උරුමය, අධ්‍යයනය, ආදිවාසීන්, ශ්‍රී ලංකාව, ජන ජීවිතය*

## හැඳින්වීම

උරුමය යනුවෙන් අදහස් කෙරෙනුයේ සෑම රටක ම අතීතයේ දී ජීවත් වූ මිනිසුන් විසින් ඔවුන්ගේ ජීවන අවශ්‍යතා නිසියාකාරව සිදු කරගැනීම වෙනුවෙන් නිපදවා පරිහරණය කර වර්තමානිකයා වෙනුවෙන් ශේෂකොට ඇති දේවල් ය. අස්පර්ශිත උරුමය යටතට ඕනෑම සමාජයක එයට ආවේණික චින්තන රටාව, ව්‍යවහාරික ප්‍රාසාංගික හා ලේඛනගත කලාවන් ද පාරම්පරික දේශීය දැනුම් සම්භාරය පොදුවේ ගත හැක. මෙකී අස්පර්ශිත උරුමයට හිමිකම් දක්වන ජන කණ්ඩායමක් ලෙස වර්තමානයේ ලංකාවේ ජීවත්වන ආදිවාසීන් (වැද්දන්) පෙන්වාදිය හැකිය. මෙම ජනතාව සතු අස්පර්ෂිත උරුමය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. මෙරට දඹාන, හෙන්නානිගල, රතුගල, පොල්ලේබැද්ද, දලුකාන ආදී ප්‍රදේශයන්හි මෙම ජනතාව ජීවත් වේ. රොබට් නොක්ස් තම එදා හෙළදිව කෘතියේ වැද්දන්ගේ වාසභූමිය පිළිබඳ මෙසේ සටහනක් තබා ඇත. "......වනචාරී මනුෂ්‍යයෝ වනාහි වනයේ වාසය කරන සිව්පා සතුන් මෙන් ම වනචර ය. බිම්තැන්න නම් ප්‍රදේශ මුවන්ගෙන් අවතීර්ණ වූ මහ කැලෑවෙන් වැසුණේ ය. පූර්වෝක්ත වනචාරී මනුෂ්‍යයෝ මෙහි කැලෑවල වාසය කරති. ඔවුන්ගේ නාමය වැද්දෝ ය....." යනුවෙනි (නොක්ස් 2008:217).

ආදිවාසීන් වැද්දන් යන නාමයෙන් ආමන්ත්‍රණය කරයි. එය සංස්කෘත භාෂාවේ 'ව්‍යාධ' යන වචනයෙන් එය බිඳී ආවකි. (ලොකුහේවා, 2009:40) දඩයමෙන් ජීවත්වෙන බැවින් වැද්දන් 'සබර' යන වචනයෙන් ද හඳුන්වයි. එසේ ම කඳු ආශ්‍රිතව මොවුන් ජීවත්වෙන බැවින් 'පුලින්ද' යන නාමයන් ද හඳුන්වනු ලබේ. (ලොකුහේවා, 2009:128) ආර්.එල් ස්පිටල් මහතා පවසන පරිදි බැද්දේ විසුවන් 'බැද්දන්' වශයෙන් නම් වී ව්‍යවහාරයේ දී 'වැද්දන් 'බවට පත්වී ඇත. (ලොකුහේවා 2009:40) ලංකාවේ ආදිවාසීන් පිළිබඳ පර්යේෂණය කළ පර්යේෂකයන් මෙරට වර්ග තුනක වැද්දන් වාසය කරන බව සඳහන් කර ඇත. එනම් වැද්දෝ, ගම් වැද්දෝ, වෙරළබඩ වැද්දෝ යනුවෙනි. මෙම කොට්ඨාස තුන ප්‍රධාන කරගනිමින් වැද්දන්ගේ ප්‍රවේණි හෙවත් වරිග රාශියක් දක්නට ලැබේ. ඒවා අතර නමදේව වරිගය, උනාපාන වරිගය, මොරානා වරිගය, ඇඹුල වරිගය, ඌරු වරිගය, තල වරිගය යන වරිගයන් ප්‍රධාන වේ.

### ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා භාවිත කරන ලද පර්යේෂණ ක්‍රමවේදය වන්නේ පුස්තකාල අධ්‍යයනය යි. මෙහිදී විශේෂ වශයෙන් අදිවාසීන් පිළිබඳ ලියවී ඇති ද්විතීයික මූලාශ්‍ර ග්‍රන්ථ අධ්‍යයනය කළ අතර ඒවායෙහි අන්තර්ගත කරුණු විධිමත් ලෙස විවරණය කිරීම තුළින් උක්ත කාරණය විමර්ශනයට ලක් කිරීම සිදු කර ඇත.

### සාකච්ඡාව

ඉතා දීර්ඝ ඉතිහාසයකට නෑකම් කියන මෙම ජනතාව ප්‍රවේණිගතව රැකගෙන ආ අස්පර්ශිත උරුමයන් පවතී. මෙම අස්පර්ශිත උරුමයන් තමන්ට ම ආවේණික වූ ලක්ෂණ ලෙස වැදි ජන කොට්ඨාසයන් ආරක්ෂා කරන අතර වැදි සමාජයෙන් සමාජයට යම් යම් වෙනස්කම් ද දක්නට ලැබේ. ආදිවාසීන්ගේ අස්පර්ශිත උරුමය පිළිබඳ විමර්ශනය කරන විට ප්‍රථමයෙන් වැදි ජනවහර පිළිබඳ අධ්‍යයනය කළ යුතුවේ. වෙනත් සමාජයන්ගෙන් වෙනස් වූ අපූර්ව භාෂාවක් මෙම වැදි සමාජයන් විසින් ව්‍යවහාර කරනු ලබයි. ඉන්දු ආර්ය භාෂා පවුලට අයත් නොවූ වැදි බස ඔවුනගේම අනන්‍යතාව විදහා දක්වන බව ඇතමෙක් කියයි. එමෙන්ම කතා කිරීමට පමණක් සීමාවූ අලිඛිත භාෂාවකි. වෙරළබඩ ජීවත්වන ආදිවාසීන් දමිළ ජනයා හා මුසුවීම හේතුකොට යම් දමිළ සම්මිශ්‍රණයක් එම ප්‍රදේශයේ වැදිබසට එකතුවී ඇති බව පෙනේ. මොවුන්ගේ බස්වහරෙහි උච්චාරණ රටාව තීව්‍ර වූත් දැඩි වූත් නාද රටාවකින් යුක්ත වේ. එසේ ම ප්‍රදේශයෙන් ප්‍රදේශයට යම් යම් වෙනස්කම් ද වැදි බසෙහි දක්නට ලැබේ. උදාහරණ ලෙස බින්තැන්නේ වැද්දන් තම වාසස්ථානයට "දැලි ගම් පොජ්ජ" ලෙස ව්‍යවහාර කරයි එහෙත් දඹානේ වැද්දන් තම වාසය කරන ස්ථානය හැඳින්වීම සඳහා යොදාගනු ලබන්නේ "පෝරු ගම් පොජ්ජ" යනුවෙනි. පොදුවේ ගත් කළ ආදිවාසීන් විසින් ව්‍යවහාර කරණු ලබන වැදි ජනවහරේ භාවිත වන වචන මෙලෙස පෙන්වාදිය හැක.

| | | | |
|---|---|---|---|
| ඔටා දමනවා - | නටනවා | ඉලයා - | නයා |
| කං කුණා - | ගෝණා | කටු කැච්චා - | ඉත්තෑවා |
| කඳ මීරිය - | මී පැණි | | |
| මහ උෟරා - | නායකයා | | |
| අංකර පොජ් - | රණ්ඩුව | | |
| අයි දණ්ඩ - | අත | | |

ආදිවාසීන් වටා පටබැඳුනු ජනශ්‍රැති දක්නට ලැබේ. විශේෂයෙන් ඔවුනගේ පරම්පරා ගොඩනැගුණු ආකාරය කියාපාන පරම්පරානුගතව පැවතගෙන එනු ලබන කතාන්දර රාශියකි. යම්කිසි සිද්ධියක් වටා ගෙතී ඇති අතීතාවර්ජිත මෙම ජනශ්‍රැති වැදි සමාජයේ ජීවත්වූවන් තම පරම්පරාවෙන් පරම්පරාවට වාචොද්ගතව රැගෙන ඇවිත් ඇත.

***ඌරු වරිගය -*** "ඈත අතීතයේ අපේ කිරි අම්මා කෙනෙකුට දරුවෙක් ලැබෙන්න හිටියලු. ඇයට විලි රුදාව හැදිලා වේදනාවෙන් සිටිය දී වත් ගල් රුකුලටවත් ළඟාවෙන්න වේලාවක් තිබිලා නැහැ. අසල තිබුණු ඌරෙකු විසින් හාරන ලද වළක දී දරුවා ප්‍රසූත කරලා තිබෙනවා . ඒ දරුවාගෙන් පැවත එන පරම්පරා පොජ්ජට කියන්නේ ඌරුවරිගේ ඇත්තෝ කියලා" (බිනරගම, 2013:27)

***උනාපාන වරිගය -*** එක්තරා නියන් සමයක රජ්ජුරුවන්ට වතුර ලබාදුන් කතා පුවතක් හේතුකොට රජ්ජුරුවන් උනාපාන වරිගය ලෙස මෙය නම්කර ඇත. (බිනරගම, 2013:27)

***මොරාන වරිගය -*** මොරගස් බහුල වනයේ වාසය කළ වැද්දන් මොනර වරිගය වේ. එමෙන් ම උණුකිරිගල ගල්ගේ විසූ වැද්දෙක් රජ්ජුරුවන්ගේ බිසවට මොර කෑමට ඇතිවූ දොළදුකක් සංසිඳවීම සඳහා අවාරයේ මොර සොයායෑමේ පුවතක් මෙම වරිගය හා බැඳී ඇත. (බිනරගම, 2013:28)

***ඇඹුල වරිගය -*** "ගැහැනියක් දරුවෙකු ලැබීමට ආසන්නව තිබිය දී ඇගේ සැමියා මිය ගියේ ය. ඇගේ දෙමාපියන් ද ඒ වනවිට ජීවතුන් අතර නොවූහ. ප්‍රසූත කළ දරුවා ගස් සෙවනක තබා කෑමට අලයක් සාරා ගැනීමට වනයට ගොස් ආපසු පැමිණි ඇයට දක්නට ලැබුණේ දරුවා ඇඹලයින් රංචුවකට හසුවී ඇස් අන්ධ වී සිටි බවයි. ඇඹල නම් ලද දැරිවියගේ දරු පරම්පරාව ඇඹල නම් විය" (පෙරේරා, 2009:124)

***බඹරු යක් නැටුම -*** "එක් වැදි කණ්ඩායමක් අල වර්ග සොයමින් සිටිය දී බල්ලන් වල් ඌරෙකු කොටුකරගත්තේ ය. කෝපයට පත් ඌරා වැද්දන්ට පහරදීමට පැන්නේය. එහෙත් එක් වැද්දෙකුටවත් ඌරාට විදගත නොහැකිවිය. එක් වැදි ගැහැනියක් අල බිඳමින් සිටි වැද්දාගේ දුන්නත් හීයත් ගෙන ඌරාට විද බිම හෙලුවාය. වැද්දා ද වහා අල බිඳිමින් සිටි ලීයත් පොරවත් ගෙන ඌරාට තඩි බෑවේය. ඌරා බිරුසන් හඬ දෙමින් වැද්දාටත් වැද්දිටත් පහර දෙන්නට වූයේ ය. එහෙත් අන්තිමේ දී ඌරා මියදුණේය. මේ ඌරු සටන දුටු බියපත් වැද්දෝ පළාගියහ." (ලොකුහේවා, 2009:190-191) මෙම කතාව පාදක කොට දඬයම හා

බැඳුන බඹර යක් නැටුම් යාගය ආරම්භ වී ඇත. මෙවැනි ජනප්‍රවාද රාශියක් ආදිවාසී ජන සමාජය සතුව අදටත් ශේෂව පවතී.

ආදිවාසීන්ගේ අස්පර්ශිත උරුමයේ තවත් එක් සුවිශේෂී වූවකි ඔවුනගේ ඇදහිලි හා විශ්වාසයන්. ආදිවාසීන් යකා, යකිණිය, යකුන් ආදි පදවලින් හැඳින්වෙන මළගිය වූවන් ගේ ආත්මය පිදීම හෙවත් මළවුන් ඇඳහීම ඉතා ජනප්‍රියය ඇදහිල්ලකි. වීරයින් ලෙස සලකන වැදි නායකයන්ගේ ආත්මය නෑ යකුන් ලෙස අදහනු ලබයි. යම් පුද්ගලයෙකු මියගිය පසු කන්දේ යකා සමීපයට යන බව මොවුන්ගේ එක් පිළිගැනීමකි. එලෙස ගොස් කන්දේ යකාගේ ආවතේව පිරිවරට එක්වේ. කන්දේ යකා නොමැතිව පෞද්ගලික වශයෙන් තම ඥාතීන් විසින් දෙනු ලබන පුද පූජා පිළිගැනීමට හැකියාවක් තම ඥාතී ආත්මයන්ට හැකියාවක් නොමැත. එසේ පිළිගන්නේ නම් නියත වශයෙන් ම යක්ෂ නායකයාගෙන් අවසර ලබාගත යුතුය. අතිදක්ෂ දඩයක්කරුවෙකු වූ කන්දේ වන්නියා නැමැති තැනැත්තාගේ ආත්මය කන්දේ යකා යන නාමයෙන් හඳුන්වා දඩයමේ යෑමට පෙර හා පසු එම ආත්මය පිදීමේ සිරිතක් ආදිවාසීන් සතුවේ. මුවෙකු දඩයම් කරගත් පසු එම සතාගේ හිස කපා වෙන්කොට බත් පොල් සමඟ කන්දේ යකාට පුදනු ලබයි. එමඟින් ඔවුන් බලාපොරොත්තු වන්නේ දඩයම සරුසාර කරගැනීමයි. මෙම කන්දේ යකා සමඟ ඔහුගේ සොහොයුරෙකු වූ බිළිඳි යකා කන්දේ යකා සමඟ ම එකට වාසය කරන බව පැවසේ. මෙම කන්දේ යකා දඩයමට අධිපති භූතාත්ම ද වේ. එසේ ම කිරිඅම්මා දේවතාවිය ද ආදිවාසීන්ගේ ඇදහීම් රටාව තුළ පූජාවට පාත්‍ර වේ. මෙම ඇදහීම් මඟින් ලෙඩ රෝගවලින් ආරක්ෂාවීමත්, තම මියගිය ඥාතීන් පිනවීමටත් දඩයම් සරුසාර කරලීමත්, නියග හා වර්ෂාවෙන් ආරක්ෂාවීමත්, සෞභාග්‍ය උදාකරගැනීමත් වැද්දන්ගේ අභිලාෂය විය. එසේ ම වැදි සමාජයේ පැවත එන ද්වාර කර්ම ද අස්පර්ශිත උරුමය වේ.

ආදිවාසී ජන සමාජය තුළ අන් සමාජයන් ගේ පැවත එන ද්වාර කර්ම ලක්ෂණ පෙන්නුම් නොකරයි. උපතේ සිට මරණය දක්වා සිදුකරන මෙම ද්වාර කර්ම ආදිවාසීන්ගේ අනන්‍යතාවය මනාව විදහා දක්වන්නකි. දරුගැබ මෝරාගෙන එනවිට වැඩිහිටි කාන්තාවන්ගෙන් උපදෙස් ගැනීම සාමාන්‍යයෙන් සිදුවන්නකි. එලෙස සිදු නොවන අවස්ථා ද වැදි සමාජය තුළ දක්නට ලැබේ. වැදි සමාජයේ දරු ප්‍රසූතිකාගාරය වන්නේ ගල්ලෙන හෝ පැල්පතය. දරු උපතක දී සිදු කළ යුතු කාර්යයන් ස්වාමියා විසින් සිදුකරන අතර තම මව හා නැන්දා සහයට පැමිණේ. මුව හමක් හෝ ගෝන හමක් වැතිරී සිටීමට බිමට එළන අතර ගැබිනියට විළිලෑම පහසු කරවීම සඳහා පය තබනු පිණිස ගල් දෙකක් දෙපස සිටුවීම සිදුකරනු ලබයි. වෙරගැනීම සඳහා ද වැල්පොටක් යොදන අතර දරුවා බිහිකළ විට පෙකණි වැල

කැපීම සඳහා ඊතල හිස භාවිත කරයි. දරුවා බිහිකළ පසු දින නවයක් ගතවන තෙක් මවට ගොණල සහ ගොයි මස් ආහාරයට ලැබෙන අතර කිරිපොවන මාස හය තුළ වදුරු මස්, රිලා මස්, මුව මස්, ඌරු මස්, ආදිය ආහාරයට ගැනීමෙන් වැළකී සිටී. ඉපදුන දවසේ සිට ම දරුවාට මව්කිරි පමණක් දීම සිරිතක් වශයෙන් සිදුකරන්නකි. දෙමව්පියන්ගේ හා වැඩිහිටියන්ගේ අදහස අනුව දරුවා ඉපදී මාසයක් ගතවූ තැන සුදුසු නමක් තබන අතර දරුවා ඉපදී මාස හයක් ගතවන්නට පෙර ඉඳුල් කටගෑම සිදුකරනු ලබයි. පොහොය ඇති දවසක පෙරවරු කාලය මීට සුදුසු බව ආදිවාසීන්ගේ අදහසයි. ස්ත්‍රීන්ගේ කොටහළු මංගල්‍ය වැදි සමාජයේ පවත්වන අයුරු ඊ.එම්. රත්නපාල මහතා මෙලෙස සටහන් තබයි. "පළමුව ඔපස් වීමෙන් පසු දැරිය වෙන්කොට බීමෙන් ඉක්බිති ඇයගේ ප්‍රථම ස්නානය සිදුකරනු ලැබේ... මැටි බඳුනකට ජලය ගෙන වනයෙන් සොයාගත් ඔසුවර්ග ඊට මුසුකොට එකී ජල බඳුන නව යොවුන් දැරියගේ හිසවටා කරකවමින් නෑනා ඇය නාවයි..." (රත්නපාල, 2003:42)

ආදිවාසීන්ගේ විවාහ කටයුතු සිදුවන ආකාරය පිළිබඳ විමසීමේ දී සම්ප්‍රදායක් වශයෙන් වැද්දෝ බාල කාලයේ දී ම විවාහ දිවියට පත්වේ. මෙම සමාජයේ නෑනා මස්සිනා විවාහය බහුලව සිදුවේ. විවාහ කටයුතු සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීම දෙපාර්ශවයේ දෙමව්පියන් අතින් සිදුවේ. විවාහ අපේක්ෂිත තරුණයා පැණිත්, තලගොයි මසුත් රැගෙන තම අනාගත බිරිඳගේ පියා හමුවීමට යෑම සාම්ප්‍රදානුකූලව සිදුවන්නකි. දෙපාර්ශවයේ ම කරුණු කාරණා සාකච්ඡා කිරීමෙන් අනතුරුව වැදි තරුණයා වැදි තරුණියගේ ඉණ වටා රෙදිකඩක් දවටන අතර වැදි තරුණිය තමන් විසින් ම සකස් කළ ලණුවක් තරුණයාගේ ඉන බඳිනු ලබයි. එය ගිවිසගැනීම හා සමාන වන අතර ඉන්පසු සිදුවන්නේ මඟුල් බත කෑමේ චාරිත්‍රයයි. සියලු දෙනා ආහාර භුක්තියෙන් අනතුරුව රැහේ නායකයා විසින් නව යුවලට ආශිර්වාද කරනු ලබයි. එය අවසන් වූ පසු මනාලිය මනාලයා වෙත බාර දීම සිදුවේ. මෙම සාම්ප්‍රදායික ක්‍රමය පමණක් නොව තම අභිමතය පරිදි හොර රහසේ විවාහ වීමේ පුවත් ද ආදිවාසී ජන සමාජයේ දක්නට ලැබේ. දියණියක් දීගෙ දෙනවිට හැළිවළං හා ලබුකැටයක් මවගෙන් සිය බෑනාට ලැබෙන අතර මාමා විසින් දඩයමේ යෑම සඳහා සාවියක් තෑග්ගක් වශයෙන් දෙනු ලබයි. එසේ ම දඩයමේ යෑමට අවශ්‍ය කරන උපකරණ ද ලබාදුන් බව සඳහන් වේ. "අතීතයේ තරුණියන් සරණ පාවාදීමේ දී ඇගේ දෙමාපියන් බෑණාට දුන්නක් ඊතලයක් හා බල්ලන් දෙදෙනෙකු තෑගි කිරීමේ සිරිතක් පැවතී ඇත." (බිනරගම, 2013:76)

ආදිවාසී ජන සමාජයේ කිසි විටෙක භාර්යාවන් තම ස්වාමි පුරුෂයා අතහැර යන බවට සාධක හමුවන්නේ නැත. තම පුරුෂයා මියගිය කළ වැන්දඹුවක් වන කාන්තාව

ඇගේ සැමියාගේ සහෝදරයා සමඟ නැවත විවාහ වීම සිදුවේ. එසේ සොහොයුරෙකු නොසිටි විට අවිවාහක තරුණියක් ලෙස වෙනත් පුරුෂයෙකු සමඟ විවාහ වීමට කාන්තාවට පුළුවන්කම ලැබේ. සොහොයුරන් දෙදෙනෙකුගේ හෝ සොහොයුරියන් දෙදනෙකුගේ දුවාදරුවන් අතර විවාහ සිදු නොවේ. මේ ආකාරයෙන් වැදි සමාජයේ විවාහ කටයුතු සිදුකරන ආකාරය දක්නට ලැබේ.

එසේ ම වැදි ජනතාව කිසියම් පුද්ගලයෙකු මියගිය පසු ඔහුගේ අවමංගල්‍ය කටයුතු සිදුකරන ආකාර පිළිබඳව ද විමර්ශනය කළයුතු වේ. පුද්ගලයෙකු මියගිය විට එම මළ සිරුර ගල්ලෙන තුළ අතහැර යාමේ සිරිතක් වැද්දන් සතුව ඇත. මළ සිරුර මිය ඇදුණු ආකාරයෙන් ම කොළ අතුවලින් වසා දමනු ලබයි. එමෙන්ම මළ සිරුරේ පපුවමත ගලක් තැබීමේ සිරිතක් ද වැද්දන් තුළ ඇත. එසේ වසා තබා හැකි ඉක්මනින් එම ගල් ලෙනෙන් පිටවනු ලබයි. ඉන් අනතුරුව වසර කිහිපයක් ගතවීමෙන් පසු නැවත ගල්ලෙන තුළට පැමිණ ඇට කැබැලි ආදිය ඉවත්කර දමා නැවත එම ගල්ලෙනෙහි පදිංචි වේ. එමෙන්ම වැද්දෙකු පණ අදිමින් සිටින විට දී කුරාලය නම් ලී මැස්සක් උඩ තබා, සිටින ස්ථානයෙන් ඈතකට ගෙනයාම සිදුකරයි. එලෙස මියයන තැනැත්තා වළකට දමා පසෙන් වසා ඒ මතට ගල් පෙරලනු ලබයි. බින්තැන්නේ වැද්දන් කඳන් පොතුවල මළ මිනිය ඔතා ලී මැස්සක් මත තබා වනයට ගෙන ගොස් දැමීම ද සිදුකර ඇත. එය මිනිය කැලේගැසීම ලෙස හඳුන්වයි. කල්යත්ම මොවුන් ගහකින් දෙනක් කපා ඒ තුළ මිනිය බහා වළ දැමීම ද සිදුකර ඇති අතර නූතනය වන විට ලෑලිවලින් තැනූ මිනී පෙට්ටිවල මිනිය බහා වැළලීම සිදුකරනු ලබයි.

ආදිවාසී ජන සමාජය තුළ දක්නට ලැබෙන අස්පර්ශිත උරුමයේ තවත් එක් පැතිකඩකි එම වැසියන් විසින් සාම්ප්‍රදායිකව සිදුකරනු ලබන ශාන්තිකර්ම. යකුන් යකිණියන් ආදි තමන්ගේ නමින් මියගිය ඥාතීන් ඇදහීම මොවුන්ගේ ප්‍රධාන ක්‍රියාවකි. මෙම ශාන්තිකර්ම ද මළවුන් පිදීම සඳහා ද තමන්වෙත පැමිණෙන උවදුරු වළක්වා ගැනීමටත්, දඩයම සරුසාර කරගැනීමටත්, ලෙඩරෝග දුරුකරවා ගැනීම පිණිස සිදුකරනු ලබයි. මෙම සමාජයේ ශාන්තිකර්ම රාශියක් දැකගත හැක. එලෙස දැකගත හැකි ශාන්ති කර්ම අතර නෑ යකුන් පිදීම, කිරි කොරහා නැටීම, ඊතලේ නැටුම, දොළ යක් නැටුම, බඹර යක් නැටුම, පට්ටා යක් නැටුම, වාන් ගත යක් නැටුම, කොළ මඩුව, හැද්මේ නැටුම, කඩඉම් නැටුම, හඟලේ පනම, මිරිස්සේ මුල, පැහැදුන් යැදීම, රුවල නැටුම, අවාන නැටුම යන ශාන්ති කර්ම ප්‍රධාන වේ. මෙම ශාන්තිකර්මයන් උක්ත ප්‍රධාන අරමුණු මෙන්ම විවිධ වූ තේමාවන් යටතේ සිදුකරන බව දැකගත හැකිය. උදාහරණ ලෙස ගර්භනීය මව්වරුන් සඳහා පැහැදුන් යැදීම, පට්ටා යක් නැටුම, හඟලෙ පනම, තුන්පාලි යකුන්ට මැතිරීමත්, රාහු යක් නැටුම

බඹර පැණි ලැබීම පිණිස ද ඊතලේ නැටුම දඩයම් ලැබීම සඳහා ද සිදුකරනු ලබයි. මෙම ශාන්තිකර්ම ද ඒ ඒ ප්‍රදේශවලට ආවේණික වූ ලක්ෂණ පෙන්නුම් කරයි. මීළගට විමසිය යුතු වැදගත් තේමාවක් වන්නේ ආදීවාසීන්ගේ ජන සාහිත්‍යය පිළිබඳවයි.

ආදිවාසීන් ප්‍රවේණිගතව රැකගෙන එන ජන සාහිත්‍යය ගද්‍ය හා පද්‍ය යන ද්විත්වයෙන් ම සුපෝෂිත වේ. වැදි ජන ගී අර්ථ රසයෙන් හා ශබ්ද රසයෙන් ද ගීතවත් බවින් ද  යුක්ත වේ. පද වැලක ආකාරයෙන් මෙම ගී යුක්ත වන අතර ඒවා රටාවකට ගායනා කිරීමෙන් අලංකාරවත් බව සාදාගනී. සිව් පද කවි විරලය. එසේම යාතුකර්ම සිදුකිරීමේ දී ගද්‍ය කොටස් භාවිතයට ගනු ලබයි. ආදිවාසීන් තම එදිනෙදා ජීවිතයේ නොයෙකුත් අරමුණු මුලික කොටගෙන මෙම සාහිත්‍යය ප්‍රයෝජනයට ගන්නා බව අනාවරණය වේ. යාතුකර්ම ගී. දරු නැලවිලි ගී. බඹර ගී. වෙදකම හා බැදුණු කවි. යනාදි පද්‍ය වර්ග දක්නට ලැබේ. ගද්‍ය කොටස් ද විවිධ වූ නාද රටා, ශබ්ද උච්ඡාවචනයන් අනුව භාවිත කිරීමට වැද්දන්ට මනා කුසලතාවක් ඇත.

ඈත අතීතයේ සිට ම සොභාදහම සමඟ බද්ධ වී කටයුතු කරන වැද්දන් තම වෛද්‍ය ප්‍රතිකාර සිදුකිරීම සඳහා යොදාගනු ලබන්නේ අවට පරිසරයේ ඇති ශාක කොටස්ය. වනයේ ඇති සියලුම ශාක විවිධ වූ රෝග නිවාරණය පිණිස භාවිත කරනු ලබයි. එසේම මන්තර මැතිරීම මඟින් ද රෝග නිවාරණය සිදුකළ හැකිබව ආදිවාසීන්ගේ අදහසයි. වැද්දන් විශ්වාස කරන ආකාරය අනුව රෝග කාරක ඇතිවීමට බලපාන හේතු සාධක 06 ක් ගවේෂණ කටයුතුවල දී සොයාගැනීමට හැකිවූ බව දයානන්ද බිනරගම මහතා තම ආදිවාසීන්ගේ කලාව කෘතියේ දක්වා තිබේ. (බිනරගම, 2013:79) ඒවා නම් අනවින හූනියම් සිදුකිරීම, ඇස්වහ කටවහ හෝ වහවල බලපෑම, තහංචි කැඩීම, දුෂ්ට බලවේග ඇඟ තුලට රිංගා ගැනීම, යකුන් භූතයන් දෙවියන් හා මළගිය ප්‍රාණකාරයන්ගේ බලපෑම, ආත්මය අවතැන් වීම හෝ පලා යෑම. යනුවෙනි.

වැද්දන් ඉහත කාරණා තුළින් සිදුවන විවිධ වූ රෝගාබාධ ආදිය සිදුවී ඇත්තේ කවර කරුණක් පදනම් කොටද යන්න නිශ්චිත කරගනු ලබන්නේ පේන බැලීමෙනි. වැදි සමාජය තුළ පේන බැලීමේ ක්‍රම 18ක් පමණ පවතී. පේන බැලීම තුළින් යම්කිසි පුද්ගලයෙකු රෝගාබාධ වූ අයුරු මෙන්ම තම එදිනෙදා සිදුවන විවිධ ක්‍රියාකාරකම් සිදුවූයේ කවර කරුණක් පදනම් වී ද ඒ සඳහා කළයුතු පිළියම් ද දැනගැනීමට හැකියාව පවතී. එසේ දැනගත් පසු ශරීරයට බෙහෙත් දීමෙන්, පිටතින් ආලේපනය කිරීමෙන්,  සෙත් ශාන්ති, යන්ත්‍ර මන්ත්‍ර කටයුතු සිදුකිරීමෙන් ද පිදවිලි හා යාතිකා කිරීමෙන්, දෙහි කැපීමෙන් කායික මානසික රෝගාබාධයන් සමනය කරගත හැකි බව වැදි ජනතාවගේ මතයයි. වනය තුල ජීවත්වීමේ දී බහුලව වන සතුන්ගෙන්

විවිධ වූ හානි සිදුවේ. ඒ අවස්ථාවල දී තම පරම්පරාවෙන් උරුම වූ අත් බෙහෙත් ප්‍රයෝජනයට ගනු ලබයි. උදාහරණයක් ලෙස සර්පයන් දෂ්ට කිරීම් සිදුවූ අවස්ථාවල නිදි පොළොන් විෂට නිදිකුම්බා කොළ සහ වහතැල්ලා කොළ එක පමණ ගෙන දෙහි ඇඹුලෙන් අඹරා දෂ්ටකළ මුඛයේ බැඳීම, නාග විෂට හබරල අල, හොඬල අල, තුඹ කරවිල කොළ සහ වහතැල්ල කොළ දෙහි ඇඹුලෙන් ගල ගා දෂ්ඨ කළ මුඛයේ බැඳීම සිදුකරනු ලබයි. සර්පයෙකු දෂ්ඨ කළ පුද්ගලයෙකු රැගෙන එන ආකාරය බලා දෂ්ඨ කළ සර්ප වර්ගය කීමට සර්ප විෂ වෙදැදුරන් සමත් වේ. එය දූත ලක්ෂණය ලෙස හඳුන්වයි. එසේම කෑ සතා සොයාගැනීමට අපහසු නම් කෑ වෙලාව අනුව සර්පයා හඳුනාගැනීම හා විෂ නැගීම හා විෂ බැසීම පිළිබඳ දැනගැනීමේ හැකියාවක් ද රෝගීන්ට නස්න කිරීමෙන් දිවට දැනෙන රසය පදනම් කරගෙන නිවැරදිව ප්‍රතිකාර කිරීමට වෙදදුරන්ට හැකියාව ඇත. මෙම වෛද්‍ය ප්‍රතිකාර පුද්ගල ශරීරයට අතුරු ආබාධ ඇති නොකරයි. එසේම අත්දුටු වූත් ප්‍රත්‍යක්ෂ වූවක් ද වේ. වැදි ජනතාව මන්තර ප්‍රයෝජනයට ගනු ලබයි. වෙදකම සඳහා පමණක් නොව වනසතුන් පලවා හැරීම, ආහාර පාන ලබාගැනීම, මිනිසුන් වශී කරගැනීම, ආදිය සඳහා මන්තර භාවිත කරන බව දැකගත හැකිය. එසේ ම වැදි සමාජයේ ඔවුනගේ සිරිත් විරිත්, තාක්ෂණික ක්‍රමවේදයන්, ආහාර කල්තබා ගැනීම් ක්‍රම, ආහාර වර්ග, අභිචාර විධි, දඩයම් ක්‍රම, කෙම් ක්‍රම, නිතිරීති, කලා නිර්මාණ ආදිය ද අස්පර්ශිත උරුමය යටතේ සාකච්ඡා කළ හැක.

**සාරාංශය**

සමස්ථයක් ලෙස ගත්කළ ගම්‍ය වන්නේ ආදිවාසී ජන සමාජය තුළ ඉතා වටිනා අස්පර්ශිත උරුමයන් පවතින බවයි. මෙම අස්පර්ශිත උරුමය ප්‍රවේණිගතව පැවත එන අතර වර්තමානය වන විට මෙම උරුමය ක්‍රමයෙන් වියෙකෙමින් පවතී. මීට ප්‍රධානතම හේතුව වන්නේ වැද්දන් ද ක්‍රමයෙන් ග්‍රාමීයකරණයට ලක්වීමයි. එසේ වුව ද යම් තරමින් හෝ තම අනන්‍යතාවයන් නිසි පරිදි සුරක්ෂිත කරගැනීමට ආදිවාසීන් යුහුසුළු වේ. මෙම සංක්ෂිප්ත අධ්‍යයනයෙන් ආදිවාසීන්ගේ භාෂාව, ජනශ්‍රැති, ද්වාර කර්ම, වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම, ශාන්තිකර්ම, පිළිබඳව යම් අවබෝධයක් ලබාගත හැකිවේ. මෙම උරුමය ශ්‍රී ලාංකික ආදිවාසීන්ගේ සුවිශේෂීතාව ලොවට හෙළිකරන තවත් එක් තොතැන්නක් ලෙස පෙන්වාදිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

රත්නපාල, ඊ.එම්. (1973). ලංකාවේ වැද්දො. වරකාපොලः ආරිය ප්‍රකාශකයෝ.

ගුනවර්ධන, ප්‍රිශාන්ත. (2004). පුරාණ ගම. හෙට්ටිගම/ජා-ඇලः සමන්ති ප්‍රකාශකයෝ.

නොක්ස්, රොබට්. (2008). එදාහෙළදිව. කොලඹः ඇම්.ඞී. ගුනසේන සමාගම.

පෙරේරා, තිස්සන්ක. (2009). වැද්දෝ. කොලඹः ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

බිනරගම, දයානන්ද. (2013). ආදිවාසීන්ගේ කලාව. කොලඹः ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

ලොකුහේවා, සඳරුවන්. (2009). බින්තැන්නේ වැද්දෝ. නුගේගොඩः සරසවි ප්‍රකාශකයෝ.

දේවිකා ජයතිලක, යසාංජලී. (2009). ආදිවාසී සමාජය. කර්තෘ ප්‍රකාශනයකි.

විජේසේකර, එන්. (1998). වැද්දන්ගේ විකාශන ක්‍රම. කොළඹः සංස්කෘතික කටයුතු අමාත්‍යංශය.

# මොරටුව ශුද්ධ වූ එම්මානුවෙල් පල්ලියේ ඔරලෝසු කණුව ආශ්‍රිතව කාර්මික පුරාවිද්‍යා උරුමය විමසීම

**ඒ.එල්.බී.එම්. අමරසිංහ**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය,

කැලණිය විශ්වවිද්‍යාලය.

buddhikamadhuwanthi1234@gmail.com

***සංක්ෂේපය***

*කාර්මික පුරාවිද්‍යාව විෂයක් වශයෙන් පුරාවිද්‍යාවට සම්බන්ධ වන්නේ ක්‍රි.ව 1950න් පසුව ය. කෙසේ නමුත් නූතන තාක්ෂණික ප්‍රවර්ධනයන්ගේ මුල් කාලීන කාර්මික අවශේෂ අධ්‍යයනය කරනු ලබන විෂයක් වන මෙහිදී වසර 50ක් තරම් පමණ පැරණිවන වස්තූන් කාර්මික පුරාවස්තුවක් ලෙස නම් කර ඇත. ප්‍රවාහන පුරාවිද්‍යාව, සන්නිවේදන පුරාවිද්‍යාව, සිවිල් ඉංජිනේරු විද්‍යාව, යාන්ත්‍රික පුරාවිද්‍යාව, වාස්තු විද්‍යාව ආදී ක්ෂේත්‍ර ඔස්සේ කාර්මික පුරාවිද්‍යා විෂය පථය විහිදී ඇත. ඒ අනුව ඔරලෝසු කණු ද කාර්මික උරුමයක් ලෙස වැදගත් වේ. මෙහිදී වසර 160ක පමණ ඉතිහාසයකට උරුමකම් කියන මොරටුව ශුද්ධ වූ එම්මානුවෙල් පල්ලියේ කාර්මික උරුමය වන ඔරලෝසු කණුව වෙත අවධානය යොමු කොට ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ඔරලෝසු කණුවේ කාර්මික අගය හඳුනාගැනීමයි. ඒ අනුව එම්මානුවෙල් පල්ලියේ ඔරලෝසු කණුවෙහි කාර්මික අගයක් ඇත්ද? යන්න මූලික ගැටලුව බවට පත් විය. මෙම පර්යේෂණය සඳහා මූලික වශයෙන් පුස්තකාල ගවේෂණය, ක්ෂේත්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදයන් භාවිතයට ගැනුණි. ස්වංක්‍රීයව නාදවන සීනු 03ක් හා අතින් ඇද නාද කරන සීනුවකින් සමන්විත මෙම ඔරලෝසුව බ්‍රිතාන්‍ය සමාගමක අගනා නිමයුමකි. පල්ලියේ ම කොටසක්ව පවතින මෙම ඔරලෝසු කණුව නිතර ම නඩත්තු කිරීමට ලක්වන අතර ඉතා හොඳ තත්ත්වයකින් යුක්තව වර්තමානය දක්වා පැවත එන අතර අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස එම්මානුවෙල් පල්ලියේ ඔරලෝසු කණුව අගනා කාර්මික උරුමයක් බව හඳුනාගැනීමට හැකි විය.*

***මූඛ්‍ය පද*** *- උරුමය, ඔරලෝසු කණුව, එම්මානුවෙල් පල්ලිය, කාර්මික, සීනු*

## හැඳින්වීම

දානපති ජොරෝනිස් ද සොයිසා මහතා විසින් ඉදිකළා වූ ශුද්ධ වූ එම්මානුවෙල් පල්ලිය විවිධ හේතු නිසා ම ඉතා සුවිශේෂී ස්මාරකයක් ලෙස පෙන්වා දිය හැකිය. ඒ අතරින් පල්ලියේ ඔරලෝසු කණුව ප්‍රමුඛ ස්ථානයක් හිමි කර ගනී. වර්ෂ 1860 කාලයේ ලංකාවේ වඩාත් උස ම කණුවක් ලෙස සැලකූ මෙම ඔරලෝසු කණුව පල්ලියට ඉදිරියෙන් පල්ලියේ ම කොටසක් ලෙස පිහිටා ඇත. අලු පැහැයෙන් වර්ණ ගන්වා ඇති මෙහි මුදුනත පැරණි ඔරලෝසුව පිහිටා ඇත. මෙම ඔරලෝසු කණුව මිනිත්තු 15න් 15ට නාද වන කුඩා සීනු දෙකකින් හා පැයකට වරක් නාද වන එක් සීනුවකින් හා අතින් ඇද නාද කළ හැකි එක් විශාල සීනුවකින් හා ඔරලෝසුවකින් සමන්විත වේ. එකල ලංකාවේ කුළුණු ඔරලෝසු නිපදවීමේ තාක්ෂණයක් නොවූ බැවින් හා පාලන පන්තිය විදේශිකයන් වූ නිසාවෙන් මෙහි ඇති ඔරලෝසුව හා සීනු විදේශයන්ගෙන් ආනයනය කරන ලද ඒවා වේ. මින් මිනිත්තු 15කට වරක් නාද වන සීනු දෙක හා පැයකට වරක් නාද වන සීනුව මෙන්ම ඔරලෝසුව අයත් වන්නේ ද Gillett & Johnston (Croydon) යන බ්‍රිතාන්‍ය සමාගමටයි. අතින් ඇද නාද කළ හැකි විශාල සීනුව පමණක් Cowgill Jones & Marsden (Liver pool) සමාගමට අයත් වේ. තවමත් ක්‍රියාකාරී මට්ටමක පවතින බැවින් කාර්මික පුරාවිද්‍යා උරුමයක් ලෙස මොරටුව ශුද්ධ වූ එම්මානුවෙල් පල්ලියේ ඔරලෝසු කණුවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.

## ක්‍රමවේදය

මින් පෙර කිසිවෙකුගේ අවධානය මෙම මොරටුව ශුද්ධ වූ එම්මානුවෙල් පල්ලියේ ඔරලෝසු කණුව වෙත යොමු නොවී තිබීම හේතුවෙන් දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය වශයෙන් පුස්තකාල ගවේෂණයෙන් ලබාගත හැකි වූ තොරතුරු ප්‍රමාණය අල්ප වූ අතර ප්‍රධාන වශයෙන් දත්ත රැස් කිරීමට ක්ෂේත්‍ර ගවේෂණය හා සම්මුඛ සාකාච්ඡා යන ක්‍රමවේදයන් භාවිතා කෙරුණි. දේවස්ථානය භාර ප්‍රධාන දෙවගැති ගරු එඩ්‍රියන් ආරොන්, සහායක දෙවගැති ගරු පී.එස්. කොස්තා, දේවස්ථානයේ ආවතේවකරු නිමල් ප්‍රසන්න මහතා යන්නවුන් සම්මුඛ සාකාච්ඡා සඳහා යොදා ගැනුණි. මෙහිදී රැස් කර ගන්නා ලද දත්ත ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කිරීම මඟින් වඩාත් නිවැරදි ලෙස පර්යේෂණ අරමුණ කරා යොමු වීමට හැකියාව ලැබුණි.

**දේවස්ථානයේ ඉතිහාසය**

එම්මානුවෙල් දේවස්ථානය පිළිබඳ අවධානය යොමු කිරීමට පෙර මොරටුව ඇංග්ලිකානු සභාව පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. මොරටුව ඇංග්ලිකානු සභාවේ ඉතිහාසය වර්ෂ 1799 දක්වා දිව යයි. ශුද්ධ වූ එම්මානුවෙල් දෙව් මැඳුරට පිටුපසින් වර්තමාන සොහොන් භූමිය පිහිටි ස්ථානයේ 1675 සිට වර්ෂ 140ක් පැරණි ඕලන්ද ගොඩනැගිල්ලක් විය. එම ගොඩනැගිල්ල පාසලක් වශයෙන් භාවිතා වූ අතර 1799 සිට දේව මෙහෙයන් පැවැත්වීමට ද එය උපයෝගී කරගෙන ඇත. වර්ෂ 1815 දී මෙම ගොඩනැගිල්ල බිඳ දමා මොරටුවේ පළමු ඇංග්ලිකානු දෙව් මැඳුර ඉදිකිරීමේ වැඩ කටයුතු ආරම්භ කර ඇත. එම දේවස්ථානය ඉදිකිරීම ආණ්ඩුකාර රොබට් බ්‍රවුන්රිග්ගේ අනුග්‍රහය යටතේ ඉදිවුණු අතර එතුමා ද මුදල් පරිත්‍යාග කර ඇති නිසා ම එය ''බ්‍රවුන්රිග් පල්ලිය'' නමින් කා අතරත් ප්‍රකට විය. ඉංග්‍රීසි පාලන සමය වුවත් මෙම දෙව් මැඳුරේ සියලු කටයුතු සිංහල භාෂාවෙන් සිදු කෙරුණි.

1857 ජනවාරි 4 වැනි දින වාසල මුදලි ජොරෝනිස් ද සොයිසා එවකට සිටි කොළඹ බිෂොප් ජේම්ස් චැප්මන්තුමාණන් වෙත ආයාචනය කරමින් කියා සිටියේ අබලන් වූ ''බ්‍රවුන්රිග් පල්ලිය'' කඩා එවකට සුසාන භූමියට යාබද අක්කර එකහමාරක පමණ ඉඩමේ නව දෙව් මැඳුරක් ගොඩනඟා එම ඉඩම හා ගොඩනැගිල්ල ත්‍යාගයක් ලෙස එංගලන්ත සභාවට පැවරීමට ආණ්ඩුකාර තුමන්ගෙන් ඉල්ලා සිටින ලදී. ජොරෝනිස් ද සොයිසා මහතාගේ ඉල්ලුම් පත්‍රය කොළඹ බිෂොප්තුමාණන් නිර්දේශ කළ පසු 1857 ජනවාරි 31 වන දින ආණ්ඩුකාරතුමා විසින් එම යෝජනාවට ලිපියකින් අවසර දෙන ලදී. ඒ අනුව 1857 දෙසැම්බර් මස 27 වන දින බිෂොප්තුමාණන් වූ ජේම්ස් චැප්මන් විසින් ශුද්ධ වූ එම්මානුවෙල් දෙව් මැඳුරේ මුල්ගල තබන ලදී. මෙම දෙව් මැඳුර ගොඩනැගීමේ වියදම පවුම් 5338 හා සිලිම් 5 ක් විය. මෙම කාර්යය උදෙසා ප්‍රධාන වශයෙන් මුදලින් ආධාර කරන ලද්දේ ජොරෝනිස් ද සොයිසා හා ඔහුගේ සොහොයුරු සුසෙව් ද සොයිසා ය. 1860 දෙසැම්බර් මස 18 වන දින අංක 11956 දරණ ඔප්පුවෙන් වාසල මුදලිඳු ජොරෝනිස් ද සොයිසා විසින් කොළඹ පළමු වන බිෂොප්තුමාණන් වූ චැප්මන්තුමාට දෙව් මැඳුර හා ඉඩම පවරා දෙන ලදී. එමෙන්ම 1860 දෙසැම්බර් 27 වන දින බිෂොප් චැප්මන් විසින් ශුද්ධ වූ එම්මානුවෙල් දේවස්ථානය කැප කරන ලද්දේය (150 වන සැමරුම් කලාපය-9 පිට).

**දේවස්ථානයේ වාස්තු විද්‍යාත්මක අගය**



*ඡායාරූපය 01*

ශ්‍රී ලංකාවේ විශාලතම දෙව් මැඳුරු වලින් එකක් වන ශුද්ධ වූ එම්මානුවෙල් දේවස්ථානය ගොතික් ගෘහ නිර්මාණ සම්ප්‍රදායට අනුව ගොඩනගන ලද්දකි. මෙම අනර්ඝ නිර්මාණයෙහි සැලසුම සකස් කොට ඇත්තේ කලක් ලංකාවේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂකවරයකු ලෙස කටයුතු කළ තෝමස් මේජර් ස්කිනර් මහතාය. මෙම ගොඩනැගිල්ලේ දක්නට ඇති විශේෂ ලක්ෂණය වන්නේ පල්ලිය ඉදිරිපිට ඇති ටවරය යි. අඩි 120 ක් පමණ උස් වූ මෙම ටවරය ඔරලෝසු කණුවකි. එහි මුදුනට ගිය පසු මොරටුව හා තදාසන්න ප්‍රදේශය හොඳින් දැක බලා ගත හැක. ඕගනය සඳහා වූ කුඩාගාරයත්, ඉන් අඩි 10ක් උඩින් පිහිටා ඇති ඝණ්ඨා ස්ථම්භයත්, ඔරලෝසුව සුසර කිරීමේ කොටසුත් පිහිටා ඇත්තේ මෙම ටවරට තුළය. එයට පිවිසීමට කවාකාර පඩිපෙලක් ටවරයට පහළින් පල්ලිය ඇතුළත පිහිටා ඇත.

ගොතික් නිර්මාණ ශිල්පයට අනුව ඉදිකළා වූ මෙම පල්ලියෙහි දිග අඩි 105ක් වේ. තව ද පිටතට නෙරා ඇති අතු දෙකත් සමඟ පළල අඩි 84ක් වේ. මණ්ඩපයේ පියස්ස අලංකාර කුළුණු මත සවි කරන ලද ආරුක්කු 6ක් උඩ පිහිටා ඇත. මෙම ආරුක්කු සඳහා භාවිතා කිරීමට ලී ගෙනවිත් ඇත්තේ බුරුමයෙන් ය. ආරුක්කු 6 දරාගෙන සිටින කුළුණු පමුණුගමින් ගෙනෙන ලද තනි ගලෙන් නෙළන ලද ඒවා වේ (150 වන සැමරුම් කලාපය-08 පිට). තව ද එහි පියස්ස කැටයම් සහිත ය. එම ගලින් ම කරන ලද ශුද්ධස්ථානයේ කවුළුව කොයි රටක හෝ කළ හැකි කාර්මික

ශිල්පයේ උසස්ම අංගයක් වෙයි. ඉංග්‍රීසි ආසන දෙව් මැඳුරකට සූදානම් කරන ලද්දක් මෙන් වූ සම්පූර්ණ කවුළු රාමුව හා එහි අතුරු කොටස් ඉතා සියුම් ලෙසත්, අලංකාර ලෙසත් නෙළා ඇත. එංගලන්තයෙන් ගෙන්වා සවි කර ඇති වර්ණ චිත්‍ර වීදුරුව දේවස්ථානයේ අලංකාරය දෙගුණ තෙගුණ කරවයි.

පල්ලියේ ඇතුළත වාසල මුදලි ජොරෝනිස් ද සොයිසා විසින් පල්ලිය ඉදිකළ බව දැක්වෙන විශාල කිරිගරුඬ පුවරුවක් දක්නට ඇති අතර එය එංගලන්තයෙන් ගෙන්වන ලද්දක් බව එහි ඇති සමාගම් ලාංඡනය සාක්ෂි දරයි. මේ ආදී වශයෙන් පල්ලිය නිර්මාණය කිරීමට ගත් බොහෝ දේවල් විදේශයන්ගෙන් ආනයනය කර ඇති බව පල්ලියේ වර්තමාන භාරකරුවන් පවසති.

**කුළුණු ඔරලෝසුව හා එහි කාර්මික උරුමය**

ඉතා අගනා කාර්මික උරුමයක් වන මෙම කුළුණු ඔරලෝසුව පල්ලිය නිර්මාණය වූ කාලයේ ම නිර්මාණය කරන්නට ඇත. නමුත් ඔරලෝසුවට අයත් සීනුවල වර්ෂ 1910 සටහන් වීමෙන් පෙනී යන්නේ ඔරලෝසුව සවිකර පසුකාලීනව සීනු සවිකළ බව හෝ මුලින් සවිකළ සීනු පසුකාලීනව නවීකරණය කළ බවයි. කෙසේ නමුත් පල්ලියේ ඉදිකිරීම සම්බන්ධයෙන් පැරණි තොරතුරු පල්ලියේ වර්තමාන භාරකරුවන් සතුව නොවූ බැවින් ඒ පිළිබඳව වැඩියමක් තොරතුරු සපයාගත නොහැකි විය. මිනිත්තු 15න් 15ට නාද වන සීනු 2ක් හා පැයකට වරක් නාද වන එක් සීනුවක් අන්තර්ගත මෙම ඔරලෝසුවේ නිර්මාතෘ සමාගම Gillett & Johnston (Croydon) සමාගම වේ. එම සීනු වල සඳහන් වන්නා වූ වර්ෂය වන්නේ 1910 වේ. ඒ අනුව එම සීනු 1910 වර්ෂයේ නිපදවන ලද ඒවා විය යුතුය.





*ඡායාරූපය 02 හා 03*

ඔරලෝසුවේ තාක්ෂණය සම්බන්ධයෙන් ගත්විට මෙය වයින් කරන ඔරලෝසුවක් වන අතර දින 04කට වරක් ඔරලෝසුවට යොදා ඇති බර ඉහළට ඇද වයින් කිරීම අනිවාර්ය වේ. එම කාර්යය සඳහා පුද්ගලයකු පල්ලිය විසින් යොදවා ඇති අතර ඔහු විසින් දින 04කට වරක් දඟරාකාර පඩිපෙළ ඔස්සේ ඔරලෝසු කණුවට නැඟ ඔරලෝසුව වයින් කිරීමේ කටයුතුවල නිරත වේ. සීනු නාද වන සෑම වාරයක් පාසා ම ඔරලෝසුවට දෙපසින් බොලොක්ක ආධාරයෙන් එල්ලෙන බර පහතට ගමන් කිරීම සිදු වේ. එම නිසා ම සීනු නාද වීමට නම් බර ඉහළට යෙදවීම දින 04කට වරක් සිදුකළ යුතුය.

මෙසේ ඔරලෝසුවට දෙපසින් එල්ලෙන බර වල වම්පස කිලෝ ග්‍රෑම් 25ක යකඩ රවුම් 6ක් ඇති අතර ඒ අනුව වම්පස මුළු බර කිලෝ ග්‍රෑම් 150ක් වේ. දකුණුපස එවැනි කිලෝ ග්‍රෑම් 25ක යකඩ රවුම් 7ක් ඇති අතර එහි මුළු බර කිලෝ ග්‍රෑම් 175ක් වේ. ඔරලෝසුව වයින් කිරීම සඳහා වෙනම යතුරක් ඇති අතර, එම යතුර ඔරලෝසුව ක්‍රියා කරවන යන්ත්‍රයට සවිකර ඔරලෝසුව වයින් කිරීම සිදු කරයි. ඔරලෝසු හා සීනු නිෂ්පාදනයේ ප්‍රමුඛ සමාගමක් වන Gillett & Johnston (Croydon) සමාගම විසින් නිෂ්පාදිත මෙම ඔරලෝසුව තවමත් ඉතා හොඳ ක්‍රියාකාරී මට්ටමේ පවතින විශිෂ්ට ගණයේ ඔරලෝසුවකි.

*ඡායාරූපය **04** හා **05**- දෙපස එල්ලන බර හා ඔරලෝසුව වයින් කිරීම*

සීනු සම්බන්ධයෙන් ගත් විට වයින් කළ පසු මිනිත්තු 15න් 15ට නාද වන සීනු 2 හා පැයකට වරක් නාද වන සීනුව ස්වක්‍රීයව නාද වන අතර, අතින් ඇද නාද කළ හැකි සීනුව පහළ සිට ම ලණුවක ආධාරයෙන් නාද කළ හැක. පල්ලියේ විශේෂ අවස්ථාවල දී හා මංගල්‍ය උත්සව අවස්ථාවල දී එම සීනුව නාද කරවනු ලබයි. එම අතින් ඇද නාද කළ හැකි විශාල සීනුව පමණක් Cowgill Jones & Marsden (Liver pool) සමාගමට අයත් වේ. එහි වර්ෂ 1849 සඳහන් වන අතර එනම් එම සමාගම 1849 දී ආරම්භ කරන ලද්දක් හෝ එය 1849 දී නිපදවන ලද සීනුවක් විය හැක. එම සමාගම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

## Gillett & Johnston Croydon සමාගම




*ඡායාරූපය 06 හා 07- ස්වංක්‍රීයව නාද වන සීනු*

වර්ෂ 1844 දී ආරම්භ කරන ලද පෞද්ගලික කර්මාන්ත ශාලාවක් වන මෙය සීනු හා ඔරලෝසු නිපදවීමේ අරමුණින් ඇරඹූවක් වෙයි. මෙම සමාගමේ නිර්මාතෘවරයා ලෙස සලකනු ලබන්නේ William Gillett මහතාය. වර්ෂ 1844 සිට 1950 දක්වා මොවුන් කුළුණු ඔරලෝසු 14000 ක් පමණ නිර්මාණය කර ඇත. Gillett & Johnston සමාගමේ ස්වර්ණතම යුගය ලෙස හඳුන්වනු ලබන්නේ වර්ෂ 1920 සිට 1930 දක්වා කාලයයි. මූලික වශයෙන් සීනු, කුළුණු ඔරලෝසු හා කැරිලොන් නිපදවන මෙම සමාගමෙහි නිෂ්පාදන ලෝකය පුරා බෙදා හැර තිබේ. තව ද සමාගමේ මූලස්ථානය වශයෙන් පැවත ඇත්තේ එක්සත් රාජධානියේ සරේහි ක්‍රොයිඩන් ය. වර්තමානයේ ද අනුප්‍රාප්තික සමාගමක් විසින් Gillett & Johnston නාමය යටතේ සරේහි බ්ලෙචින්ග්ලි අඛණ්ඩව ඔරලෝසු සෑදීම හා ඔරලෝසු/ කැරිලන් අලුත්වැඩියා කටයුතු වල නිරත වේ.

ක්‍රි.ව 1844 දී විලියම් විසින් ආරම්භ කළ මේ සමාගමට 1854 දී චාල්ස් බ්ලැන්ඩ් හවුල්කරුවෙකු ලෙස එක් වී ඇත. ඉන්පසු Gillett & Bland නමින් සමාගම පවත්වාගෙන යන ලදී. 1884 දී බ්ලැන්ඩ් මිය ගිය පසු නව හවුල්කරු වශයෙන් 1877 දී Arthur A. Johnston සමාගමට එක් වීමත් සමඟ Gillett & Johnston නමින් නාමය වෙනස් විය. 1916 දී ආතර් මිය යාමත් සමඟ ඔහුගේ පුත් Cyril Fredrick Johnston සමාගමේ නව හවුල්කරු විය. සීනු නාද කරවීමේ න්‍යාය දෙස අවධානය යොමු කළ ඔහු එම පැතිකඩ වඩාත් පුළුල් ලෙස වැඩි දියුණු කර ඇත. සිරස් සුසර කිරීම පිළිබඳ අවධානය යොමු කළ ඔහු පල්ලියේ සීනු නාද කිරීමේ ක්‍රම වලට වඩා

වෙනස් සුසර කිරීමේ සංකීර්ණතා පෙන්නුම් කළ කැරිලොන් නිෂ්පාදන කෙරෙහි ද අවධානය යොමු කර ඇත. මෙම Gillett & Johnston සමාගම විසින් නිපදවූ ලොව පුරා දක්නට ඇති කුළුණු ඔරලෝසු හා සීනු පහත පරිදි වෙන් කර දක්වා පෙන්විය හැක.

**Gillett & Johnston සමාගමෙන් නිකුත් කළ ලොව පුරා ඇති සීනු වලින් කිහිපයක්**

- Rings of 9 bells for Reading Town Hall, Berkshire, 1879-1881
- Chime of 8 bells for St Bartholomew's Church, Dublin, 1881
- Ring of 10 bells for Wimborne Minster, Dorest, 1911
- Carillon of 23 bells for the Metropolitan United Church, Toronto, Ontario, Canada, 1921
- Recasting of "Bow Bells'', Church of St Maryle-Bow, London, 1933. These bells were destroyed by enemy action in 1941.
- Carillon for Bournville, Birmingham, 1934
- Ring of 12 bells for Croydon Parish Church (now Croydon Minister), 1936
- Recasting of 10 bells for St Philip's Cathedral, Birmingham, 1937
- The Freedom Bell, Rathaus Schoneberg, Berlin, Germany, 1950. The 10- ton bell was a gift from Americans to the city of Berline as a symbol of anti – communism.
- The carillon of 36 bells in the tower of the Kirk of St Nicholas in Aberdeen was replaced with 47 bells in 1950
- Carillon for the Beaumont Tower, Michigan State University, 1957

**Gillett & Johnston** සමාගමෙන් නිකුත් කර ඇති ලොව පුරා දක්නට ඇති කුළුණු ඔරලෝසු වලින් කිහිපයක්

- Sarajevo Clock Tower, Sarajevo, 1873
- Clock for Manchester Town Hall, Manchester, 1879
- Estacao Cultura railway station, Campinas, Brazil, 1888

- Old City Hall, Toronto, Ontario, Canada, 1900
- Torre Monumental, Buenos Aires, 1916
- Braintree Town Hall, Braintree, 1927
- Clock for Selfridges, Oxford Street, London 1931
- Clock for Shell Mex House, London, 1932 (the largest public clock in London)
- Clock for Tabriz City Hall, Tabriz, Iran, 1934

**Cowgill Jones & Marsden (Liver pool) සමාගම**

මෙම Cowgill Jones & Marsden සමාගමට අයත් අතින් ඇද නාද කළ හැකි විශාල ප්‍රමාණයේ සීනුවක් ශුද්ධ වූ එම්මානුවෙල් පල්ලියේ ඔරලෝසු කණුවේ දක්නට හැක. ටවරයේ ඉහළින් අනෙක් සීනුත් සමග රඳවා ඇති මෙම විශාල සීනුව පහළ සිට නාද කළ හැකි වන ලෙස දිගු ලණුවක් සවිකර ඇත. කෙසේ වුවත් විශාල සීනුව අයත් වන මෙම සමාගම වර්තමානය වන විට ක්‍රියාකාරී මට්ටමේ නොමැති හෙයින් තොරතුරු සපයා ගැනීම අපහසු ය.

]



*ඡායාරූපය 08 - අතින් ඇද නාද කළ හැකි විශාල සීනුව*

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ඉහත තොරතුරු කෙරෙහි අවධානය යොමු කරන විට වර්ෂ 1860 සිට 2020 දක්වා වසර 160ක පමණ ඉතිහාසයකට හිමිකම් කියන මෙම එම්මානුවෙල් ඔරලෝසු කණුව ලංකාවේ අගනා කාර්මික උරුමයක් ලෙස පෙන්වා දිය හැකිය. බ්‍රිතාන්‍ය සමාගමකට අයත් කුළුණු ඔරලෝසුව, ස්වයංක්‍රීයව නාදවන සීනු ත්‍රිත්වය හා අතින් ඇද නාද කල හැකි සීනුවක් සහිත මෙම ඔරලෝසු කුළුණේ වාස්තු විද්‍යාත්මක අලංකාරය ද එහි වටිනාකම තවදුරටත් වැඩි කිරීමට සමත්ව ඇත. අවසාන වශයෙන් ලංකාවේ කිතුනු සංස්කෘතික උරුමයක් මෙන්ම කාර්මික උරුමයක් ලෙස ද මොරටුව එම්මානුවෙල් දේවස්ථානයේ ඔරලෝසු කණුව වැදගත්කමක් උසුලන උරුමයක් ලෙස නම් කළ හැක.

**ආශ්‍රිත මූලාශ්‍ර**


මෙහෙයුම් කාරක සභාව, (1985) මොරටුව ශුද්ධ වූ එම්මානුවෙල් දේවස්ථානයේ 125වන සාංවත්සරික සමරුව, සංස්කාරක මණ්ඩලය විසින් ප්‍රකාශිත

මෙහෙයුම් කාරක සභාව, (2010) මොරටුව ශුද්ධ වූ එම්මානුවෙල් දේවස්ථානයේ 150වන සාංවත්සරික සමරුව, සංස්කාරක මණ්ඩලය විසින් ප්‍රකාශිත

Luke. wilson59, 25 sep 2022 (last edit), Gillett & Johnston, Wikipedia, https://en.wikipedia.org/wiki/Gillett_%26_Johnston

GB Web Marketing, 2012-2019, Featured clocks, Gillett & Johnston, https://www.gillettjohnston.co.uk

https;//www.towerbells.org

# ශ්‍රී ලංකාවේ ස්වභාවික උරුම කළමනාකරණය තුළ වනාන්තර සංරක්ෂණය කිරීමේ වත්මන් නෛතික යාන්ත්‍රණයේ කාර්යභාරය

**එස්. ආර්. එල්. රෝසා**
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ, බාහිර කථිකාචාර්ය,
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ruchirarosa@gmail.com

***සංක්ෂේපය***

*ඉන්දියානු සාගරයේ පිහිටි භූමි ප්‍රමාණය අතින් කුඩා දිවයිනක් වුවද විවිධ දේශගුණික, කාලගුණික, භූවිද්‍යාත්මක සාධකයන් පදනම්ව ස්වභාවිකව නිර්මාණය වී ඇති වනාන්තර පද්ධති රැසක් ශ්‍රී ලංකාවේ ස්වභාවික උරුමයන් අතර හඳුනාගත හැක. වර්තමානයේ ස්වභාවික උරුමයන්ගේ විනාශයට මානව ක්‍රියාකාරකම් ප්‍රධානත ම හේතුවක් වන බැවින් ස්වභාවික උරුමයන්ට තර්ජනයක් වන මානව ක්‍රියාකාරකම් පාලනය කිරීමට ශක්තිමත් නීතියක පැවැත්ම අත්‍යවශ්‍ය සාධකයකි. මෙරට නීතිය පිළිබඳ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ වනාන්තර ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් නෛතික යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වන අතර ඒ ඔස්සේ වනාන්තර ආරක්ෂා කිරීමේ දී මෙරට නීතියේ පවතින දුර්වලතාවයන් හඳුනාගනිමින් අනාගත නීති සංශෝධනයන් සිදු කිරීමේ දී අවධානය යොමු කළ යුතු තත්වයන් පිබඳව නිර්ණායකයන් හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. මෙහිදී නීතිය පිළිබඳ මූලාශ්‍ර වශයෙන් ව්‍යවස්ථා, නඩු තීන්දු, අන්තර්ජාතික සම්මුතීන් ආදිය අධ්‍යයනය කරමින් සමාජ විද්‍යා පර්යේෂණයන් හි දී යොදාගනු ලබන දත්ත රැස් කිරීමේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කර ඇත. බ්‍රිතාන්‍ය පාලන සමයේ සම්පාදනය කරන ලද 1907 අංක 16 දරණ කැළෑ ආඥා පනත ප්‍රමුඛව 1937 අංක 02 දරණ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත, 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත, 1988 අංක 03 දරණ ජාතික උරුම වන භූමි පනත, ආදී වශයෙන් වන සංරක්ෂණය සඳහා ඍජු හා වක්‍ර වශයෙන් දායක කර ගත හැකි ව්‍යවස්ථා ගණනාවක් මෙරට නීති පද්ධතිය තුළ හඳුනාගත හැක. අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති, ජනගහණ වර්ධනය, ජනාවාසකරණය, නාගරීකරණය, වගා කටයුතු හේතුවෙන් වනභූමි විනාශ වීම දිනෙන් දින ඉහළ යන අතර එහි අනාගත අවධානම පිළිබඳ සැළකිය යුතු අවධානයක් යොමු කරන බවක් නොපෙනේ. පවත්නා නීතිය වුවද ක්‍රියාත්මකවීමේ දී අක්‍රමිකතා හඳුනාගත හැක. එබැවින් වන සංරක්ෂණ නීති ව්‍යවස්ථා සඳහා වරින් වර සංශෝධනයන් සිදු වුවද වර්තමාන තරඟකාරී ලෝකය තුළ සීඝ්‍ර සංවර්ධන ඉලක්කයන් කරා ගමන් කිරීමේදී තිරසර සංවර්ධනය පෙරදැරිව ස්වභාවික වනභූමි සඳහා වන හානිය අවම කිරීමට නව නීති සම්පාදනය කිරීමත්, ජාත්‍යන්තර නීති තත්වයන් හා මාර්ගෝපදේශ අනුගමනය කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වැනි ප්‍රබල නීතියක හා ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවන් ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් මෙරට නෛතික යාන්ත්‍රණය සවිබල ගැන්විය යුතුය.*

***මුඛ්‍ය පද:*** *වනාන්තර, සංරක්ෂණය, නීතිය, ව්‍යවස්ථා*

## හැඳින්වීම

ස්වභාවිකව නිර්මාණය වූ ජෛව විද්‍යාත්මක වශයෙන් වැදගත්කමක් දරණ ජීවී අජීවී වස්තූන්ගෙන් සමන්විත පරිසර පද්ධතියක් ස්වභාවික උරුමයක් වශයෙන් සරලව අර්ථකථනය කළ හැක. වනාන්තර, එකී ස්වභාවික උරුමයන් අතුරින් ගොඩබිම පිහිටි සුවිශේෂී පරිසර කලාපයක් වශයෙන් හඳුනාගත හැකි අතර විවිධ පාරිසරික තත්වයන් පදනම්ව එකී වනාන්තතරයන්හි ස්වභාවය සහ සැකැස්ම විවිධාකාර වේ. ඒ අනුව මෙරට ප්‍රධාන භූවිෂමතා කලාප වන තෙත් කලාපය, වියළි කලාපය සහ ශුෂ්ක කලාපය තුළ කඳුකර වනාන්තර, උප කඳුකර වනාන්තර, පහතරට වැසි වනාන්තර, තෙත් මෝසම් වනාන්තර, වියළි මෝසම් වනාන්තර, ගංගාධාර වනාන්තර, කඩොලාන වනාන්තර ආදී වශයෙන් වනාන්තර වර්ග රැසක් හඳුනාගත හැක. වනාන්තරයන්හි තිබෙන ගස් වර්ග විනාශ කිරීමෙන් වළක්වා ගැනීම වන සංරක්ෂණය වන අතර මෙම වනාන්තර පද්ධතීන් ආරක්ෂා කිරීම සඳහා මෙරට නෛතික යාන්ත්‍රණය තුළ 1907 අංක 16 දරණ කැළෑ ආඥා පනත, 1937 අංක 02 දරණ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත, 1988 අංක 03 දරණ ජාතික උරුම වන භූමි පනත ප්‍රධාන වශයෙන් භාවිත වේ. වෙනස් වන සමාජ ආර්ථික රටාවන් හේතුවෙන් මානව ක්‍රියාකාරම් සීඝ්‍ර වශයෙන් වර්ධනය වීම සාමාන්‍ය තත්වයක් වුවද එය පමණ ඉක්මවා සමාජයට හා පුද්ගලයන්ට බාධාවක් වන අවස්ථාවන්හි දී නීතිය මැදිහත් විය යුතුය. එහිදී නීතිය වනාන්තර විනාශය පිළිබඳ කාලීන ගැටළු කෙරෙහි විමසිලිමත් වෙමින් මානව හැසිරීම් හා උරුම කළමනාකරණය තුලනාත්මකව පවත්වාගෙන යා යුතුය.

## ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ ස්වභාවික උරුම ක්ෂේත්‍රය තුළ හඳුනාගනු ලබන වනාන්තර පද්ධතීන් ආරක්ෂා කිරීම සඳහා වන නෛතික යාන්ත්‍රණය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මඟින් සිදු කරනු ලබයි. මෙහිදී මූලිකවම පුස්තකාල අධ්‍යයනයන් හරහා වනාන්තර සංරක්ෂණයට අදාළ නීතිය එනම් ව්‍යවස්ථා, අධිකරණ තීරණ මෙන්ම ජාත්‍යන්තර නෛතික තත්වයන් කෙරෙහි අවධානය යොමු කරමින් මෙරට නෛතික යාන්ත්‍රණයේ වත්මන් තත්වය පිළිබඳ දත්ත රැස් කරන අතර පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සමාජ විද්‍යා පර්යේෂණයන්හි බහුලව භාවිත කරනු ලබන ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය භාවිත කරනු ලබයි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

මෙරට ස්වභාවික උරුමයන් ආරක්ෂා කරගැනීමේ ඉතිහාසය රාජධානි යුගය දක්වාම දිවයන අතර පාර්ලිමේන්තු සම්ප්‍රදායන් යටතේ ව්‍යවස්ථා සම්පාදනය කිරීම බ්‍රිතාන්‍ය යටත් වී විජිත පාලන සමයේ ආරම්භ විය. ව්‍යවස්ථා පැනවීමෙන් මානව හැසිරීම් පාලනය කරනු ලබන අතර එහිදී *'Culpae poena par esto'* එනම් අපරාධයේ බරපතලකමට ලබා දෙන දඬුවම සමාන විය යුතුය යන ආප්තය මත යම් වරදකට අදාළ නීතිය මඟින් ලබා දෙන දඬුවම ඉන් සිදු වූ හානිය පූර්ණය කරන්නක් විය යුතුය.

ජාතික උරුම වනභූමි පනතේ 12 වගන්තිය මඟින් පනත යටතේ සිදුකරන වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙසීයකට නොඅඩු වූ රුපියල් විසි දහසකට නොවැඩි දඩයකට හෝ හය මාසයක් දක්වා බන්ධනාගාර ගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් කිරීම, කැලෑ ආඥා පනතේ 7 (අ) (1) වගන්තිය යටතේ සංරක්ෂිත වනාන්තරයක දී (ආ) යම් ශාකයක් ගසක් හෝ වෙනත් වන නිෂ්පාදනයක් බිම හෙළන, (ඊ) යම් ශාකයක් විනාශ කරන හෝ ශාකයකට යම් අලාභයක් හෝ හානි සිදුකරන, (ක) සංරක්ෂිත වනාන්තරයක ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක පදිංචිව සිටින (ග) යම් ස්ථානයක් එළිකරන (ච) යම් ගින්නක් දල්වන හෝ දල්වා තබන හෝ ගින්දර රැගෙන යාම (ට) යම් පාර තනන ආදී වැරදි සඳහා අවුරුදු දෙකකට නොඅඩු අවුරුදු හතරකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීම කළ හැක. තවද 1995 අංක 23 දරන සංශෝධන පනත මඟින් ආඥා පනතේ 21 වන වගන්තිය සංශෝධන කරමින්, සිදු කරනු ලබන වැරදි සඳහා රුපියල් දෙදහස් පන්සීයකට නොඅඩු රුපියල් විසි පන්දහසකට නොවැඩි දඩයකින් හෝ අවුරුද්දකට නොඅඩු හා අවුරුදු හතරකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමක් ආදී වශයෙන් දණ්ඩන ඉහළ දැමීමක් සිදු කර ඇත. එසේම වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනතේ 6 (1) වගන්තිය යටතේ ජාතික උද්‍යානයක් ස්වභාවික රක්ෂිත භූමියක්, වන පිවිසුමක් තුළ (ඇ) යම් පැළෑටියක් කැපීම හානි කිරීම, (ඌ) කැලෑවක් අලුතෙන් එළි කිරීම, (ඒ) යම් පාරක් හෝ අඩි පාරක් තැනීම, (ඔ) යම් සංචාරක් හෝටලයක් ඉදිකිරීම, පාලනය කිරීම ආදී වැරදි සම්බන්ධවයෙන් වරදක් කරන තැනැත්තෙකු අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීමකට යටත් වන බව දක්වයි. ඉහත පරිදි වනාන්තර විනාශ කිරීම පිළිබඳ නෛතික තත්වයන් දක්වා ඇති ව්‍යවස්ථා මඟින් පනත යටතේ සිදු කරන වැරදි සඳහා දඬුවම් ලබා දුන්න ද ඉන් ස්වභාවික පරිසරයට සිදු වන හානිය යථාවත් කළ හැකි ද යන්න විවාදාත්මකය.


ස්වභාවික උරුමයන්ගෙන් ආරක්ෂාව සම්බන්ධයෙන් මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දක්වන්නා වූ නෛතික තත්වය විමසා බැලීමේ දී, ජනතාවගේ යහපත තකා රජය විසින් පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කොට වැඩි දියුණු කළ යුත්තේය (ආ.ක්‍ර.ව්‍ය. ශ්‍රී ලංකාව, VI පරිච්ඡේදය, 27 (14), වගන්තිය), ස්වභාව ධර්මය සහ ස්වභාවික සම්පත් රැකගැනීම ද ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තෙකුගේ ම යුතුකම වන්නේය (ආ.ක්‍ර.ව්‍ය. ශ්‍රී ලංකාව, 28 (ඊ) වගන්තිය) වශයෙන් දක්වා ඇත. එය පොදු අර්ථකථනයකට පමණක් සීමා වී ඇති ආකාරය නිරීක්ෂණය කළ හැක.

උරුම කළමනාකරණයෙ දී ලෝකයේ විවිධ රාජ්‍යයන්ගේ පිහිටි උරුමයන් ජාත්‍යන්තර වශයෙන් සුරක්ෂිත කොට පවත්වාගෙන යාම සඳහා පාර්ශවකාර රාජ්‍යන්ට මාර්ගෝපදේශයක් සපයන්නා වූ ප්‍රධානතම ජාත්‍යන්තර නෛතික ලේඛනය වශයෙන් 1972 යුනෙස්කෝ ලෝක උරුම සම්මුතිය පෙන්වා දිය හැකි අතර 1980 සිට ශ්‍රී ලංකාව ද එම සම්මුතියේ පාර්ශවකරුවෙකු ලෙස කටයුතු කරයි. සම්මුතියේ 1 හා 2 වගන්තීන් යටතේ සංස්කෘතික උරුම සහ ස්වාභාවික උරුම වශයෙන් උරුමයන් දෙයාකාරයකින් හඳුනාගනු ලබයි. එහි ස්වභාවික උරුමයන් යන්න

- සෞන්දර්යාත්මක හා විද්‍යාත්මක වශයෙන් වැදගත් වන්නා වූ විශ්වීය වැදගත්කමකින් යුත් ස්වභාවික ලක්ෂණයන්ගෙන් සමන්විත භෞතික හා ජීවවිද්‍යාත්මක සැකසුම්
- විශ්වීය වැදගත්කමකින් යුත් භූ විද්‍යාත්මක සහ භෞතික විද්‍යාත්මකව වැදගත්කමක් දරන්නා වූ සතුන් සහ ශාක
- ස්වභාව සෞන්දර්යයෙන් සමන්විත වන්නා වූ විශ්වීය වැදගත්කමකින් ස්වභාවික පරිශ්‍රයන් (යුනෙස්කෝ ලෝක උරුම සම්මුතිය,1972, 2 වගන්තිය)

වශයෙන් අර්ථ නිරූපණය කර ඇත. සම්මුතියේ පාර්ශවකාර රාජ්‍යයක් වශයෙන් ලෝකය තුළ ශ්‍රී ලංකාවේ උරුමයන්ට ලැබී ඇති ඉහළම පිළිගැනීම යුනෙස්කෝ ලෝක උරුම ලැයිස්තුව යටතේ මෙරට උරුමයන් අටක් ලෝක උරුම වශයෙන් නම් කිරීම දැක්විය හැක. ඒවා අතර 1988 දී සිංහරාජ රක්ෂිත වනාන්තරයත් 2010 දී ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයත් ස්වභාවික ලෝක උරුම වශයෙන් නම් කොට ඇත. මෙම පරිශ්‍රයන් දෙකම ලෝක උරුම බවට පත්වීමට බලපා ඇත්තේ වනාන්තර පද්ධතිය සහ ඒ ඔස්සේ නිර්මාණය වී ඇති ජෛව විවිධත්වයයි.

ලෝක උරුම සම්මුතියේ 5 වගන්තිය මගින් පාර්ශවකාර රාජ්‍යයන් තම භූමිය තුළ හඳුනාගන්නා සංස්කෘතික හා ස්වභාවික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා හැකි සෑම අවස්ථාවක දී ම කාර්යක්ෂම සහ ක්‍රියාකාරී පියවර ගැනීම කළ යුතු බවත් එහිදී උරුමයන් හඳුනාගැනීම ආරක්ෂා කිරීම සංරක්ෂණය සඳහා අවශ්‍ය නීතිමය, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන හා මූල්‍යමය කටයුතු සඳහා පියවර ගැනීම, එම කටයුතු වෙනුවෙන් ජාතික හෝ ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීම (යුනෙස්කෝ ලෝක උරුම සම්මුතිය, 1972, 5 (ඇ) වගන්තිය) ආදී වශයෙන් පාර්ශවකාර රාජ්‍යයයන් සතු නීති සම්පාදනය කිරීමේ වගකීම අවධාරණය කරයි. වර්තමානයේ දී නීතිය ක්‍රියාත්මක වීම පිළිබඳ අවධානය යොමු කිරීමේ දී යුනෙස්කෝ ලෝක උරුමයක් වන සිංහරාජ වන අඩවියට මායිම්ව සහ පරිවාර වනාන්තර ආශ්‍රිතව සිදු වූ කැළෑ එළිකිරීම් සහ මාර්ග පද්ධතීන් සකස් කිරීම, විල්පත්තු ජාතික වනෝද්‍යානය ආශ්‍රිතව සිදු වූ වන විනාශය සහ අවිධිමත් ජනාවාස පිහිටුවීමේ ව්‍යාපෘතීන්, මෙරටින් වඳ වී ගොස් ඇතැයි සැළකූ නමුත් ගම්පහ දාරළුව ප්‍රදේශයෙන් හමු වූ පණු කරඳ ශාකය අධිවේගී මාර්ග පද්ධතියක ඉදිකිරීම් හේතුවෙන් කපා ඉවත් කිරීමට සූදානම් වීම ශ්‍රී ලංකාව තුළ පසුගිය කාල වකවානුව තුළ වනාන්තර සහ ශාක විනාශ කිරීම සම්බන්ධයෙන් වැඩි වශයෙන් ආන්දෝලනාත්මක කතාබහට ලක්වූ මාතෘකා බවට පත් විය. තවද පටු දේශපාලන අරමුණු වෙනුවෙන් අනවසරයෙන් වනාන්තර එළි කරමින් ඒවා මානව ජනාවාසකරණයට යොදා ගැනීමට හෝ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් යොදා ගැනීමේ ප්‍රවණතාවන් ද වත්මන් සමාජය තුළ ගැටළුවක් බවට පත්ව ඇත.





***Source:*** *https://www.globalforestwatch.org/dashboards/country/LKA/*

දේශපාලන බල අධිකාරියේ මැදිහත්වීම්, විද්‍යාත්මක පසුබිමක් තුළ නොසිට ව්‍යාපෘති ආරම්භ කිරීම හා අනුමැතිය ලබා දීම, මානව අවශ්‍යතා සඳහා කෙටි කාලීන විසඳුම් ලබා ගැනීමට කටයුතු කිරීම ආදි තත්වයන් හේතුකොටගෙන මෙරට බොහෝ පාරිසරික ගැටළු නිර්මාණය වන ආකාරය නිරීක්ෂණය කළ හැක. නීතිය මඟින් ද පවත්නා ව්‍යවස්ථාවක ප්‍රතිපාදන යටතේ එම ගැටළු නිරාකරණය කිරීමට උත්සහ දරයි. නමුත් ව්‍යවස්ථාපිත නීති අදාළ කොට වරදකරුවන්ට දඬුවම් දීමට පමණක් සීමා නොවී නව නීති සම්පාදනය කරමින් වඩාත් ප්‍රායෝගික හා අනාගතය අභිවෘද්ධිය සඳහා ද ස්වාධීන හා අපක්ෂපාතී කැපවීමක් රටක නෛතික යාන්ත්‍රණය තුළින් ඉටු විය යුතුය.

අන්තර්ජාතික වශයෙන් මෙම අනාගත දැක්ම මනාව පිළිබිඹු වන අවස්ථාවක් වශයෙන් පිලිපීන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 1993 වසරේ දී තීරණය කරන ලද Oposa v. Factoran, (G.R. No. 101083, 224 S.C.R.A. 792 (1993) නඩු තීරණය පෙන්වා දිය හැක. පිලිපීනයේ බාලවයස්කරුවන් පිරිසක් නියොජනය කරමින් ඔවුන්ගේ දෙමාපියන් කිහිප දෙනෙකු විසින්, පිලිපීනයේ එවකට පැවතුන දැව බලපත්‍ර ගිවිසුම් අවලංගු කර නව බලපත්‍ර නිකුත් කිරීම නවත්වන ලෙසට පරිසර හා ස්වභාවික සම්පත් දෙපාර්තමේන්තුවට එරෙහිව මෙම නඩුව ගොනු කරමින් ඔවුන් ප්‍රකාශ කර සිටියේ සිදුවන වනාන්තර විනාශය සහ පරිසරයට වන හානිය මඟින් සමතුලිත හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීම සහ සෞඛ්‍යයට ඇති අයිතිය පිළිබඳ පිලිපීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 සහ 16 වගන්ති මඟින් දක්වා ඇති අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවයි. තවදුරටත් පෙත්සම්කරුවන් කියා සිටියේ ඔවුන් තම පරම්පරාවේ මෙන්ම තවමත් නූපන් පරම්පරාවන් ද නියෝජනය කරන බවයි. මෙහි තීන්දුව මඟින් වත්මන් පරම්පරාව අනාගත පරම්පරාව මෙන්ම නූපන් පරම්පරාව වෙනුවෙන් ද පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම පිළිබඳ නව පාරිසරික සංකල්පයක් ඇති කළේය.

එසේම නීතියේ නවමු දැක්මක් සඳහා තවත් නිදසුනක් වශයෙන් වන සම්පත ආරක්ෂා කිරීමේ රාජ්‍ය සතු වගකීම මැනවින් අවබෝධ කර ගනිමින් රටේ උත්තරීතරම නීතිය වශයෙන් සැලකෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ම එය තහවුරු කර ඇති රාජ්‍යයක් වශයෙන් භූතානය පෙන්වා දිය හැක. ඛනිජ සම්පත්, ගංගා, විල් සහ වනාන්තර පිළිබඳ අයිතිවාසිකම් රජයට පැවරිය යුතු අතර ඒවා නීතියෙන් නියාමනය කරනු ලබන රජයේ දේපල වන බවත් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1 ව්‍යවස්ථාව, භූතාන අධිරාජ්‍ය, 12 වගන්තිය), රටේ ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම සහ පරිසර පද්ධතිය හායනය වැලැක්වීම සඳහා, භූතානයේ මුළු භූමි ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හැටක ප්‍රමාණයක් සදාකාලිකව ම වනාන්තර

ආවරණය යටතේ පවත්වාගෙන යා යුතු බවට රජය සහතික විය යුතු බවත් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 5 ව්‍යවස්ථාව, පරිසරය, 3 වගන්තිය) රටේ ඕනෑම ප්‍රදේශයක් ජාතික වනෝද්‍යානයක්, වනජීවී රක්ෂිතයක්, ස්වභාව රක්ෂිතයක්, සංරක්ෂිත වනාන්තරයක්, ජෛවගෝල රක්ෂිතයක්, ජල පෝෂක ප්‍රදේශයක් සහ එවැනි වෙනත් ප්‍රදේශයකට ආරක්ෂාව සැලසීම සඳහා පාර්ලිමේන්තුවට නීති සම්පාදනය කළ හැකි බවත් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 5 ව්‍යවස්ථාව, පරිසරය, 5 වගන්තිය) භූතාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දක්වා ඇත. ලෝකයේ රාජ්‍යයක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා වනාන්තර ආරක්ෂා කිරීම සඳහා ලබා දී ඇති ඉහළම පිළිගැනීම මෙය වන අතර එය ලේඛනගත හුදු නෛතික ප්‍රතිපාදනයක් පමණක් බවට පත් නොකොට ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කර ගැනීමට ද භූතානය සමත්ව ඇත.




***Source:****(https://data.worldbank.org/indicator/AG.LND.FRST.ZS?contextual=region&end=2020&locations=BT-LK&start=1990&view=chart)*

තවද තරඟකාරී ඉලක්කයන් හඹා යන වත්මන් මානව සමාජය තුළ පරිසරය මෙන්ම මානව අභිලාෂයන්ද නිවැරදිව කළමනාකරණය කළ යුතුය. අන්තර්ජාතික වශයෙන් පරිසරය හා මානව හිමිකම් අතර සම්බන්ධතාවය මුලින්ම පිළිගන්නා ලද 1972 ස්ටොක්හෝම් ප්‍රකාශනයේ මිනිසාට යහපත් පැවැත්මක් හා වැඩ කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ආර්ථික හා සාමාජීය සංවර්ධනය අත්‍යවශ්‍ය වන

අන්තර්ජාතික අවධානයට ලක් කළේය. එමෙන්ම මිනිසාගේ ජීවන තත්වය නඟා සිටුවීමට ද එය අත්‍යවශ්‍ය වන බවත් පරිසරය ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යයන් විසින් නිවාරණ මූලධර්ම අනුගමනය කළ යුතු බවත් බරපතල හෝ යථා තත්ත්වයට පත්කළ නොහැකි තර්ජනයන් පරිසරයට ඇති විට අවශ්‍ය විද්‍යාත්මක දැනුම නොමැති වීම යන්න පාරිසරික හානි වැළැක්වීමට පියවර ගැනීම කල් දැමීම හෝ සඳහා හේතුවක් නොවන බවත් (15 වගන්තිය, 1992 රියෝ ප්‍රකාශනය) 1992 රියෝ සමුළුවේ දී අවධාරණය කර ඇත. තවද මහජන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් දූෂකයා දූෂණයේ පිරිවැය දැරිය යුතු ප්‍රවේශය (16 වගන්තිය, 1992 රියෝ ප්‍රකාශනය) ද වැරදි සඳහා දඬුවම් ලබාදීමේ දී භාවිත කළ හැක. විල්පත්තු වන විනාශය පිළිබඳ විල්පත්තු නඩුවේදී (CA Writ 2091/2015) මෙම දූෂකයා වන්දි ගෙවිය යුතු යන්න අවධාරණය කරමින් තවදුරටත් එහිදී ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අර්ථකථනය කර ඇති පරිදි දූෂකයා ගෙවීම් මූලධර්මය යන්නෙන් අදහස් කරන්නේ පරිසරයට සිදුවන හානිය පිළිබඳ පරම වගකීම යටතේ පරිසර දූෂණයට ගොදුරු වූවන්ට වන්දි ගෙවීමට පමණක් නොව පාරිසරික හායනය යථා තත්ත්වයට පත් කිරීමේ පිරිවැය දක්වා ද එය විහිදෙන බවයි. හානියට පත් පරිසරයට පිළියම් යෙදීම තිරසාර සංවර්ධන ක්‍රියාවලියේ කොටසක් වන අතර, ඒ අනුව, දූෂකයා තනි පුද්ගල පීඩාවට පත් වූවන්ට පිරිවැය මෙන්ම හානියට පත් පරිසර පද්ධතියේ හානිය ආපසු හැරවීමේ පිරිවැය ගෙවීමට බැඳී සිටින බව ප්‍රකාශ කරන ලදී.

නීතිය තුළ වර්ධනය වන මහජන භාර සංකල්පය ද මෙම ස්වභාවික උරුම සංරක්ෂණයේ දී භාවිත කළ හැකි තවත් සාධනීය සංකල්පයකි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම ඇතුලත් හය වන පරිච්ඡේදයේ 27 (2) (ඉ) වගන්තිය ප්‍රකාරව පොදු ජන යහපත ඉවහල් වන පරිදි ප්‍රජාවගේ භෞතික සම්පත් හා සමාජ ඵලය සියලු පුරවැසියන් අතර සමාන ලෙස බෙදා හැරීම රජය විසින් සිදුකළ යුතුය. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් නඩු තීන්දු හරහා මහජන භාර සංකල්පය අර්ථ දැක්වීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනතා පරමාධිපත්‍ය දැක්වෙන 3 වන හා 4 වන වගන්තීන් ද සමානාත්මතා සංකල්පයන් අවධාරණය කරන 12 වන වගන්තියත් යොදාගෙන ඇති බව දැකිය හැක. බුලන්කුලම සහ තවත් අය එ. කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් සහ තවත් අය (2000 3 Sri L.R. 243) නඩුවේ දී අමරසිංහ විනිසුරුතුමා විසින් මහජන භාර සංකල්පය අර්ථ දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වන ව්‍යවස්ථාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් දැක්වෙන බවත් ඒ තුළ මහජනතාව යනු පරම ස්වාධිපතයන් වන බවත් රජය එකී බලය තාවකාලිකව රඳවා ගන්නේ පමණක් බවත් ය. ඒ අනුව රජයට මහජන යහපත පිණිස ස්වභාවික සම්පත් සුරක්ෂිත කිරීමට

යුතුකමක් පවතින බවත්ය. Hungary v. Slovakia (1997 RFE/RL) නඩුවේ දී අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් මෙම නෛතික තත්ත්වය සාකච්ඡා කර ඇත. ඒ අනුව වනාන්තර විනාශයේ දී, වස්ථාදායකය හා විධායකය හා විසින් මහජන භාර සංකල්පය කඩ කරමින් කටයුතු කරන අවස්ථාවන්හි දී එකී අත්තනෝමතික තීරණ මඟින් වන හානිය වැලැක්වීම සඳහා මහජන භාර සංකල්පයේ පවතින හරයාත්මක වටිනාකම් අවධාරණය කරමින් මෙරට අධිකරණයන්ට වනාන්තර විනාශයට එරෙහිව මැදිහත්වීමේ හැකියාව පවතී.

**නිගමනය සහ නිර්දේශ**

වන විනාශය ගස් කපා දැමීම මඟින් පමණක් සිදු නොවන අතර වනාන්තර ආශ්‍රිතව සිදු වන්නා වූ සංචාරක කටයුතු විශේෂයෙන් දේශීය සහ විදේශීය සංචාරකයින් විසින් වනාන්තර නැරඹීම සඳහා එම පරිශ්‍රයන්ට ඇතුළු වීම, වන භූමි ආශ්‍රිත විනොදාස්වාද ක්‍රියාකාරකම්, කූඩාරම් ගැසීම්, ගිනි මැල ගැසීම්, ආහාර පිසීම්, පොලිතින් ඇතුළු අපද්‍රව්‍ය වනභූමි තුළට මුදා හැරීම, දේශීය ආවේණික ශාක නීති විරෝධී ලෙස රටින් පිටමං කිරීමේ ව්‍යාපාර,  ආදිය ද මෙයට ඇතුළත් වේ. එබැවින් වනාන්තර ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ සංචාරක කටයුතු පිළිබඳව ද නීතිය නවමු මානයකින් අවධානය යොමු කළ යුතුව ඇත. මෙහිදී සංචාරක කටයුතු ප්‍රවර්ධනයට බාධා නෙකළ යුතු නමුත් වනාන්තර සහ ආරක්ෂිත කලාපයන් ආශ්‍රිතව සංචාරක කටයුතු විධිමත් පාලනයක් යටතේ පවත්වා ගැනීම කෙරෙහි සැළකිලිමත් විය යුතුය.

වර්තමාන විසිඑක් වන සියවස තුළ රාජ්‍යයන්ගේ පැවැත්ම සඳහා අන්තර්ජාතික සබඳතා මත ඉදිරියට ගමන් කරන බැවින් නෛතික ක්ෂේත්‍රය තුළ ද අන්තර්ජාතික නෛතික ප්‍රතිපාදන හා සහයෝගිතාවයන්ද පෙරට වඩා අධ්‍යයනය කරමින් නව නීති සම්පාදන කටයුතු සිදු කළ යුතුව ඇත. මෙරට වනාන්තර විනාශය යනු නීතියේ අවධානය වඩාත් යොමු කළ යුතු කාලීන ගැටළුවක් වන අතර වත්මන් අධිකරණමය ක්‍රිමාර්ගයන්හි දී නීතිය මඟින් වරදකරුවන්ට දඬුවම් පැමිණවීමට එහා ගිය පාරිසරික සංවේදීභාවයකින් යුතුව වත්මන් හා අනාගත පරම්පරාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණ ගත යුතුය. ප්‍රමාණයෙන් කුඩා දිවයිනක් වීමත් දිනෙන් දින වැඩි වන ජනගහණයට සාපේක්ෂව භූමි පරිභෝජනය ඉහළ යාම නිවැරදිව කළමනාකරණය නොකළහොත් වනභූමි සංරක්ෂණය සහ පුද්ගල ඉඩම් භුක්තිය පිළිබඳ ආරවුල් පිළිබඳ නෛතික ගැටළු ඉහළ යාමේ වැඩි ප්‍රවනතාවක් පවතින බවත් දැක්විය හැක. වන සම්පත ආරක්ෂා කිරීමටත් ඒ ඔස්සේ ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර වෙනත් භාවිතාවන්ට නොගැනීම පිණිස ඉඩම් පරිහරණ හා ජනාවාස පිහිටුවීමේ සැලසුම් ප්‍රවර්ධනය කළ යුතුය. තවද

මෙරට ප්‍රජාව තුළ වන සම්පත ආරක්ෂා කර ගැනීමේ අනාගත අවශ්‍යතාව පිළිබඳ සංවේදී මනසක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනයන් විධිමත් අධ්‍යාපන සැළසුම්කරණයන් ඔස්සේ ලබා දීමට කටයුතු කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ


Convention concerning the protection of the World Cultural and Natural Heritage (1972). UNESCO World Heritage Convention

De Zoysa, M. (2001) Review of forest policy trends in Sri Lanka. *Policy Trend Report*

Weeraratna, D. A. P. (2005). Forest Ordinance and Case Law. Printel Pvt Ltd. Pannipitiya

Your Environmental Rights and Responsibilities; A hand Book for Sri Lanka, Environmental Foundation Ltd. (2006). Big Bird Printers. Kaduwela

World Heritage Sites. Protected Areas and World Heritage. (2005). *Sinharaja Forest Reserve Sri Lanka.* United Nation Environment Programme. World Conservation Monitoring Centre.

කරුණාරත්න, හේරත්. (2015). පරිසර ආරක්ෂණ නීතිය. *වන සංරක්ෂණ නීතිය.* විජායි ප්‍රකාශකයෝ. අනුරාධපුරය

සේනාරත්න, පී. ඇම්. (2017). ශ්‍රී ලංකාවේ වනාන්තර. සරසවි ප්‍රකාශකයෝ. නුගේගොඩ

# පාඬිග්ගම වන්නි වැදි ගම්මානය ආශ්‍රිතව පවතින අස්පර්ශිත සංස්කෘතික උරුමයන් සහ ඒවායෙහි වර්තමාන සහ අනාගත පැවැත්ම පිළිබඳ විමර්ශනයක්

**ආර්.ඩී.ඩී. පුෂ්ප කුමාර**
පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය, ශ්‍රී ලංකාව.
dhanushkapushpakumara2069@gmail.com

***සංක්ෂේපය***

*අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 54 හිරල්ලුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි පාඬිග්ගම ගම්මානය අංශ කිහිපයකින් වැදගත්කම් උසුලන ගම්මානයකි. දිවයිනේ වාසය කරන වැදි ජන ප්‍රභේද අතරින් වන්නි වැදි ලෙස ව්‍යවහාර කරන පිරිස මෙම ගම්මානයේ වාසය කරති. ස්පර්ශිත උරුමයන් මෙන්ම අස්පර්ශිත උරුමයන්ගෙන් ද සමන්විත පාඬිග්ගම ගම්මානයේ සංස්කෘතික වටිනාකම් නිවැරදිව අර්ථකථනය කර ගැනීම වැදගත් වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, පාඬිග්ගම ගම්මානයේ පවතින අස්පර්ශිත සංස්කෘතික උරුමය අධ්‍යයනය කිරීම සහ එහි වර්තමාන සහ අනාගත පැවැත්ම පිළිබඳ සාකච්ඡා කිරීමයි. වර්තමානයේ පවතින අභියෝගවලින් අස්පර්ශිත උරුමය ආරක්ෂා කොට ඒවා අනාගතය සඳහා සුරක්ෂිත කිරීම පර්යේෂණයේ අවශේෂ අරමුණකි. වන්නි වැදි ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවය අර්ථකථනය කරගැනීමේ දී පාඬිග්ගම අස්පර්ශිත උරුමය කොතෙක් දුරට ඉවහල් වන්නේ ද? යන්න පර්යේෂණයේ ගැටලුවයි. පර්යේෂණ ක්‍රමවේදයේ දී ප්‍රථමයෙන් වන්නි වැදි ජනතාව පිළිබඳ ලියැවී ඇති ප්‍රාථමික සහ ද්වීතියික සාහිත්‍ය මූලාශ්‍රය හැදෑරීම සිදු විය. අනතුරුව අස්පර්ශිත උරුමයන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්ති සහ මූලාශ්‍රය පරිශීලනය කෙරිණි. සාහිත්‍ය විමර්ශනයෙන් පසුව ක්ෂේත්‍ර ගවේෂණය සිදු වූ අතර එහිදී පාඬිග්ගම ගම්මානයේ ක්ෂේත්‍ර ගවේෂණය කරන ලදී. ක්ෂේත්‍ර ගවේෂණයේ දී ඡායාරූපකරණය, දර්ශන පටිගත කිරීම, සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණය (Participant Observation) ආදී ක්‍රම කිහිපයක් යොදා ගැනීමට සිදු විය. මේ අතරින් ප්‍රාථමික ජන කොට්ඨාස පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී සහභාගීත්ව නිරීක්ෂණයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ඇදහිලි විශ්වාස, ශාන්තිකර්ම, භාෂාව සහ ජනශ්‍රැති වැනි ක්ෂේත්‍ර ආශ්‍රිත ව පවතින අස්පර්ශිත උරුමය අධ්‍යයනය කිරීමේ දී සහභාගීත්ව නිරීක්ෂණය වැදගත් වේ. පාඬිග්ගම ඇදහිලි විශ්වාසවල, දිවයිනේ මහා වැදි සම්ප්‍රදායේ ලක්ෂණ, වන්නි වැදි ජනතාවගේ ලක්ෂණ සහ නුවර කලාවියේ ලක්ෂණ ද අන්තර්ගත වී ඇත. දෙවියන් මායම් වීම, පිදේනි ශාන්තිය, වැද්දා කන්දට දානය දීම වැනි ඇදහිලි විශ්වාස සහ ජනශ්‍රැති, භාෂාව වැනි අස්පර්ශිත උරුමයන් විශාල ප්‍රමාණයක් පාඬිග්ගම ගම්මානයේ පවතී. මෙම අස්පර්ශිත උරුමයන්හි වර්තමාන සහ අනාගත පැවැත්ම පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් ඇති වී තිබේ. එබැවින් පාඬිග්ගම අස්පර්ශිත උරුමය විධිමත්ව අර්ථකථනය කොට එහි වර්තමාන සහ අනාගත පැවැත්ම තහවුරු කිරීම වැදගත් වේ.*

***මුඛ්‍ය පද :*** *අස්පර්ශිත සංස්කෘතික උරුමය, ඇදහිලි විශ්වාස, පාඬිග්ගම, පැවැත්ම, වන්නි වැදි*

**හැඳින්වීම**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 54 හිරල්ලුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි පාඬිග්ගම ගම්මානය වන්නි වැදි ජනතාව ජීවත් වන සාම්ප්‍රදායික ගම්මානයකි. දඹාන ආශ්‍රිත ව දිවයිනේ මහා වැදි සංස්කෘතිය ජීවත් වන අතර ඊට අමතරව තවත් උප වැදි සංස්කෘතීන් කිහිපයක් දිවයින පුරා වාසය කරති. ඒ අතර අනුරාධපුරය ආශ්‍රිත ව වන්නි වැදි ජනතාව ජීවත් වෙති. වන්නි වැදි ජනතාවගේ සංස්කෘතිය ගොඩනැගී ඇත්තේ සම්ප්‍රදායන් කිහිපයක එකතුවෙනි. දඹාන ආශ්‍රිත වැදි සංස්කෘතියේ ආභාසය, වෙනත් වන්නි වැදි ගම්මානවල සංස්කෘතික ආභාසය මෙන්ම නුවරකලාවියේ සංස්කෘතික ආභාසය ද පාඬිග්ගම ගම්මානය වෙත ලැබී තිබේ. මේ නිසා පාඬිග්ගම සංස්කෘතික උරුමය නිවැරදිව අර්ථකථනය කිරීමත් එම උරුමය මතු පරපුරට ආරක්ෂා කර දීමත් නිසැක වශයෙන් සිදු කළ යුතුය. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, පාඬිග්ගම ගම්මානයේ පවතින අස්පර්ශිත සංස්කෘතික උරුමය අධ්‍යයනය කිරීම සහ එහි වර්තමාන සහ අනාගත පැවැත්ම පිළිබඳ සාකච්ඡා කිරීමයි. වර්තමානයේ පවතින අභියෝගවලින් අස්පර්ශිත උරුමය ආරක්ෂා කොට ඒවා අනාගතය සඳහා සුරක්ෂිත කිරීම පර්යේෂණයේ අවශේෂ අරමුණකි.



***ඡායාරූපය 01:** පාඬිග්ගම ගම්මානය*

'උරුමය' පිළිබඳ සාකච්ඡා කිරීමේ දී මුල් කාලයේ ස්පර්ශිත උරුමයට (Tangible Heritage) විශේෂ තැනක් ලැබී තිබිණි. නමුත් 2003 දී අස්පර්ශිත උරුමයන් (Intangible Heritage) පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියක් සකස් කෙරිණි. මේ නිසා

අස්පර්ශිත උරුමය ද රැකිය යුතු උරුමයක් බව ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් විය. අස්පර්ශිත උරුමයන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියෙහි (Convention for the Safeguarding of the Intangible Cultural Heritage) අස්පර්ශිත උරුමය මෙසේ අර්ථකථනය කර ඇත.

“The ‘intangible cultural heritage’ means the practices, representations, expressions, knowledge, skills – as well as the instruments, objects, artifacts and cultural spaces associated therewith – those communities, groups and, in some cases, individuals recognize as part of their cultural heritage. This intangible cultural heritage, transmitted from generation to generation, is constantly recreated by communities and groups in response to their environment, their interaction with nature, and their history, and provides them with a sense of identity and continuity, thus promoting respect for cultural diversity and human creativity.” (Convention for the Safeguarding of the Intangible Cultural Heritage, Article 02, 2003).

පාඬිග්ගම ගම්මානයේ පවතින ඇදහිලි විශ්වාස ආශ්‍රිත ව අස්පර්ශිත උරුමයන් විශාල ප්‍රමාණයක් ගැබ් ව පවතී. දෙවියන් මායම්වීම ශාන්තකර්මය, පිදේනි ශාන්තිය, වැද්දා කන්දට දානය දීම වැනි ශාන්තිකර්ම ආශ්‍රිත ව අස්පර්ශිත උරුමයන් ගැබ් ව පවතී. විශේෂයෙන් ශාන්තිකර්මවල ගැබ්ව පවතින ස්තෝත්‍ර, කවි, ගායනා සහ ශාන්තිකර්මවලට ආවේණික වූ පරිමිත භාෂා රටාව අස්පර්ශිත උරුමයට අයත් වේ. එමෙන්ම පාඬිග්ගම ආශ්‍රිත ව ජනශ්‍රැති කිහිපයක් පවතී. එම ජනශ්‍රැති ඇසුරින් පාඬිග්ගම ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවය මතු නොව සමස්ත වන්නි වැදි ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවය සහ ප්‍රභවය පිළිබඳ අධ්‍යයනය කළ හැකි ය. මේ ආකාරයට පාඬිග්ගම ගම්මානයේ අස්පර්ශිත උරුමයන් රාශියක් පවතින බව පැහැදිලි වේ. පාඬිග්ගම ගම්මානයේ වැඩිහිටි පරම්පරාවෙන් පසුව උරුමය පැවරීමට තරුණ පිරිසක් නොමැති වීම නිසා අස්පර්ශිත සංස්කෘතික උරුමයන්ට විශාල තර්ජනයක් එල්ල වී ඇත. තරුණ ප්‍රජාව ගම්මානයෙන් පිටතට ගොස් රැකියාවල නිරත වීම නිසාත්, ඔවුන් සාම්ප්‍රදායික දැනුම ආරක්ෂා කර ගැනීමට උනන්දුවක් නොදැක්වීම නිසාත් මේ ආකාරයට උරුමය මතු පරපුරට පැවරීමට අභියෝගයක් එල්ල වී ඇත. එබැවින් කඩිනමින් පාඬිග්ගම අස්පර්ශිත උරුමයන් විධිමත් ව වාර්තා කොට එහි වර්තමාන සහ අනාගත පැවැත්ම තහවුරු කළ යුතුය.

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂණ ක්‍රමවේදයේ දී ගුණාත්මක ක්‍රමවේදය (Qualitative Method) යොදා ගන්නා ලදී. ප්‍රථමයෙන් සාහිත්‍ය විමර්ශනය සිදු කළ අතර එහිදී වන්නි වැදි ජනතාව පිළිබඳ කරුණු සඳහන් වන ප්‍රාථමික සහ ද්විතියික සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කෙරිණි. වන්නි වැදි ජනතාව පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී ඇති නමුත් පාඬිග්ගම වන්නි වැදි ගම්මානය පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී නොමැත. සාහිත්‍ය විමර්ශනයේ දී උක්ත පූර්ව පර්යේෂණ පිළිබඳව ද අධ්‍යයනය කෙරිණි. පසුව 'උරුමය' නමැති සංකල්පය පිළිබඳ සාහිත්‍ය ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි අනුසාරයෙන් අධ්‍යයනය කෙරිණි. ඉන් පසුව උරුම සංකල්පය යටතේ පවතින 'අස්පර්ශිත උරුමය' (Intangible Heritage) පිළිබඳ සාහිත්‍ය විමර්ශනය කරන ලදී. සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනයෙන් අනතුරුව ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කරන ලදී. ක්ෂේත්‍ර ගවේෂණයේ දී ඡායාරූපකරණය, දර්ශන පටිගත කිරීම, සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණය (Participant Observation) ආදී ක්‍රම කිහිපයක් යොදා ගැනීමට සිදු විය. මෙම අධ්‍යයනය ප්‍රාථමික ජන කොට්ඨාස පිළිබඳ සිදු කිරීම නිසා සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ඇදහිලි විශ්වාස, ශාන්තිකර්ම ආශ්‍රිත අස්පර්ශිත උරුමය වාර්තා කිරීමේ දී ගම්මානයේ නවාතැන් ගෙන ඔවුන්ගේ සංස්කෘතියට අනුගත වෙමින් අධ්‍යයනය කිරීමට සිදු විය. එහිදී සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය (Participant Observation) භාවිතයට ගැනිණි. දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය වැනි ශාන්ති කර්මයක් අධ්‍යයනය කිරීමේදී ඒ හා බැඳුණු අස්පර්ශිත උරුමය විධිමත් ව වාර්තාගත කෙරිණි. කවි, ශ්ලෝක සහ ගාථා ආදිය සජීවී ව පටිගත කර ගැනීම සහ ලේඛනගත කිරීම සිදු කරන ලදී. අවසානයේ සියලු ම ක්‍රමවේදවලින් එක් රැස් කර ගන්නා ලද දත්ත විශ්ලේෂණය කොට පාඬිග්ගම අස්පර්ශනීය උරුමය පිළිබඳ අර්ථකථනවලට එළඹිණි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

**ජනශ්‍රැති**

පාඬිග්ගම ගම්මානයේ අස්පර්ශිත උරුමයන් අතර ජනශ්‍රැතිවලට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. මෙම ජනශ්‍රැති ඇසුරින් වන්නි වැදි ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවය ද විමර්ශනය කළ හැකි ය. පාඬිග්ගම ජනශ්‍රැති කිහිපයක් ප්‍රකට ව පවතී. ඒ අතරින් වන්නි වැදි ජනතාවගේ ප්‍රභවය කෙසේ සිදු වූයේ ද යන්න අධ්‍යයනය කළ හැකි ජනශ්‍රැති කිහිපයක් පවතී. ඒවා මෙසේය,

'පාඬිග්ගම' යන ග්‍රාම නාමය ප්‍රභවය වීම පිළිබඳ ජනශ්‍රැතියක් පවතී. එයට අනුව දුටුගැමුණු රජුගේ යුද පුහුණු ආචාර්යවරයා ජීවත් ව ඉඳ ඇත්තේ මෙම ගම්මනයේ වන අතර ඒ අනුව පඬිවරුන්ගේ ගම 'පාඬිග්ගම' බවට පත්ව ඇත (සම්මුඛ සාකච්ඡා අංක 01). වන්නි වැදි ජනතාවගේ ප්‍රභවය අධ්‍යයනය කිරීමට උපකාරී වන ජනශ්‍රැතියක් ද පාඬිග්ගම ගම්මානයේ පවතී. දුටුගැමුණු කුමරු කාවන්තිස්ස රජු සමඟ අමනාප වී කොත්මලය ප්‍රදේශයේ සැඟවී සිටි බව අපි දනිමු. පාඬිග්ගම ජනශ්‍රැතිවලට අනුව ගැමුණු කුමරු නැවතී සිට ඇත්තේ මහවෙදා නම් වන්නි වැදි ජනතාවගේ ආදිතමයෙකුගේ නිවසේ ය (සම්මුඛ සාකච්ඡා අංක 02). පසුව දුටුගැමුණු රජුගේ එක්සේසත් ව්‍යාපාරයට ද වන්නි වැදි ජනතාවගේ ආදිතමයන් උපකාර කර ඇත. යුද්ධය ජයග්‍රහණය කිරීමෙන් පසුව දුටුගැමුණු රජු වන්නි වැදි ජනතාව අනුරාධපුරයට ගෙන්වාගෙන අනුරාධපුරයේ මායිම් ගම්මානවල පදිංචි කළ බව ජනශ්‍රැතිවල සඳහන් වේ. එම මායිම් ගම්මාන පසුව වන්නි වැදි ගම්මාන බවට පත් වී ඇත.

වන්නි වැදි ජනතාව සහ දඹාන අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ ව ද ජනශ්‍රැතියක් පාඬිග්ගම ආශ්‍රිත ව පවතී. එයට අනුව දඹානෙන් වැදි ජන පිරිසක් අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධියේ දරමිටි පෙරහැරට සහභාගී වීමට ගියහ. ඔවුන්ගෙන් එක් පිරිසක් අතරමං වූ අතර එම පිරිස වන්නියට පැමිණ වන්නි වැදි ජනාවාස ආරම්භ කර ගත් බව ජනශ්‍රැතියේ දැක්වේ (සම්මුඛ සාකච්ඡා අංක 03).

**පාඬිග්ගම භාෂාව**

වන්නි වැදි ජනතාවගේ භාෂාව පිළිබඳ පූර්ව පර්යේෂණ සිදු වී ඇති නමුත් තවදුරටත් පර්යේෂණ සිදු වීමේ අවශ්‍යතාවයක් පවතී. පාඬිග්ගම භාෂාව අධ්‍යයනය කිරීමෙන් එම පර්යේෂණ අවශ්‍යතාවය ද සපුරා ගත හැකි ය. අස්පර්ශිත උරුමයක් ලෙස භාෂාවට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මන්ද සංස්කෘතියක සියලු ම අංශ ගොඩනැගීමට භාෂාව ඉවහල් වන බැවිනි. එමෙන්ම උරුමය පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වීම සිදු වන්නේ ද භාෂාව හරහා වීම විශේෂ කරුණකි.

පාඬිග්ගම භාෂාව සඳහා සම්ප්‍රදායන් කිහිපයක් බලපා ඇත. මේ ආකාරයට සම්ප්‍රදායන් කිහිපයක බලපෑම් එල්ල වීම වන්නි වැදි සංස්කෘතියේ නිතර දැකිය හැකි කරුණකි. ඊට හේතු වී ඇත්තේ වන්නි වැදි ජනතාවගේ ප්‍රභවය සහ පාඬිග්ගම ගම්මානයේ පිහිටීමයි. වන්නි වැදි ජනතාව ප්‍රභවය වීමේ දී දඹාන ආශ්‍රිත වැදි සංස්කෘතියේ ආභාසය ලැබී තිබේ. තවද පාඬිග්ගම ගම්මානය පිහිටා ඇත්තේ

සංස්කෘතීන් කිහිපයකට අයත් ජනාවාස ආශ්‍රය කරගෙන වීම නිසා ද මේ ආකාරයට සංස්කෘතීන් කිහිපයක ආභාසය ලැබී ඇත.

පාඬිග්ගම භාෂාව සඳහා, දඹාන ආශ්‍රිත වැදි සම්ප්‍රදායේ භාෂාව, නුවර කලාවියේ භාෂාව මෙන්ම පොදුවේ වන්නි වැදි ගම්මානවල ව්‍යවහාර වන භාෂා ලක්ෂණ ද බලපා ඇත. මෙහිදී සුවිශේෂී කරුණක් සඳහන් කළ යුතුය. එනම් වන්නි වැදි ජනතාවගේ භාෂාව වනාන්තරයේ දී ව්‍යවහාර වන භාෂාවට යම් තරමකින් සාම්‍ය වන බව හෙන්රි පාකර් වැනි විද්වතුන්ගේ අදහසයි. මේ කරුණ පිළිබඳ හෙන්රි පාකර් ඔහුගේ 'Ancient Ceylon' කෘතියේ දක්වා ඇත (Parker, 1999:123). මේ කාරණය වන්නි වැදි ජනතාවගේ භාෂාවේ ප්‍රභවය පිළිබඳ වැදගත් කරුණකි.

ඉහත සඳහන් කළ ආකාරයට පාඬිග්ගම භාෂාවට සම්ප්‍රදායන් කිහිපයක ආභාසය ලැබී ඇත. එම කාරණය විමර්ශනශීලී ව විමසීම මෙහිදී සිදු කෙරේ. පාඬිග්ගම ව්‍යවහාර වන ඇතැම් වචන සහ දඹානේ ව්‍යවහාර වන වචන අතර කිට්ටු සාම්‍යයක් දැකිය හැකි ය. පහත නිදසුන් මඟින් එය සනාථ වේ.

- අම්බරුවා (ගවයා)
- උසංගල්ලා (අලියා)
- හොටබරියා (ඌරා)
- මන්දා (තලගොයා)
- හුරේ (ගෞරවාර්ථය සඳහා) (මූලාශ්‍රය: සහභාගීත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා අංක 04 ඇසුරින්).

වන්නි වැදි ජනතාවගේ ප්‍රභවය සඳහා දඹානේ වැදි සංස්කෘතියේ බලපෑම එල්ල වී ඇති බව ඉහත ජනශ්‍රැතික සාධකවලින් පැහැදිලි වේ. ඒ අනුව භාෂාව සඳහා ද මේ ආභාසය ලැබෙන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. කෙසේ නමුත් දඹාන ආශ්‍රිත වැදි සංස්කෘතිය මහා සම්ප්‍රදාය ලෙස ගත් විට ඉන් බිඳී ආ උප වැදි සංස්කෘතීන් වෙත උක්ත මහා වැදි සම්ප්‍රදායේ ලක්ෂණ සම්ප්‍රේෂණය වී ඇති බව ප්‍රත්‍යක්ෂ වේ. ඒ අනුව පාඬිග්ගම සහ වෙනත් වන්නි වැදි ගම්මානවල භාෂාව සඳහා දඹානේ භාෂා ලක්ෂණ බලපා ඇති බව කරුණු සහිත ව සනාථ කළ හැකි ය.

එමෙන්ම පාඬිග්ගම විවිධ අවස්ථාවන් හා සම්බන්ධ උප භාෂාවන් පවතී. නිදසුනක් ලෙස පාඬිග්ගම පැවැත්වෙන ශාන්තිකර්මවල දී භාවිත වන භාෂාව සුවිශේෂී වේ.

එම භාෂා ලක්ෂණ ශාන්තිකර්මවලට පමණක් අනන්‍ය වූ භාෂාවකි. නිදසුනක් ලෙස දෙවියන් මායම්වීම ශාන්තිකර්මයේ දී භාවිත කරන යෂ්ටිය 'හෝල් කෝටුව' ලෙස ව්‍යවහාර වේ. තවද වන්නි වැදි ගම්මානවල 'මහකැළෑ යාම' නමින් ශාන්තිකර්මයක් පැවැත්වේ. එහිදී 'නොහොරේ දැමීම' නමින් වන්නි බණ්ඩාර දෙවියන් උදෙසා චාරිත්‍රයක් පවතී (සම්මුඛ සාකච්ඡා අංක 05). කැළයේ කුඩා වළක් කපා ඥාතියෙකු මළ බව සංකේතවත් කරමින් සිදු කරන චාරිත්‍රය හඳුන්වන්නේ නොහොරේ දැමීම යනුවෙනි. 'නොහොරේ දැමීම' වැනි වචන එම ශාන්තිකර්මයට අනන්‍ය භාෂා ලක්ෂණ පෙන්නුම් කරයි.

ශාන්තිකර්මවලට අමතරව පාඬිග්ගම ගොවිතැන ආශ්‍රිතව ද උප භාෂාවක් පවතී. සී සෑම, වී වැපිරීම සිදු කරන අවස්ථාවල 'කැකුළන් ගහනවා, 'බැද්ද මැරෙනවා' වැනි වචන ව්‍යවහාර වේ. පාඬිග්ගම කුඹුරු සී සෑමේ දී දෙවරක් සී සෑම සිදුවන අතර ඉන් කුඹුරේ සියලු ම වල් පැළෑටි විනාශ වේ. මේ ක්‍රියාවලිය 'බැද්ද මැරෙනවා' ලෙස ව්‍යවහාර වේ (සම්මුඛ සාකච්ඡා අංක 06). මේ පිළිබඳ තවත් සුවිශේෂී කරුණක් සඳහන් කළ යුතුය. එනම් පාඬිග්ගම ගොවිතැන සහ සම්බන්ධ භාෂාවට නුවර කලාවියේ භාෂා ලක්ෂණ ද බලපා ඇති බවයි. පාඬිග්ගම ගම්මානයේ පිහිටීම නිසා මේ ආකාරයේ සබැඳියාවක් අපේක්ෂා කළ හැකි ය.

පාඬිග්ගම භාෂාව පිළිබඳ සාකච්ඡා කිරීමේ දී තවත් සුවිශේෂී කරුණක් සඳහන් කළ යුතුය. එනම් පාඬිග්ගම භාෂාවට සම්ප්‍රදායන් කිහිපයක ආභාසය ලැබුණ ද එයට ම ආවේණික භාෂා ලක්ෂණ ද අන්තර්ගත වේ. මේ කාරණය පාඬිග්ගම භාෂාව මතු නොව වෙනත් අස්පර්ශිත උරුමයන්ගේ ද දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි. ඒ ඔස්සේ පාඬිග්ගම සංස්කෘතික උරුමයේ අනන්‍යතාවය ඉස්මතු වේ.

**ඇදහිලි විශ්වාස**

වන්නි වැදි ජනතාවගේ අස්පර්ශිත උරුමය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ඇදහිලි විශ්වාසවලට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. මන්ද ඇදහිලි විශ්වාස පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වීමට අස්පර්ශිත උරුමය හේතු වේ. ඇදහිලි විශ්වාසවලින් අස්පර්ශිත උරුමය ඉවත් කළහොත් එහි පවතින වටිනාකම ක්ෂය වේ. මේ නිසා ඇදහිලි විශ්වාසවල අන්තර්ගත ස්පර්ශ කළ නොහැකි උරුමය සුවිශේෂී කාර්යභාරයක් සිදු කරයි.

### දෙවියන් මායම්වීම

පාඬිග්ගම ශාන්තිකර්ම අතර සුවිශේෂී ශාන්තිකර්මයක් ලෙස දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය හැඳින්විය හැකි ය. දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය පොදුවේ වන්නි වැදි ගම්මානවල දැකිය හැකි ශාන්තිකර්මයකි. නමුත් පාඬිග්ගම දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ ආවේණික ලක්ෂණ අන්තර්ගත වේ. ඉහත සඳහන් කළ ආකාරයට පාඬිග්ගම සෑම අස්පර්ශිත උරුමයක ම මෙම ස්වීයය හෙවත් ස්වාධීන ලක්ෂණය දැකිය හැකි ය. මෙම ශාන්තිකර්මයෙන් සිදු කෙරෙන්නේ, අමනුෂ්‍ය බලවේගයට ලක් වූ ආතුරයාට මානසික චිකිත්සාවක් ලබා දීමයි. මෙම මානසික චිකිත්සාව ද අස්පර්ශිත උරුමයක් ලෙස සැලකිය හැකි ය. දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ ව්‍යූහය මෙසේය.

ශාන්තිකර්මය ආරම්භයේ දී යහන් තනා, ගොටු පූජා කර, කවි ගායනා කර දෙවියන්ට ආරාධනා කිරීම සිදු වේ. පසුව යකැදුරා රතු පැහැති වස්ත්‍රයක් ඉණේ දවටා ගෙන එහි වන්නියට අධිගෘහිත දෙවිවරුන්ගේ ආයුධ පැළඳ ගනියි. මෙම ආභරණ කට්ටලය ‘දේව අනාභරණ කට්ටලය’ ලෙස හැඳින්වේ (සම්මුඛ සාකච්ඡා අංක 07). මේ සඳහා අන්තර්ගත වන ආයුධ මෙසේ දැක්විය හැකි ය.

- චන්ද්‍රායුදය
- කාල ජමජාරිය
- නයි හත්ත
- සීරි කඩුව
- ජමජාරිය

මෙම ආයුධ වන්නියට අධිපති දෙවියන් අත රැඳි ආයුධ වීම විශේෂ කරුණකි. කඩවර, සළඹ කුමාර, කතරගම, හඳුන් කුමාර ආදී දෙවිවරුන්ට අයත් ආයුධ මෙම දේව අනාභරණ කට්ටලයට අන්තර්ගත වේ. මෙහිදී සිදු කෙරෙන්නේ ආතුරයාට ආවේෂ වී ඇති අමනුෂ්‍ය බලවේගයට වඩා බලසම්පන්න දේව බලවේගයක් යකැදුරාට ආවේෂ වීමයි. තවද දේව අනාභරණ කට්ටලය දැකීමෙන් ආතුරයාට මානසික වශයෙන් චිකිත්සාවක් ඇති වේ. එනම් විශ්වාසයක් ඇති වේ.

ඉහත සඳහන් කළ ආකාරයට දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය වෙනත් වන්නි වැදි ගම්මානවල ද පැවැත්වේ. නමුත් වෙනත් ගම්මානවල දෙවියන් මායම්වීමේ

ශාන්තිකර්වල දී ප්‍රමුඛතාවය ගනු ලබන්නේ පාඬිග්ගම වැසියන් වීම සුවිශේෂී කරුණකි. ඉන් පාඬිග්ගම වන්නි වැදි ජනතාවගේ අනන්‍යතාවය ඉස්මතු වේ.



***ඡායාරූපය 02:*** *දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මයේ දී භාවිත කරන යෂ්ටිය හෙවත් හෝල් කෝටුව*



***ඡායාරූපය 03:*** *දේව අනාභරණ කට්ටලයට අයත් සීරි කඩුව*



***ඡායාරූපය 04:** දේව අනාභරණ කට්ටලයට අයත් කාල ජමජාරිය*

## වැද්දා කන්දට දානය පිරිනැමීම

පාඬිග්ගම ගම්මානයේ වැද්දා කන්දට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙම කන්ද ආශ්‍රිත ව මළගිය ඥාතීන් උදෙසා දානය පිරිනැමීමක් දැකිය හැකි වන අතර මේ චාරිත්‍රය වෙනත් වන්නි වැදි ගම්මානවල දැකිය නොහැකි වීම සුවිශේෂී කරුණකි. ඉන් වන්නි වැදි ගම්මාන අතර පාඬිග්ගමට පවතින සුවිශේෂී බව ඉස්මතු වේ. වැද්දා කන්දට දානය පිරිනැමීමේ චාරිත්‍රය දඹාන සමඟ සම්බන්ධ වේ. දඹානේ සුප්‍රකට නෑ යකුන් පිදීමේ චාරිත්‍රය සමඟ මෙය සාම්‍ය වේ. දඹානේ යම් කිසි පුද්ගලයෙකු මිය ගිය පසු ඔහු කන්දේ යකා සමීපයට යන බව විශ්වාස කෙරේ. ඉන් පසුව මළගිය ඥාතියා නැවත සිහිපත් කිරීම නෑ යකුන් පිදීමේ චාරිත්‍රයෙන් සිදු කෙරේ (රණසිංහ, 2009: 330). වැද්දා කන්දට දානය පිරිනැමීමේ චාරිත්‍රයෙන් පාඬිග්ගම සහ දඹාන අතර පවතින සංස්කෘතික සාම්‍යත්වය විෂද වේ. ඒ ඔස්සේ මේ සංස්කෘතීන් දෙක අතර පවතින සහසම්බන්ධය මැනවින් ස්ඵුට වේ.

## පිදේනි ශාන්තිය

දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය මෙන්ම පිදේනි ශාන්තිය ද මනෝචිකිත්සක ශාන්තිකර්මයකි. යම් කිසි ලෙඩ රෝගයකට හෝ අමනුෂ්‍ය බලවේගයකට හසු වූ ආතුරයන් සඳහා මෙම ශාන්තිකර්මය පැවැත්වේ. පිදේනි ශාන්තිය ද අනෙකුත් ශාන්තිකර්ම ආකාරයට වෙනත් වන්නි වැදි ගම්මානවල ද දැකිය හැකි ය. නමුත්

පාඬිග්ගමට අනන්‍ය වූ ලක්ෂණ පවතී. පිදේනි ශාන්තිය සිදු කරනු ලබන්නේ පියවරෙන් පියවරයි. එම පියවර මෙසේය,

- ❖ පිදේනි දීම
- ❖ යහන් දීම
- ❖ දෙවියන්ට යාදිනි කීම
- ❖ මතුරා දිශ්ටි ගැනීම
- ❖ සමයං කිරීම

පිදේනි ශාන්තියේ අස්පර්ශිත උරුමයන් රාශියක් ගැබ් වී ඇත. එහි යාදිනි, ස්තෝත්‍ර ආදිය ද අස්පර්ශිත උරුමයන් ගණයට අයත් වේ. එමෙන්ම මනෝචිකිත්සක ස්වභාවය ද අස්පර්ශිත උරුමයකි. මේ ආකාරයට පාඬිග්ගම ඇදහිලි විශ්වාසවල විශාල වශයෙන් අස්පර්ශිත උරුමයන් ගැබ් ව ඇත. නමුත් මෙම ඇදහිලි විශ්වාස අද වන විට සමාජයෙන් දුරස් වෙමින් පවතී. එබැවින් ඒවායේ වර්තමාන සහ අනාගත පැවැත්ම තහවුරු කළ යුතුව ඇත.

**නිගමනය**

පාඬිග්ගම ගම්මානයේ අස්පර්ශිත උරුමය සහ එහි වර්තමාන සහ අනාගත පැවැත්ම පිළිබඳ ව සාකච්ඡා කළ මෙම පර්යේෂණයේ දී නිගමන කිහිපයකට එළඹීමට හැකි විය. වන්නි වැදි ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවය අර්ථකථනය කර ගැනීමේ දී පාඬිග්ගම අස්පර්ශිත උරුමය බොහෝ සෙයින් ඉවහල් වන බව ප්‍රමුඛ වශයෙන් නිගමනය කළ හැකි ය. වන්නි වැදි ජනතාවගේ ප්‍රභවය පිළිබඳ පවතින මතවාද පාඬිග්ගම ජනශ්‍රැති ඇසුරින් නිරවුල් කර ගැනීමේ හැකියාව පවතී. එමෙන්ම වන්නි වැදි ගම්මාන ප්‍රභවය වීම පිළිබඳව ද පාඬිග්ගම ජනශ්‍රැති ඇසුරින් කරුණු අධ්‍යයනය කළ හැකි ය. පාඬිග්ගම ඇදහිලි විශ්වාස සහ භාෂාව ඇසුරින් ද වන්නි වැදි ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවය අර්ථකථනය කර ගැනීමේ හැකියාව පවතී. තවද එළඹිය හැකි සුවිශේෂී නිගමනයක් වන්නේ, පාඬිග්ගම අස්පර්ශිත උරුමයන් සඳහා සම්ප්‍රදායන් කිහිපයක ආභාසය ලැබීමයි. ඒ සඳහා හේතු වන පසුබිම ඉහත පැහැදිලි කර ඇත. ඒ අනුව දඹාන ආශ්‍රිත වැදි සංස්කෘතිය, වෙනත් වන්නි වැදි ගම්මානවල සංස්කෘතිය සහ නුවර කලාවියේ සංස්කෘතිය පාඬිග්ගම අස්පර්ශිත උරුමයන්ට බලපා ඇත. නමුත් මෙහිලා සඳහන් කළ හැකි සුවිශේෂී කරුණ වන්නේ, පාඬිග්ගම අස්පර්ශිත උරුමයන්හි පවතින ස්වාධීන, ස්වීය ගති ලක්ෂණයි. එනම් සංස්කෘතීන් කිහිපයක ආභාසය ලැබුණ ද සෑම අස්පර්ශිත

උරුමයක ම ගම්මානයට අනන්‍ය වූ ස්වාධීන ලක්ෂණ දැකිය හැකි ය. නිදසුනක් ලෙස දෙවියන් මායම්වීමේ ශාන්තිකර්මය හැඳින්විය හැකි ය. ඒ අනුව එළඹිය හැකි නිගමනය වන්නේ පාඬිග්ගම අස්පර්ශිත උරුමයන්ට සංස්කෘතීන් කිහිපයක ආභාසය ලැබුණ ද ගම්මානයට ම අනන්‍ය ලක්ෂණ ගොඩනැඟී ඇති බවයි. මෙය සුවිශේෂී නිගමනයක් බව කිව මනාය. මේ අනුව නිගමනය කළ හැකි වන්නේ, පාඬිග්ගම අස්පර්ශිත උරුමයේ වර්තමාන සහ අනාගත පැවැත්ම තහවුරු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් බවයි. එය පර්යේෂකයන්ගේ වගකීමක් මෙන්ම යුතුකමක් ද වන බව මෙහිදී වෙසෙසින් සඳහන් කළ යුතුය.

**නිර්දේශ**

- සමස්ත වන්නි වැදි ජනතාවගේ සංස්කෘතික උරුමය විධිමත්ව අර්ථකථනය කිරීම.
- වන්නි වැදි ජනතාව පිළිබඳ තවදුරටත් පර්යේෂණ, ග්‍රන්ථ ආදී ප්‍රකාශන සිදු කිරීම.
- වන්නි වැදි ජනතාවගේ ස්පර්ශිත මෙන්ම අස්පර්ශිත උරුමය ප්‍රදර්ශනය කළ හැකි කෞතුකාගාර ස්ථාපනය කිරීම.
- පාඬිග්ගම ගම්මානයේ අස්පර්ශිත උරුමය විධිමත් ක්‍රමවේද යටතේ තවදුරටත් වාර්තාගත කිරීම සහ තවදුරටත් පර්යේෂණ සහ ප්‍රකාශන සිදු කිරීම.
- ස්පර්ශිත මෙන්ම අස්පර්ශිත උරුමය ප්‍රදර්ශනය කළ හැකි ආකාරයට පාඬිග්ගම ගම්මානය කේන්ද්‍ර කරගෙන කෞතුකාගාරයක් ස්ථාපනය කිරීම.
- කවි, ස්තෝත්‍ර, ගායනා වැනි අස්පර්ශිත උරුමයන් ආරක්ෂා කිරීමට නවීන සංරක්ෂණ ක්‍රමවේද භාවිත කිරීම.
- සාම්ප්‍රදායික වෙදකම ආශ්‍රිත දැනුම් සම්භාරය ආරක්ෂා කිරීමට ආයුර්වේද විශ්වවිද්‍යාලයේ සහාය ලබා ගැනීම.

- වන්නි වැදි ගම්මානවල ජනශ්‍රැති සියල්ල වාර්තා කර ඒවා පාඬිග්ගම ජනශ්‍රැති සමඟ සංසන්දානාත්මක ව අධ්‍යයනය කිරීම.

- පාඬිග්ගම සංස්කෘතික උරුමය පිළිබඳ ගම්මානය අවට ප්‍රජාව දැනුම්වත් කිරීම.

**ස්තූතිය**

පාඬිග්ගම වන්නි වැදි ගම්මානය පිළිබඳ සිදු කළ පර්යේෂණයේ දී වටිනා උපදෙස් ලබා දුන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය සන්ධ්‍යා කුමාරි නවරත්න මැණිකේ මහත්මිය ගෞරවයෙන් සිහිපත් කරමි. එමෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයනවල දී මා වෙත නොමසුරුව උපකාර කළ පාඬිග්ගම ගමම්ානයේ ග්‍රාම නිලධාරීතුමිය ඇතුළු පාඬිග්ගම ගම් වැසියන් ස්තුති පූර්වක ව සිහිපත් කරමි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

දළුපොත, මහින්ද කුමාර, (2003). මුට්ටි මංගල්ලයේ වගතුග. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

දළුපොත, මහින්ද කුමාර, (2005). වැව හා සංස්කෘතිය. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සෙනෙවිරත්න, අනුරාධ, (2009). පුරාණ සිංහල වාරි සංස්කෘතිය. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සෙලිග්මාන්, සී.ජී. (2009). වැද්දෝ (චන්ද්‍ර ශ්‍රී රණසිංහ පරි). කොළඹ. ෆාස්ට් පබ්ලිෂින්

Brow, J. (1978). Vedda villages of Anuradhapura: The Historical Anthropology of a Community in Sri Lanka. London. University of Washington Press.

Deraniyagala, S.U. (1992). The prehistory of Sri Lanka an Ecological Perspective. Colombo. Department of Archaeology.

Parker, H. (1999). Ancient Ceylon. New Delhi. Asian Educational Services.

Pushpa Kumara, R.D.D. 2021, *A Investigative Study about the Folklore Traditions Associated with Padiggama Village* (In Sinhala), 3rd International Conference on Intangible Cultural Heritage (ICICH 2021), Department of Anthropology, Univerity of Sri Jayewardenepura, Sri Lanka, pp.38

Convention for the Safeguarding of the Intangible Cultural Heritage, 2003.

**සම්මුඛ සාකච්ඡා**

සම්මුඛ සාකච්ඡාව 01- කදිරාතා, අවුරුදු 87, පාඬිග්ගම ගම්මානයේ ජ්‍යෝෂ්ඨත ම පුරවැසියා, පාඬිග්ගම, ඇටවීරගොල්ලෑව. 2020/02/18

සම්මුඛ සාකච්ඡාව 02- කදිරාතා, අවුරුදු 87, පාඬිග්ගම ගම්මානයේ ජ්‍යෝෂ්ඨත ම පුරවැසියා, පාඬිග්ගම, ඇටවීරගොල්ලෑව. 2021/10/16

සම්මුඛ සාකච්ඡාව 03- මුතුබණ්ඩා, අවුරුදු 72, පාඬිග්ගම ගම්මානයේ මහවැවේ විදානේ, පාඬිග්ගම, ඇටවීරගොල්ලෑව. 2021/10/17

සම්මුඛ සාකච්ඡාව 04- නන්දසේන, කන්දාතගේ, අවුරුදු 70, පාඬිග්ගම ගම්මානයේ ගම්වාසී, පාඬිග්ගම, ඇටවීරගොල්ලෑව. 2022/01/30

සම්මුඛ සාකච්ඡාව 05- වික්‍රමපාල, කේ, අවුරුදු 60, පාඬිග්ගම ගම්මානයේ ගම්වාසී, පාඬිග්ගම, ඇටවීරගොල්ලෑව. 2022/01/30

සම්මුඛ සාකච්ඡාව 06- මුතුබණ්ඩා, අවුරුදු 72, පාඬිග්ගම ගම්මානයේ මහවැවේ විදානේ, පාඬිග්ගම, ඇටවීරගොල්ලෑව. 2021/10/17

සම්මුඛ සාකච්ඡාව 07- කදිරාතා, අවුරුදු 87, පාඬිග්ගම ගම්මානයේ ජ්‍යෝෂ්ඨත ම පුරවැසියා, පාඬිග්ගම, ඇටවීරගොල්ලෑව. 2020/02/18

# ගාලු මෝදර අවකාශයන්හි ස්ථාපිත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී බණ්ඩාරනායක ආලේඛ්‍ය ස්මාරක මූර්ති පිළිබඳ අධ්‍යනයක්

**සි.පී ධර්මශ්‍රී,**

බාහිර කථිකාචාර්ය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

caprasannaart@gmail.com

***සංක්ෂේපය***

*ශ්‍රී ලාංකේය කලාව ගොඩනැගිමේදී දේශපාලනික මැදිහත් වීම අතීතයේ සිට ප්‍රබලව දක්නට ඇත. ලාංකේය දෘශ්‍ය කලාව බෞද්ධ ආරාම කේන්ද්‍ර කොට ගෙන රාජ්‍ය අනුග්‍රහය මත බිහිවිය. අනුරාධපුර රාජධානියේ සිට මහනුවර රාජධානිය දක්වා බෞද්ධ ආරාම කේන්ද්‍ර කොට ගොඩනැගුණු දේශපාලනික ආලේඛ්‍ය මූර්ති කලාව වර්ෂ 1818 දී යටත්විජිතයක් බවට පත්විමෙන් පසුව එම මූර්ති කලාව කැපී පෙනෙන විචල්‍යයතාවයක් දක්නට ලැබේ. එම දේශපාලන ආලේඛ්‍ය මූර්ති අතර වඩාත් කැපීපෙන, සමාජ හා දේශපාලන අරමුණ සහිත මෙන්ම පුරාවිද්‍යාත්මක උරුම වටිනාකමක් සහිත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී බණ්ඩාරනායක මූර්තිය, අධ්‍යයන විෂය පථය ලෙස හැඳින්විය හැක. මෙම පර්යේෂණ පත්‍රිකාවේ දී එම ස්මාරක මූර්තිය බිහි වූ අවධියේ දේශපාලන විචල්‍යතාවයන් සහ බලපෑ සමාජ දේශපාලන උත්ප්‍රේරණයන්ගේ මැදිහත්වීම කොතෙක් දුරට මූර්තිය ගොඩනැගීමට බලපෑම කළ ආකාරය සොයා බැලීම සිදු කෙරේ. එම පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් දේශපාලන ආලේඛ්‍ය මූර්තිය වර්තමානයේදී නාගරික අවකාශය ප්‍රසාරණය වීම, නව ඉදිකිරීම් සහ මූර්තිය ස්ථාපිත භූමි දර්ශනය සමඟ මූර්තියේ අර්ථකථනය ප්‍රති අර්ථ කථනය බිහිවීම පිළිබඳව ද සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙයි.*

***මුඛ්‍ය පද-*** *දේශපාලනය, ආලේඛ්‍ය, අවකාශය, සංරචනය, සමකාලීන, කුලය*

## හැඳින්වීම

මෙම පර්යේෂණයෙන් ප්‍රමුඛ කොට ගත්තේ පුරාවිද්‍යාමක උරුම වටිනාකමකින් යුක්ත 20 වන සියවස අයත් ගාලු මෝදර මහජන අවකාශයේ ස්ථාපිත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී බණ්ඩාරනායක ආලේඛ්‍ය ස්මාරක මූර්ති පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ශ්‍රී ලාංකාවේ සැලකිය යුතු දේශපාලනික ආලේඛ්‍ය මූර්ති නාගරික අවකාශයේ ස්ථාපිතව ඇත. නමුත් එම මූර්ති පිළිබඳ විධිමත් විස්තරාත්මක සංවාදයක් ගොඩනැගි නොමැත. මෙම මූර්තිය ගොඩනැගීමේ ක්‍රියාවලිය නම් එය අතීතයේ හුදු දිර්ඝ මොහොතක තුළ සිදු වූ සිදුවීම් මාලාවක ස්මෘතිය පමණක් නොවේ ය.

පළමුව ස්මාරකයක් යනු කුමක්ද? ස්මාරක යනු විකාශයේ ප්‍රමුඛ අර්ථයන් ඉදිරිපත් කිරීම සඳහා ඉදිකරන ලද ආකෘති ය. ඔවුන් සෞන්දර්යාත්මක වටිනාකමක් මෙන්ම දේශපාලන කාර්යයක් ද ඉදිරිපත් කරයි. බොහෝ විට, දේශපාලන ප්‍රභූන් විසින් ස්මාරක ඉදිකරනු ලබන්නේ තෝරාගත් ඓතිහාසික ආඛ්‍යාන ප්‍රවර්ධනය කිරීම සඳහා පහසු සිදුවීම් සහ පුද්ගලයන් කෙරෙහි අවධානය යොමු කරන අතරම අපහසුතාවයට පත්වන දේ මකා දමමිනි. තෝරාගත් ඓතිහාසික ආඛ්‍යාන නිරූපණය කරන අතරම, ස්මාරක මඟින් වර්තමානය පිළිබඳ නිශ්චිත සංකල්පයන් ඇති කළ හැකි අතර අනාගත හැකියාවන් දිරිමත් කළ හැකිය. එනිසා, දේශපාලන ප්‍රභූන් දේශපාලන න්‍යාය පත්‍ර සහ නීත්‍යානුකූල දේශපාලන බලය සකස් කරන මතකය හා අනන්‍යතාව පිළිබඳ ජාතික දේශපාලනය ප්‍රකාශ කිරීම සඳහා ස්මාරක අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත් ඉදිකරන ලද පසු, ස්මාරක සමාජ ගුණාංග බවට පත්වන අතර පරිශීලකයින්ට ඒවා නිර්මාණකරුවන්ගේ අභිප්‍රායයන්ට වෙනස් හෝ වෙනස් ආකාරවලින් නැවත අර්ථ දැක්විය හැකිය (Bellentani and Panico 2016:28,29).


## ක්‍රමවේදය

බණ්ඩාරනායක ආලේඛ්‍ය ස්මාරක ගොඩනැගීමේදී මූර්තියේ අන්තර් ක්‍රියාකාරීත්වය, සංකේතාත්මක හා දේශපාලන මානයන් මඟින් නිර්මාණය කරන ලද ස්මාරකවල අර්ථයන් විමර්ශනය කිරීමට සංඥාර්ථවේදි එළඹුම (Semiotic approach) ප්‍රයෝජනවත් වේ.

**සාකච්ඡාව**

**ගාලූ මෝදර පිටියේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මූර්තිය**

ආලේඛ්‍ය මූර්ති කලාවට දීර්ඝ ඉතිහාසයක් මෙන්ම උරුමයක් ඇත. එම නිසා එම මූර්ති කලා ධාරාවේ ඉතිහාසය පිළිබඳව සැකෙවින් දැනගැනීම වැදගත් වේ. අනුරාධපුර යුගයට අයත් දුටුගැමුණු රජතුමා යැයි සැලකෙන ආලේඛ්‍ය මූර්තිය, පොළොන්නරු යුගයේ දී මහා පරාක්‍රමබාහු රජතුමා යැයි සැලකෙන මූර්තින් සුවිශේෂී වේ.



දුටුගැමුණු ප්‍රතිමාවේ, ක්‍රි:පු 1-2, අනුරාධපුර යුගය.



මහා පරාක්‍රමබාහු, ක්‍රි:පු 7-8, පොළොන්නරු යුගය.



කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා, දඹුල්ල ලෙන,මහනුවර යුගය.



වලගම්බා රජතුමා, දඹුල්ල, මහනුවර යුගය.



නිශ්ශංකමල්ල රජතුමා, දඹුල්ල, මහනුවර යුගය.



විලියම් හේන්රි ගෙගරි, කොළඹ ජාතික කෞතුකාගාරය, 1880.

18 වන සියවස වන විට කීර්ති ශ්‍රි රජසිංහ රජතුමා, වළගම්බා රජතුමා මෙන්ම නිශ්ශංකමල්ල රජතුමාගේ ආලේඛ්‍ය මූර්තිය දඹුල්ල ලෙන් විහාර සංකීර්ණයෙන් හමුවේ. මේ සියලු මූර්ති ගොඩනගා ඇති  භූමි දර්ශනය ගැන අවධානය යොමු කරන විට දැකිය හැකි පොදු ලක්ෂණය වන්නේ ඒවා ආගමික අවකාශය තුළ ගොඩනැඟීමයි. මෙම ආලේඛ්‍ය මූර්ති අවකාශයෙන් වෙන්වීම හෙවත් බණ්ඩනය

වූයේ යටත්විජිතයෙන් පසුවයි. බටහිර අධිරාජ්‍යවාදීන් විසින් තම බලය හා දේශපාලන උවමනාව මත තම ආලේඛ්‍ය මූර්ති රැසක් ඉදිකරනු ලබයි. ඒ අතර පළමු වන එළිසබත් රැජිනගේ මූර්තිය හා කොළඹ ජාතික කෞතුකාගාරය ඉදිරිපිට ඇති ග්‍රෙගරි ආණ්ඩුකාරයාගේ මූර්තිය කැපී පෙනෙන මූර්ති ලෙස හැඳින්විය හැක. මේ සියල්ල ඉදිවන්නේ ආගමික ගොඩනැගිලි භූමි දර්ශන තොර වීම විශේෂත්වයක් වේ. එම අවකාශය බණ්ඩනයේ දිගුවක් ලෙස ඉදිවන බණ්ඩාරනායක ප්‍රතිමාව පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ.

1960 සමගි පෙරමුණ රජයට එකල සෝවියට් සංගමය විසින් තෙවන ලෝකයේ රටවලට ප්‍රතිමා තෑගි කිරීම ඔවුන්ගේ මිත්‍රත්වය තවදුරටත් ශක්තිමත් කිරීමේ දේශපාලනික ඵලදායී රාජ්‍ය තාන්ත්‍රික මෙවලමක් ලෙස භාවිත කළේය. සෝවියට් සමූහාණ්ඩුව උපක්‍රමිකව සමාජවාදී බලකඳවුරට පක්ෂව මිත්‍රත්වය ගොඩනගා ගැනිමට සිරිමාවෝ බණ්ඩාරනායකයන්ගේ ස්වාමිපුරුෂයාගේ රුව තෝරා ගැනිමත්, එම මූර්තිය නිර්මාණයට සෝවියට් සමූහාණ්ඩුවේ ප්‍රධාන මූර්ති ශිල්පියා වන කැරබෙල් විසින් මොස්කව් නුවර දී නිර්මාණයකර ගාලු මෝදර ප්‍රතිස්ථාපනය කිරිම යන සිදුවීම බලය පිළිබඳ දේශපාලන කාරණාවක් වේ. කෞතුකාගාරයෙන් හෝ ගැලරි අවකාශයෙන් පිටත භූ දර්ශන භූමියේ කලා කෘති ගොඩනැගීම හා ප්‍රදර්ශනය කිරීමට විකල්ප ක්‍රම වේ. පිට්ටනියක හෝ විවෘත පොදු ස්ථානයක මූර්තියක් හමුවීම ගැලරි අවකාශයක මූර්තියක් හමුවීමට වෙනස් අත්දැකීමකි. මෙම අත්දැකිමේ සුවිශේෂීතාවය ඇත්තේ මූර්තිය විසින් අත්පත් කරගන්නා අවකාශයයි. මූර්ති එහි ත්‍රිමාන ස්වභාවය නිසා එය වටා ඇති අවකාශය අල්ලා ගන්නා ශරීරය හා අවකාශය අතර සම්බන්ධතාවයක් ඉදිරිපත් කරයි.



ඉහත සිතියමේ රතු පාට සළකුණු කර ඇති ගාලු මුවදොර ඉදිරිපිට එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මූර්තිය ස්ථානගත ඇත,



බණ්ඩාරනායක මූර්තිය සිරිමාවෝ අගමැතිණිය සහභාගීත්වයෙන් නිරාවරනය වූ මොහොත.

බණ්ඩාරනායකයන්ගේ ආලේඛ්‍ය මූර්තීන්හි අති ප්‍රබල ප්‍රකාශන අපට හමු වන්නේ එහි අවකාශය තුළයි. ගාලු මෝදර අවට අවකාශය කලා කෘතියේ කොටසක් බවට පත්වේ. එය එසේ වන්නේ මූර්තිය හා ගාලු මෝදර අවට අවකාශය එකිනෙකා අතරට විහිදෙන හෙයිනි. අවකාශය මූර්ති ශිල්පයේ ම සාපේක්ෂ කොටසක් බවට පත්වේ. බණ්ඩාරනායකයන්ගේ ආලේඛ්‍ය මූර්ති ස්ථාපිත වීමට පෙර ගාලු මෝදර 1803 දී අධිරාජ්‍යවාදීන් ගොඩනගා ඇත්තේ රජයේ දේශපාලනික හා මූල්‍ය හසුරන ගොඩනැගිලි ඉදිකිරීමෙන් භූමි බලයක් සහ වටිනාකමක් ලබාගනිමිනි. එම නිසා ස්ථානීය වටිනාකම මූර්ති හා ඒ වටා ඇති අන්තර් සම්බන්ධතාවය සහිත අවකාශය නිසා නව අවකාශයක් පිළිබඳ දේශපාලනික හැඟීමක් ඇති කරයි.



ඉහත ඡායාරූපයේ රතු පාට සළකුණු කර ඇති ගාලු මුවදොර ඉදිරිපිට, චීනට අයත් ෂැංග්‍රිලා හෝටලයට පිටුපසින් එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මූර්තිය ස්ථානගත ඇත.

බණ්ඩාරනායකයන්ගේ ආලේඛ්‍ය මූර්ති සම්මුඛව ඇති පිහිටීම අත්පත් කරගන්නා අවකාශය ඉතා සුවිශේෂී වේ. එනම්, කොළඹ හා ගාල්ල යාකරන A2 ප්‍රධාන මහා මාර්ගයත්, පසුව හමුවන ගාලු මෝදර පිටියත්, බස්නාහිරින් ඉන්දියන් සාගරය අභිමුඛවීම අතර දේශපාලනික අන්තර් සම්බන්ධිත පර්යතයක් ගොඩනගා ගතහැක. මූර්තිය අභිමුඛ වන ඉන්දියන් සාගරය දෙසට වම් පාදය පෙරට දමා ගමන් කිරීමේ ඉරියව්ව මත ගොඩනැගෙන අවකාශ අතර ඇති සම්බන්ධතාව නම්, ලෝක දේශපාලන එක් බල කඳවුරක් වන සෝවියට් සමූහාණ්ඩුවේ උපක්‍රමිකව පක්ෂපාතී මිත්‍රත්වය ගොඩනැගීමට සිරිමාවෝ බණ්ඩාරනායකයන්ගේ ස්වාමිපුරුෂයාගේ අලේඛ්‍ය මූර්ති තෝරා ගැනිම තුළ සමාජවාදී විදේශයට ප්‍රතිපත්තියට රට තුළ ප්‍රවර්ධනයට ගත් දේශපාලනික උපක්‍රමයක් ලෙස අර්ථකතනය කලහැක.



සර්. සොලමන් ඩයස් බණ්ඩාරනායක



බණ්ඩාරනායක යුරෝපීය බටහිර අඳුමෙන් සැරසී.



බණ්ඩාරනායක ආර්ය සිංහල ජාතික අඳුමෙන් සැරසී.

වික්ටෝරියානු අධිරාජ්‍යවාදීත්වයට පක්ෂපාතී නව ධනවාදී පරම්පරික කතෝලික පන්තියේ මහේශාක්‍ය උරුමය ලබාගත් බණ්ඩාරනායකයන් ඔහුගේ ආලේඛ්‍ය මූර්තියේ ආර්ය සිංහල ඇඳුමේ සැරසී සිටීම යන කාරණාව අතිශය බලය පිළිබඳ දේශපාලන කාරණාවක් වේ. ඔහුගේ පියා පහතරට මුදලි පේරුව නියෝජනය කළ වියදම් අධික ජේත්තුකාර ජීවිතයක් ගත කළ අයෙකි. 1895 දී මහමුදලි පදවිය ද, බ්‍රිතාන්‍යයන් කෙරෙහි වූ අචල පක්ෂපාතීත්වය වෙනුවෙන් 1902 දී CMG නමැති නම්බු නාමය ද ඔහුට පිරිනමන ලදී (අයිවන් 1998:57).



එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මූර්තිය, ගාලු මුවදොර ඉදිරිපිට, 1967, අඩි 32, ලෝකඩ

මේ අනුව දේශපාලන බලය ලබාගන්න ඔහුට අයත් පාරම්පරික වියදම් අධික ජේත්තුකාර යුරෝපීය ඇඳුම අතහැර සරල ආර්ය සිංහල ඇඳුමට මාරු වී සිටියේය. නමුත් රාජ්‍යතාන්ත්‍රික හා තම පන්තියේ අය මුණ ගැසෙන බොහෝ විට බටහිර ඇඳුමෙන් පෙනී සිටියේය. එහෙත් මූර්තිය සඳහා ආර්ය සිංහල ඇඳුම යොදා ගැනිම, ඔහු ජේත්තුකාර පෙනුම නැති කොට එයට පොදු ජන පෙනුමක් ලබා ගත්තේ බහුතර සිංහල ජනතාවගේ විශ්වාසය දිනා ගැනිමටය. තවද ඉංග්‍රිසි භාෂාව කල්පනාකරන භාෂාව ලෙස තබාගනිමින් සිංහල භාෂාව සිංහල මහජනතාව අමතන භාෂාව බවට පත්කර ගත්තේය.







එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මූර්තිය විවිධ කෝණවලින්, ගාලු මුවදොර ඉදිරිපිට, 1967, අඩි 32, ලෝකඩ

දේශපාලනික ආලේඛ්‍ය මූර්ති විශාල පාදමක් මත ගොඩනැගිම යනු සාමාන්‍ය මිනිසාට ලඟාවීම නොහැකි බලය පිළිබඳ ප්‍රකාශනයකි. එම බලය පිළිබඳ සංකේතාත්මක වටිනාකම කණ්ඩනය කොට ඒ වෙනුවට පිහිටි පොළව තරමක් උස් කොට කුඩා සරළ පදමක් මත නරඹන්නාට ලඟා විය හැකි ලෙස ගොඩනගා ඇත. වඩාත් මිල අධික ලෝකඩ මාධ්‍යයෙන් අඩි 30 ක් පමණ උසින් ගොඩනැගීම තුළින් ප්‍රතාපවත් බලයක් ගොඩනගා ඇත. හිටි ඉරියව්ව වෙනුවට වම් පාදය පෙර යොමු කොට පපු පෙදෙස ඉදිරියට යොමු කොට ගරු ගාම්භිර ලීලාවෙන් ඉදිරියට ඇදෙන ඉරියව්වේන් ස්ථාපනය කර ඇත. දකුණු අත මත උරේහි පැළඳ සිටින සාටකයේ කෙරවලක් අල්ලා සිටීම මඟින් තමා විසින් ගොඩනගා ගත් සිංහල බෞද්ධ ජන පදනමේ බලය සංකේත වේ. මූර්ති නිරූපණයේ දී බණ්ඩාරනායකයන්ගේ පරිණත දේශපාලන අවදිය තෝරාගෙන ඇත. මුහුණේ බැල්ම යොමු වී ඇත්තේ ඉදිරිපසින්

ඇති ඉන්දියන් සාගරයටය. එය ඔවුන් තුළින් ජාත්‍යන්තර සබඳතාවන් ගොඩනැගීමට කරන්නාවූ ආමන්ත්‍රණ කිරීමක් ලෙස හඳුනාගත හැක.



බණ්ඩාරනායක මූර්තිය 1967 දී ගාලු මුවදොර ඉදිරිපිට අවකාශය දිස්වන ආකාරය.



බණ්ඩාරනායක මූර්තිය 2020 දී ගාලු මුවදොර ඉදිරිපිට ෂැංග්‍රිලා හොටල් සංකීර්ණ අවකාශයට දිස්වන ආකාරය.

අප අද දකින පරිදි, මූර්ති මඟින් නව අවකාශයක් සමග සම්බන්ධ වීමට අපට ඉඩ සලසන අතර ද්‍රව්‍ය හා අවකාශය අතර ඇති මූලික සම්බන්ධතා නිරාවරණය කිරීමෙන් නව අත්විඳීමේ මාර්ගයක් විවෘත වේ. 1960 දී මූර්ති අත්පත් කරගත් අවකාශය ස්වරූපය ඇත්ත වශයෙන් ම මූර්ති සහ ස්ථානය පිළිබඳ සංකල්පයකට සම්බන්ධ වේ. නමුත් අද වනවිට එම අවකාශ ස්වරූපය සම්පූර්ණයෙන් වෙනස් වෙමින් පවති. මූර්තියේ පිටුපස චීන සමාගමකට සින්නක්කරව භූමි විකුණන ලද ෂැංග්‍රිලා හෝටලය සහ මූර්තියේ ඉදිපස චීන සමාගමක් විසින් ගාලු මුවදෝර මුහුද ගොඩකර ඉදිකරන ජාත්‍යන්තර මූල්‍ය නගරය යන නව ඉදිකිරීම් විසින් ගොඩනගන අවකාශය බන්ඩාරණායකගේ ආලේඛ්‍ය මූර්ති සම්බන්ධ නව අර්ථකතනයක් ගොඩනගනයි. එනම් පෙර බිම හා පසුබිම යන ස්ථානවල මැදි වූ බණ්ඩාරනායක ආලේඛ්‍ය මූර්ති චීන කොමියුනිස්ට් නව යටත්විජතවාදී දේශපාලනික බලය පිළිබඳ නව අර්ථකතනයකට ඉඟියක් ලබාදේ.

**නිගමනය**

ප්‍රධාන වශයෙන් මූර්තියෙහි අවකාශ භාවිතාවේ දී එහි විශාල බණ්ඩනයක් ඇති වූයේ පශ්චාත් යටත් විජිතයෙන් පසුව එනම්, ආගමික සංකල්පය මත බිහි වූ ගොඩනැගිලි අවකාශයේ එළියට විසිවෙන දේශපාලන ආලේඛ්‍ය මූර්ති යටත්විජිතවාදී පසුව එය මහජන අවකාශය සමඟ සම්බන්ධ වීමයි. එහිදී සිදුවූ අධිරාජ්වාදීන් තම ලාංකේය යටත් වැසියා සහ රාජ්‍යත්වය මෙන්ම බෞද්ධ ආගම යටපත් කොට නව යටත්විජිත ශ්‍රී ලංකාවක් බිහි කිරීමට උත්සාහය ප්‍රතිඵලයක් වශයෙනි. අධිරාජවාදීන් තම බලය සහ ආධිපත්‍යය අනන්‍යතාවය පෙන්වීම සඳහා ලංකා භූමිය තුළ ස්මාරක රැසක් නිර්මාණය කර තිබේ.

මූර්ති ස්ථානගත කිරීමේ දී අවකාශය කොතෙක් දුරට මහජන සහභාගිත්වය මෙන්ම ජනතාවගේ චිත්තවේග සමඟ බැඳීමක් ඇතිවන ආකාරයට ස්ථානගත කළේදැයි යන්න දේශපාලන කාරණාවක් වේ. මෙම කාරණාව මනාව වඩාත් ප්‍රකට කරන මූර්තිය ලෙස බණ්ඩාරනායකගේ ප්‍රතිමාව හඳුනාගත හැකිය. බණ්ඩාරනායක ප්‍රතිමාව ස්ථානගත කර ඇත්තේ වඩාත් දේශපාලන වටිනාකමක් සහිත භූමියක් වන ගෝල්ෆේස් පිට්ටනිය ඉදිරිපිට, ඔහුට අභිමුඛ වන බටහිර වෙරළත්, මුහුදත් යන අවකාශයක් මූර්තියේ දේශපාලන කාරණාව තීව්‍ර කිරීමට වැදගත් වේ.

ස්මාරකවල අන්තර්ගත දැනුම අනිවාර්යයෙන් ම පක්ෂග්‍රාහී ය. සෑම ආඛ්‍යානයක් ම සමහර සිදුවීම් තෝරාගන්නා අතර අනෙක් ඒවා මගහැරේ. ස්මාරක අනිවාර්යයෙන් ම සමහර ඉතිහාසයන් කෙරෙහි අවධානය යොමු කරන අතර ම අනෙක් ඒවා මකා දමයි. 1960 දී ඉදිවන බණ්ඩාරනායක ස්මාරක මූර්තිය ඔහුගේ ප්‍රධාන දේශපාලන චින්තනය වූ සිංහල ජාතිකත්වය ගොඩනගයි. එයින් මකා දමන්නට උත්සාහ කරන දේශපාලන කාරණා වන්නෙ, අනෙකුත් ජාතීන්ගේ දේශපාලන අයිතීන් සහ නිදහසයි. සෑම "මතක තබා ගැනීමකටම අමතක වීමක් ඇතුළත් වේ". ස්මාරක නියෝජනය කරන්නේ නිශ්චිත සිදුවීම් සහ පුද්ගලයින් පමණි. මතක තබා ගත යුතු දේ සහ අතීතය අමතක කළ යුතු දේ පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීම සඳහා ඔවුන්ට නිශ්චිත ජාතික දේශපාලන මතකයන් ප්‍රකාශකරන උපක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අයිවන්, වික්ටර්. (2008), කඳුළු සලන පාරාදීසය, මහරගම, රාවය ප්‍රකාශනය.

ජයවර්ධන, කුමාරි. (2008), සොක්කන් ලොක්කන් වූ වගයි, කොළඹ 05,සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

පෙරේරා, රංජිත්. (2009), දෘශ්‍ය කලා අධ්‍යායන, කොළඹ 05, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

රණබාහු, ප්‍රසන්න. (2011),තීර්කලා ඉතිහාසය ලිපි එකතුව, පිටකෝඹ්ෂෙ; තීර්ත ප්‍රකාශනය.

විරසිංහ, ජගත්. (2005), Art Lab, රජගිරිය, කලාව සහ උරුමය පිළිබඳ ප්‍රකාශනය.

සිල්වා, සමුද්‍රිකා. (2005), පයිත තෙවන වෙළුම, අපහසු දෙබසඃ සිංහල කතිකාව වික්ටෝරියානු පිරිමිකම සහ පුරුෂත්වය පිළිබඳ දේශය කේත. කොළඹ, සමාජ සංස්කෘතික තීව අධ්‍යයනය සදහා වන කොළඹ ආයතනය.

ලේකම්ආරච්චි, චන්ද්‍ර. (2005), පයිත හතරවන වෙළුම, නාගරික අවකාශය අර්ත විවරනය කිරිමඃ සාමාජීය විද්‍යා ප්‍රවේශ කිහිපයක් පිළිබඳ සමාලෝචනීය පාඨනයක්. කොළඹ, සමාජ සංස්කෘතික තීව අධ්‍යයනය සදහා වන කොළඹ ආයතනය.

ජේරික්, ක්‍රිෂාන්ත. (2005), පයිත තෙවන වෙළුම, කැප්පෙටිපොලගේ හිස් කබලේ පුනරාගමනයඃ ශ්‍රී ලාංකේය ජාතිකවාදයේ අව්‍යාජත්වය ගොඩනැගීම. කොළඹ, සමාජ සංස්කෘතික තීව අධ්‍යයනය සදහා වන කොළඹ ආයතනය.

ලේකම්ආරච්චි, චන්ද්‍ර. (2005), පයිත හතරවන වෙළුම, නාගරික අවකාශය අර්ත විවරනය කිරිමඃ සාමාජීය විද්‍යා ප්‍රවේශ කිහිපයක් පිළිබඳ සමාලෝචනීය පාඨනයක්. කොළඹ, සමාජ සංස්කෘතික තීව අධ්‍යයනය සදහා වන කොළඹ ආයතනය.

**website**

Federico Bellentani and Mario Panico, *2016,* The meanings of monuments and memorials: toward a semiotic approach, https://orcamwe.cf.ac.uk/96405/1/Bellentani_Panico_The%20meanings%20of%20monuments.pdf

**උරුම අධ්‍යයන කේන්ද්‍රය**
කැලණිය විශ්වවිද්‍යාලය

ISSN 2827-7430